# 8

# මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය සහ පද්ධති ස්ථායිතාව

## 8.1 සමස්ත නිරීක්ෂණ

මූල්‍ය අංශය, ගෝලීය සහ දේශීය වෙළෙඳපොළ අභියෝග තත්ත්වයන් හමුවේ වුව ද, එහි ස්ථායීතාව පවත්වා ගනිමින් ප්‍රසාරණය වූ අතර, ආර්ථිකයෙහි වර්ධන ක්‍රියාවලියට අඛණ්ඩව දායක විය. මෙම ප්‍රසාරණය මධ්‍යයෙහි ලද ඉහළ ප්‍රාග්ධන මට්ටම්, ප්‍රමාණවත් ද්‍රවශීලතා අවරෝධක සහ හිතකර ඉපැයීම් සමඟ මූල්‍ය අංශයේ අවදානම් අවශෝෂණය කරගැනීමේ ශක්‍යතාව වැඩි දියුණු වුණි. තවද, නියාමන සහ අධීක්ෂණ රාමුව ශක්තිමත් කරනු ලැබීම සහ ඒකාබද්ධ අයුරින් අවදානම් කළමනාකරණය සඳහා බැංකුවලට උපදෙස් දීම මෙන්ම මූල්‍ය සුරක්ෂිතතා ජාලයක් ඇති කිරීමත් සමඟ ඇති වූ මූල්‍ය අංශයෙහි විශ්වාසය ගොඩනැගීම ද, මූල්‍ය පද්ධතියෙහි ශක්තිමත්භාවයේ ප්‍රවර්ධනයට දායක විය. වසරේ මුල් කාලයේ දී බැංකු මත පනවනු ලැබූ ණය සීමාව, බැංකු අංශයේ ණය ප්‍රසාරණය මන්දගාමී වීමට ඉවහල් විය. දැඩි මූල්‍ය තත්ත්වයක් වෙළෙඳපොළ තුළ ක්‍රියාත්මක වීම නිසා බැංකු අංශයේ ශුද්ධ පොලී ආන්තික සුළු වශයෙන් අඩු වුණි. එසේ වුව ද, වසර තුළ දී පොලී ආදායම සහ පොලී නොවන ආදායම යන දෙවර්ගයේම වැඩිවීමත් සමඟ බැංකු අංශයේ ලාභදායිත්වය පෙර වසරේ වාර්තා කළ ප්‍රමාණය ඉක්මවා වැඩි වූයේය. තව ද, විදේශීයන්ගෙන් ණය ගැනීම මගින් බැංකු අංශය ඒවායේ අරමුදල් රැස් කිරීමේ මූලාශ්‍ර විවිධාංගීකරණය කරනු ලැබූ අතර, එය බැංකුවල ශේෂ පත්‍ර තවදුරටත් ශක්තිමත් කිරීමට හේතු වනු ඇත. බැංකු, මූල්‍ය සමාගම්, කල්බදු මූල්‍යකරණ සමාගම් සහ රක්ෂණ සමාගම් යනාදියේ ශාඛා ජාලය මූල්‍ය පහසුකම් සැපයුම සඳහාවන ඉඩ ප්‍රස්ථා වැඩි කරමින්, වසර තුළ දී තවදුරටත් ප්‍රසාරණය විය. කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා මූල්‍ය පහසුකම් සැපයීමට වඩාත් ඉහළ ඉඩ ප්‍රස්ථාවන් ඇති කිරීම පිණිස, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායක ශාඛා බැංකු විසින් විවෘත කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබීය. ඉදිරියේ දී ක්‍රියාත්මක වීමට නියමිත, ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සඳහා වන නෛතික සහ මෙහෙයුම් රාමුව ක්ෂුද්‍ර ව්‍යවසායක ආයතන සඳහා මූල්‍ය පහසුකම් ලබා ගැනීමට ඇති ඉඩකඩ ප්‍රසාරණය කිරීමට දායක වනු ඇත. මේ අතර, ඉහළ දළ වාරික, හිතකර ලාභදායිත්වය සහ ඉහළ නුබුන්වත් ආන්තික මගින් පිළිබිඹු කෙරෙන රක්ෂණ අංශයේ කාර්ය සාධනය වැඩි දියුණු වූ අතර, රක්ෂණ සමාගම්වලට අදාළව ශක්තිමත් වෙමින් පවතින නියාමන රාමුව මූල්‍ය පද්ධතියෙහි ශක්තිමත් බව ප්‍රවර්ධනය කිරීමෙහිලා උපකාරී වනු ඇත.

2012 වසරේ මුල් කාලයේ දී, මූල්‍ය වෙළෙඳපොළවල් විචලතාවකින් යුතු වුව ද, ගනු ලැබූ ප්‍රතිපත්ති පියවර නිසා වසරේ අවසාන භාගයේ දී ඒවායේ ස්ථායිතාව යළි නගා සිටුවීමට හැකි වුණි. ඉහළ යන ඉල්ලුම් ප්‍රසාරණය වළක්වාලීමට ගනු ලැබූ දැඩි මූල්‍ය ප්‍රතිපත්තිය සහ පැවතියා වූ ද්‍රවශීලතා සංරෝධක නිසා වසරේ වැඩි කාලයක් තුළ තැන්පතු අනුපාතික සහ ණය අනුපාතික මත ඉහළ පීඩනයක් පැවතියේය. කෙසේ වෙතත්, බඳු ගැලපූ පසු බර තබන ලද සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතය වසරේ පළමු භාගයේ දී විචලතාවක් පෙන්නුම් කරනු ලැබූව ද, ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව ඇතුළත පැවතියේය. වසරේ මුල් කාලය තුළ විනිමය අනුපාතිකය රුපියලට එරෙහිව විචලතාවක් පෙන්නුම් කරනු ලැබූව ද, ආනයන වර්ධනය අඩු කිරීමට ගනු ලැබූ ප්‍රතිපත්ති සහ විදේශ විනිමය ගලාඒම්, දේශීය විදේශීය වෙළෙඳපොළේ ස්ථායිතාව ඇති කිරීම සඳහා දායක වී ඇති අතර, ජාත්‍යන්තර සංචිතවල මට්ටම ඉහළ නැංවීමට ද දායක වී ඇත.

කොටස් වෙළෙඳපොළ තුළ විදේශීය ආයෝජකයින්ගේ මිලදී ගැනීම් අඛණ්ඩව පැවතිය ද, වසරේ බොහෝ කාලයක් තුළ එහි පහළ යන උපනතියක් අඛණ්ඩව පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, වසරේ අවසාන කාර්තුව තුළ දී කොටස් වෙළෙඳපොළ සීමිත ලෙස යථා තත්ත්වයට පත්වනු දක්නට ලැබිණ.

**මූල්‍ය අංශය පාලනය කරන, අධීක්ෂණ සහ නියාමන රාමුව ශක්තිමත් කිරීම අඛණ්ඩව සිදු කෙරුණු හෙයින් ඵලදායී ලෙස මූල්‍ය අතරමැදිකරණය පවත්වාගෙන යාම සඳහා ශක්තිමත් සහ සංවර්ධනීය පරිසරයක් ගොඩනැගීමට හැකි විය.** ජාත්‍යන්තර ප්‍රමිතිකරණවලට අනුකූලව යමින් බැංකුවල අවදානම් කළමනාකරණ සහ ප්‍රාග්ධන සැලසුම් ක්‍රියාවලීන් තවදුරටත් ශක්තිමත් කිරීම පිණිස මහ බැංකුව බාසල් II (Basel II) දෙවන මට්ටම යටතේ අධීක්ෂණ විමසුම් ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු විමසීමේ පත්‍රිකාවක් නිකුත් කරනු ලැබීය. ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව සැකසුණු නව ගිණුම්කරණ ප්‍රමිතීන් හඳුන්වා දීමත් සමඟ මූල්‍ය ආයතනවල මූල්‍ය වාර්තාකරණය වැඩි දියුණු වනු ඇත. මුදල් සමාගම් සහ කල්බදු මූල්‍යකරණ සමාගම්වල සිදු කරන විගණන කාර්යයන් අවශ්‍ය ප්‍රමිතීන්වලට අනුව සිදු කරනු ලැබීම සහතික කිරීම පිණිස එම සමාගම් සඳහා බාහිර විගණන නිළධාරීන්ගෙන් යුත් මඩුල්ලක් පත් කරනු ලැබීය. කල්බදු මූල්‍යකරණ සමාගම්වල අධ්‍යක්ෂකවරුන්ගේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සුදුසු බව සහ යෝග්‍යතාවට අදාළ සාංගමික යහපාලනය හා සම්බන්ධ විධිවිධාන ශක්තිමත් කිරීමට එම සමාගම්වලට විධානයන් නිකුත් කරනු ලැබීය. ගෙවීම් සහ පියවීම් පද්ධතිය ඉහළ උපයෝජ්‍යතාවක් සහ සුරක්ෂිතතාවක් සහිතව ක්‍රියාත්මක විය. කුඩා වටිනාකමින් යුතු ගෙවීම් හුවමාරුව වඩාත් සුක්ෂිත කිරීමට සහ පිරිවැය කාර්යක්ෂම කිරීමට ජංගම දුරකථන මාර්ගයෙන් විද්‍යුත් මුදල් භාවිතා කිරීම සඳහා ඊ-ගෙවීම (e-payments) පද්ධති ප්‍රවර්ධනයට මහ බැංකුව අඛණ්ඩ ප්‍රයත්නයක නියැලුණේය. පාරිභෝගික ආරක්ෂාව සහතික කිරීමසඳහා හදිසි තත්ත්වයකදී මූල්‍ය අංශයේ ප්‍රධාන ආයතන ක්‍රියාකළ යුතු ආකාරය සම්බන්ධ සැලසුම් වැඩි දියුණු කිරීම සඳහා ද, පියවර රාශියක් ගනු ලැබීය.

**ප්‍රමාණවත් ප්‍රාග්ධනය, හිතකර ඉපැයීම් සහ ඵලදායී නියාමන සහ අවදානම් කළමනාකරණ රාමුවක් යටතේ තහවුරු කෙරෙන මූල්‍ය අංශයේ ස්ථායීතාවය අඛණ්ඩව පැවතීමට අපේක්ෂිතය.** ආර්ථිකය ඉහළ වර්ධන මාවතකට යොමු වීමට හැකිවන පරිදි මූල්‍ය අංශයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව වැඩි දියුණු කිරීම උදෙසා තවදුරටත් ප්‍රයත්න ගනු ලබනු ඇත. ලබා දී ඇති බදු සහන හේතු කොටගෙන සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ විශේෂිත වූ ප්‍රාග්ධන වෙළෙඳපොළේ ඉක්මන් දියුණුවකට මග පෑදීම අපේක්ෂිතය. වඩා පහසුවෙන් විදේශ ණය ලබා ගැනීමට සමාගම්වලට අවසර ලබාදීම සඳහා වන විනිමය පාලන රෙගුලාසි තව දුරටත් ලිහිල් කිරීමට අදාළව නිවේදනය කරනු ලැබූ ප්‍රතිපත්ති පියවර, දේශීය මූල්‍ය පද්ධතියේ ගණුදෙනු පුළුල් කරනු ලබන අතර, එය ගෝලීය මූල්‍ය පද්ධතිය සමඟ පවතින ඒකාබද්ධතාව ද ප්‍රවර්ධනය කරනු ඇත. කෙසේ වෙතත්, ගෝලීය සංවර්ධනය සහ ඒ තුළින් ඇති වන වෙළෙඳපොළ අභිප්‍රාය සහ ප්‍රාග්ධන ගලාඒම් හේතුවෙන් පැන නගින අවදානම් පිළිබඳ අවධානයෙන් සිටීම අවශ්‍ය කරනු ඇත. ජාත්‍යන්තර ප්‍රමිතීන් සමඟ වඩා ඉහළ ඒකාබද්ධතාවක් ඇති කිරීම

**8.1 සංඛ්‍යා සටහන** **ප්‍රධාන මූල්‍ය ආයතනවල මුළු වත්කම්**

| | 2011 (අ) | | 2012 (ආ) | |
|---|---|---|---|---|
| | රුපියල් බිලියන | සමස්තයේ ප්‍රතිශතයක් ලෙස | රුපියල් බිලියන | සමස්තයේ ප්‍රතිශතයක් ලෙස |
| **බැංකු අංශය** | **5,375.6** | **69.7** | **6,381.4** | **70.6** |
| මහ බැංකුව | 1,123.4 | 14.6 | 1,279.7 | 14.2 |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | 3,578.5 | 46.4 | 4,359.2 | 48.2 |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | 673.7 | 8.7 | 742.5 | 8.2 |
| **තැන්පතු බාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන** | **427.1** | **5.5** | **621.2** | **6.9** |
| බලපත්‍රලාභී මුදල් සමාගම් | 352.1 | 4.6 | 536.1 | 5.9 |
| සමූපකාර ග්‍රාමීය බැංකු | 67.6 | 0.9 | 77.2 | 0.9 |
| සකසුරුවම් හා ණය දෙන සමූපකාර සමිති | 7.4 | 0.1 | 7.9 | 0.1 |
| **විශේෂිත මූල්‍ය ආයතන** | **338.8** | **4.4** | **282.8** | **3.1** |
| විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් | 137.8 | 1.8 | 60.5 | 0.7 |
| ප්‍රාථමික අලෙවිකරුවන් | 132.7 | 1.7 | 132.7 | 1.5 |
| කොටස් තැරැව්කාර සමාගම් | 11.3 | 0.1 | 10.8 | 0.1 |
| ඒකක භාර / ඒකක භාර කළමනාකරණ සමාගම් | 23.7 | 0.3 | 32.4 | 0.4 |
| වෙළෙඳපොළ අතරමැදියන් (ඇ) | 31.2 | 0.4 | 43.9 | 0.5 |
| ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම් | 2.1 | 0.0 | 2.5 | 0.0 |
| **ගිවිසුම්ගත ඉතිරි කිරීම් ආයතන** | **1,570.8** | **20.4** | **1,750.2** | **19.4** |
| රක්ෂණ සමාගම් | 265.4 | 3.4 | 304.6 | 3.4 |
| සේවක අර්ථසාධක අරමුදල | 1,018.0 | 13.2 | 1,144.0 | 12.7 |
| සේවක භාරකාර අරමුදල | 142.4 | 1.8 | 158.4 | 1.8 |
| අනුමත පෞද්ගලික අර්ථසාධක අරමුදල් | 115.1 | 1.5 | 110.3 | 1.2 |
| රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල | 29.9 | 0.4 | 32.9 | 0.4 |
| **එකතුව** | **7,712.3** | **100.0** | **9,035.6** | **100.0** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) වෙළෙඳපොළ අතරමැදියන් යටතේ ප්‍රාරක්ෂකයින්, ආන්තික සැපයුම්කරුවන් සහ ආයෝජන කළමනාකරුවන් ඇතුළත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**8.2 සංඛ්‍යා සටහන** **බැංකු සහ බැංකු ශාඛා ව්‍යාප්තිය**

| වර්ගීකරණය | 2011 අවසානය (අ) | 2012 අවසානය (ආ) |
|---|---|---|
| බලපත්‍රලාභී වාණිජ බැංකු | | |
| i. මුළු බලපත්‍රලාභී වාණිජ බැංකු සංඛ්‍යාව | **24** | **24** |
| දේශීය බැංකු | 12 | 12 |
| විදේශීය බැංකු | 12 | 12 |
| ii. මුළු බලපත්‍රලාභී වාණිජ බැංකු ශාඛා සහ අනෙකුත් සේවා සපයන මධ්‍යස්ථාන සංඛ්‍යාව | **5,397** | **5,574** |
| ශාඛා | **1,616** | **1,676** |
| දේශීය බැංකු ශාඛා | 1,567 | 1,627 |
| විදේශීය බැංකු ශාඛා | 49 | 49 |
| ව්‍යාප්ති කාර්යාල | **989** | **1,041** |
| දේශීය බැංකු | 818 | 870 |
| විදේශීය බැංකු | 171 | 171 |
| ශිෂ්‍ය ඉතුරුම් ඒකක සහ අනෙකුත් සේවා සපයන මධ්‍යස්ථාන | **2,792** | **2,857** |
| ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර | **2,079** | **2,232** |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | | |
| i. මුළු බලපත්‍රලාභී විශේෂිත බැංකු සංඛ්‍යාව | **9** | **9** |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකු | 1 | 1 |
| ජාතික මට්ටමේ ඉතිරිකිරීමේ බැංකු | 2 | 2 |
| දිගුකාලීන ණය දෙන ආයතන | 2 | 2 |
| නිවාස ණය ආයතන | 2 | 2 |
| පෞද්ගලික ඉතිරිකිරීම් සහ සංවර්ධන බැංකු | 2 | 2 |
| ii. මුළු බලපත්‍රලාභී විශේෂිත බැංකු ශාඛා සහ අනෙකුත් සේවා සපයන මධ්‍යස්ථාන සංඛ්‍යාව | **787** | **800** |
| ශාඛා | **515** | **527** |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකු | 235 | 240 |
| ජාතික මට්ටමේ ඉතිරිකිරීමේ බැංකු | 179 | 185 |
| දිගුකාලීන ණය දෙන ආයතන | 25 | 25 |
| නිවාස ණය ආයතන | 30 | 31 |
| පෞද්ගලික ඉතිරිකිරීම් සහ සංවර්ධන බැංකු | 46 | 46 |
| ව්‍යාප්ති කාර්යාල | **84** | **85** |
| ශිෂ්‍ය ඉතුරුම් ඒකක සහ අනෙකුත් සේවා සපයන මධ්‍යස්ථාන | **188** | **188** |
| ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර | **158** | **158** |
| මුළු බැංකු ශාඛා සහ අනෙකුත් සේවා සපයන මධ්‍යස්ථාන සංඛ්‍යාව | **6,184** | **6,374** |
| මුළු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව | **2,237** | **2,390** |
| විද්‍යුත් අරමුදල් සම්ප්‍රේෂණ සේවා අ පහසුකම් සපයන මුළු අලෙවි මධ්‍යස්ථාන සංඛ්‍යාව | **27,073** | **27,689** |
| බැංකු ඝනත්වය : ජනගහනයෙන් පුද්ගලයින් 100,000 ක් සඳහා බැංකු ශාඛා ගණන | 10.2 | 10.8 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රවර්ධනය කිරීම, ප්‍රමාණාත්මක සහ ගුණාත්මක වශයෙන් ප්‍රාග්ධනය ඉහළ නැංවීම සහ පවත්වා ගතයුතු ද්‍රවශීලතා වත්කම්වල මට්ටම ඉහළ නැංවීම මගින් බැංකු අංශයේ අවදානම්වලට ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා බාසල් III (Basel III) ප්‍රමිතීන් පියවර වශයෙන් ක්‍රියාත්මක කිරීමට මහ බැංකුව වැඩ කටයුතු කරනු ඇත. එක් එක් ආයතනවල වෙන්ව සිදු කෙරෙන අධීක්ෂණයන් වැඩි දියුණු කිරීමට සාර්ව විචක්ෂණශීලී ප්‍රවේශයන්ගෙන් යුත් නියාමන ක්‍රම තව දුරටත් ශක්තිමත් කිරීම, මූල්‍ය පද්ධති ස්ථායීතාවට ඇති විය හැකි පද්ධතිමය සහ ව්‍යාප්තිමය අවදානම් කල්තියා හඳුනා ගැනීම සහ සාර්ව ආර්ථික කම්පනයන් මූල්‍ය පද්ධතියට අවශෝෂණය කර ගැනීමට ඇති හැකියාව ඉහළ නැංවීම යනාදිය සිදු කිරීම සඳහා මහ බැංකුව අඛණ්ඩව කටයුතු කරනු ඇත.

## 8.2 මූල්‍ය ආයතනවල ක්‍රියාකාරීත්වය

### බැංකු අංශය

**බැංකු අංශයේ වත්කම්වල වර්ධනයත් සමඟ බැංකු අංශය ස්ථායී මට්ටමක පැවතුණු අතර, 2011 වසරේ පැවති විශාල වර්ධනයට සාපේක්ෂව 2012 වසරේ දී මධ්‍යස්ථ ණය වර්ධනයක් දැක ගත හැකි විය.** මූල්‍ය අංශය තුළ තම ප්‍රමුඛස්ථානය තවදුරටත් පවත්වා ගනිමින්, 2011 වසරේ දී මූල්‍ය අංශයේ සමස්ත වත්කම්වලින් සියයට 55.1 ක ප්‍රමාණයකට දායකත්වය දැක් වූ බැංකු අංශය, 2012 වසර අවසන් වන විට එය සියයට 56.4 ක් දක්වා වර්ධනය කර ගැනීමට සමත්ව තිබේ. මධ්‍යස්ථ මට්ටමක පවත්වා ගෙන යනු ලැබූ ණය ප්‍රසාරණය, විචක්ෂණශීලී ණය විවිධාංගීකරණය, හිතකර මට්ටම්වලින් පවත්වා ගෙන යනු ලැබූ ලාභදායීත්වය, ද්‍රවශීලතාවය, ප්‍රාග්ධනය සහ කළමනාකරණය කර ගත හැකි මට්ටමක පවත්වා ගෙන යනු ලැබූ සියලු අවදානම් (ණය, වෙළෙඳපොළ, ද්‍රවශීලතා සහ මෙහෙයුම් අවදානම්) යනාදිය තුළින් පිළිබිඹුවන්නේ නිසි නියාමන ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ සහ දියුණු අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමෙන් ලද සාර්ථකත්වයයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, බැංකු අංශයේ ස්ථායීතාව තවදුරටත් සවි ගැන්විණි.

### ව්‍යාපාර වර්ධනය

**ව්‍යාප්තිය:** බැංකු අංශය නව නිපැයුම් සහ සේවාවන් තවදුරටත් පුළුල් කිරීම මගින් මෙන්ම සිදුකළ ව්‍යාප්තිය තුළින් එහි මූල්‍ය අතරමැදිකරණ කාර්ය භාරය අඛණ්ඩව පවත්වාගෙන ගියේය. 2012 වසර අවසන් වන විට දේශීය බැංකු 21 කින් (බලපත්‍රලාභී විශේෂිත බැංකු 09 ක් ද ඇතුළත්ව) සහ විදේශීය බැංකු ශාඛා 12 කින් සමන්විත බැංකු අංශය තුළ බැංකු 33 ක් ක්‍රියාත්මක වූ අතර, බැංකු ජාලයේ පුළුල් කිරීම් සහ හඳුන්වා දෙනු ලැබූ විවිධ බැංකු කටයුතු තුළින් නව පාරිභෝගිකයින් ආකර්ශණය කර ගැනීම ද දක්නට ලැබුණි. 2012 වසර තුළ දී බැංකු ශාඛා 190 ක්

සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 153 ක් බැංකු ජාලයට එකතු වීමත් සමග බැංකු අංශය ප්‍රසාරණය වුණි. මේ අතුරින් ශාඛා 168 ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 86 ක් බස්නාහිර පළාතෙන් පිටත ස්ථාපිත කරනු ලැබීය. ඒ අනුව, සමස්තයක් ලෙස, 2012 වසර අවසානයේ දී බැංකු අංශය සතුව ශාඛා 6,374 ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 2,390 ක් පැවතියේය.

### වත්කම් සහ වගකීම්

**වත්කම්:** 2012 වසරේ දී, බැංකු අංශයේ වත්කම්වල වැඩි වීම සියයට 20 ක මට්ටමේ නොවෙනස්ව පැවතුණි. ණය වර්ධනය මත පැනවූ සීමා හේතුවෙන් වසර තුළ දී ණය සහ අත්තිකාරම් වර්ධනය සියයට 21 ක් පමණක් වූ අතර, ආයෝජන සහ කෙටිකාලීන ස්ථාපනයන් (අනෙකුත් වත්කම් තුළ අන්තර්ගත වූ) 2011 වසරේ දී පැවැති මන්දගාමී වර්ධනයේ සිට යථා තත්ත්වයට පත් විය. මන්දගාමී වර්ධන තත්ත්වයක් යටතේ වුව ද, ණය සහ අත්තිකාරම්, 2012 වසර අවසානයේ දී මුළු වත්කම්වලින් සියයට 61.2 ක සිට සියයට 61.6 ක් දක්වා ඉතා සුළු ප්‍රමාණයකින් වර්ධනය වූ අතර, ආයෝජනවල දායකත්වය සියයට 24.9 ක සිට සියයට 23.5 ක් දක්වා පහත වැටුණි.

2012 වර්ෂයේ දී ණය වර්ධනය, ආර්ථිකයෙහි ප්‍රධාන අංශ 4 ක් වන වෙළෙඳ (සියයට 19), කෘෂිකාර්මික (සියයට 14), යටිතල පහසුකම් (සියයට 14) සහ ඉදිකිරීම් (සියයට 12) යන අංශයන් වෙත සංකේන්ද්‍රණය විය. නිෂ්පාදන සහ පරිභෝජන අංශවලට ණය දීම වර්ධනය වී ඇත්තේ පිළිවෙළින් රුපියල් බිලියන 33 කින් හා රුපියල් බිලියන 82 කින් වන අතර, 2011 වසරේ දී එම වර්ධනය පිළිවෙළින් රුපියල් බිලියන 55 ක් හා 139 ක් විය.

**8.3 සංඛ්‍යා සටහන** බැංකු අංශයෙහි වත්කම් සහ වගකීම් සංයුතිය

| අයිතමය | 2011 (අ) | | 2012 (ආ) | | වෙනස (%) | |
|---|---|---|---|---|---|---|
| | රුපියල් බිලියන | සමස්තයේ ප්‍රතිශතයක් ලෙස | රුපියල් බිලියන | සමස්තයේ ප්‍රතිශතයක් ලෙස | 2011 | 2012 |
| **වත්කම්** | | | | | | |
| ණය දීම් | 2,602 | 61.2 | 3,143 | 61.6 | 31.7 | 20.8 |
| ආයෝජන | 1,057 | 24.9 | 1,197 | 23.5 | (2.2) | 13.2 |
| වෙනත් | 593 | 13.9 | 762 | 14.9 | 20.2 | 28.2 |
| **වගකීම්** | | | | | | |
| තැන්පතු | 3,073 | 72.3 | 3,598 | 70.5 | 18.8 | 17.1 |
| ණය ගැනුම් | 635 | 14.9 | 805 | 15.8 | 25.4 | 26.7 |
| ප්‍රාග්ධන අරමුදල් | 371 | 8.7 | 436 | 8.5 | 25.9 | 17.5 |
| වෙනත් | 173 | 4.1 | 263 | 5.1 | 6.4 | 51.4 |
| **මුළු වත්කම්/වගකීම්** | **4,252** | **100** | **5,102** | **100** | **19.8** | **20.0** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


**වගකීම්:** තැන්පතුවල මන්දගාමී වර්ධනය හේතුවෙන් 2011 වසරේ අවසානයට මුළු වගකීම්වලින් සියයට 72 ක් වූ තැන්පතු ප්‍රමාණය, 2012 අවසානය වන විට සියයට 71 ක් දක්වා ආන්තික ලෙස අඩු වුවද, බැංකු අංශයේ තැන්පතු අඛණ්ඩව ප්‍රධාන අරමුදල් ප්‍රභවය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ඇති වූ අරමුදල් පරතරය පියවීම සඳහා ලබා ගනු ලැබූ ණය, 2011 වසරේ දී වූ සියයට 25 සිට 2012 වසරේ දී සියයට 27 දක්වා වර්ධනය විය. ඒ අනුව, මූල්‍ය ප්‍රභවයන් තුළ ණය ලබාගැනීම්වල ප්‍රමාණ, 2011 දී වූ සියයට 15 ක සිට 2012 දී සියයට 16 ක් දක්වා ඉහළ ගියේය. ණය ලබා ගැනීම් වැඩිවීමට හේතු වූයේ, විදේශීය ප්‍රභවයන්ගෙන් ලබාගත් ව්‍යවහාර මුදල් ගැනීම්වල ඉහළ යෑම තුළින් විදේශීය ණය ගැනීම් ඉහළ යෑම තුළිණි (රුපියල් බිලියන 164 ක් හෝ සියයට 97 ක්).

**ශේෂ පත්‍ර නොවන අනාවරණයන්:** 2011 වසරේ දී සියයට 35 ක ඉහළ වාර්ෂික වර්ධනයක් පෙන්නුම් කළ ශේෂ පත්‍ර නොවන අනාවරණයන්, 2012 වසර අවසානයේ දී සියයට 7 ක් දක්වා අඩු වුණි. මෙයට ප්‍රධාන හේතුව වූයේ, ලේඛිත ණය වටිනාකම අඩුවීම සහ ප්‍රතිග්‍රහණ සහ විදේශ විනිමය සම්බන්ධිත අනාවරණයන්වල සිදු වූ අඩු වර්ධනයයි. කෙසේ වුවද, විදේශ විනිමය (ඉදිරි විකුණුම් සහ මිලදී ගැනීම්) සමස්ත ශේෂ පත්‍ර නොවන අනාවරණ වටිනාකමින් සියයට 43 ක අගයක් පෙන්නුම් කරමින්, තවදුරටත් ශේෂ පත්‍ර නොවන අනාවරණයන්හි ප්‍රධාන අයිතමය බවට පත් වී ඇත.

### අවදානම් කළමනාකරණය

**ණය අවදානම:** මධ්‍යස්ථ මට්ටමකින් වර්ධනය වූ ණය සහ අත්තිකාරම් සහ ආර්ථිකයෙහි ප්‍රධාන අංශ

**8.1 රූප සටහන** බැංකු අංශයේ ශේෂ පත්‍රයෙන් පිටත අයිතමයන්



**විශේෂ සටහන 10**

## මූල්‍ය ආයතන අතර ඇති අන්තර් සම්බන්ධතාවය සහ පද්ධතිමය අවදානම

### හැඳින්වීම

පද්ධතිමය අවදානම කළමනාකරණය කිරීමේ වැදගත්කම මෑතකාලීන මූල්‍ය අර්බුද තුළින් අවධාරණය කර ඇත. පද්ධතිමය අවදානම් මූල්‍ය පද්ධතියට බාධා ඇති කළ හැකි අතර, මූර්ත ආර්ථිකයට සැලකිය යුතු අහිතකර බලපෑමක් ඇති කරයි. මූල්‍ය ආයතන අතර ඇති අන්තර් සම්බන්ධතාවය පද්ධතිමය අවදානමක් ඇති කිරීම සඳහා තීරණාත්මක සාධකයක් වේ. මූල්‍ය ආයතන එකිනෙක අතර සම්බන්ධ විය හැකි ආකාරයන් බොහොමයක් ඇත. ඒවා නම්, පොදු කොටස්කරුවන් සහ පොදු අධ්‍යක්ෂවරුන් සිටීම, එක් මව් ආයතනයක/පරිපාලන සමාගමක පරිපාලිත හෝ ආශ්‍රිත සමාගමක් වීම සහ ආයතන එකිනෙක අතර සැලකිය යුතු ණය ප්‍රදානයන් කර තිබීම යනාදියයි. මෑතකාලීන මූල්‍ය අර්බුදයෙන් ද අවධානයට ලක් වූ පරිදි, යම් බලපෑමක් ආයතනයන් අතරේ ව්‍යාප්ත වීමේ හැකියාව ඕනෑම පද්ධතිමය ක්‍රියාකාරකමක පවතින අතර ප්‍රධාන වශයෙන් බැංකු වෙන් වෙන්ව අවධානයට ලක් කරනු ලබන සාම්ප්‍රදායික සුපරීක්ෂණ ක්‍රමවේදයන් තුළින් පද්ධතිමය අවදානම සහ යම් බලපෑමක් ආයතනයන් අතර ව්‍යාප්ත වීමේ හැකියාව නිසි ආකාරයෙන් ග්‍රහණය නොවන බව මූල්‍ය ක්ෂේත්‍රයේ අධීක්ෂකයන්/නියාමකයන් අවබෝධ කර ගෙන සිටියි. එසේ හෙයින්, මූල්‍ය ආයතන අතර ඇති අන්තර් සම්බන්ධතා නිසා මූල්‍ය පද්ධතියට ඇති වන අවදානම් සහගත බව තක්සේරු කිරීමට සහ යම් බලපෑමක් ආයතන අතර ව්‍යාප්ත වීමේ හැකියාව මගහැරීම සඳහා යාන්ත්‍රණයක් ඇති කිරීමට අධීක්ෂකයන්/නියාමකයන් මුල පුරා ඇත.

### මූල්‍ය අන්තර් සම්බන්ධතාව මගින් ඇති විය හැකි අවදානම්

මූල්‍ය ආයතන (බැංකු, මූල්‍ය සමාගම්, කල්බදු සමාගම්, ප්‍රාථමික අලෙවිකරුවන්, රක්ෂණ ආයතන, කොටස් තැරැව්කාර සමාගම්, ඒකක භාර ආදිය) අතර ඇති ඉහළ අන්තර් සම්බන්ධතාවය සමස්ත මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට ඇති අවදානම් වඩාත් තීව්‍ර කරයි. එලෙස දැඩි බලපෑමක් ඇති කළ හැකි අවදානම් පහත දැක්වේ.

**(අ) ව්‍යාප්ත වීමේ හැකියාව:**

ව්‍යාප්ත වීමේ අවදානම ඇති වන්නේ එක් ආයතනයක මූල්‍ය ගැටළු සමස්ත ආයතන සමූහයටම හානිකර අයුරින් බලපාන විටදීය. ආයතන සමූහය අතර ඇති මූල්‍ය නිරාවරණයන් වන ණය විස්තාරණය, ආයතන අතර ඇති ඇප වීම් සහ බැඳීම් ව්‍යාප්ත වීමේ අවදානම කෙරෙහි බලපායි. මූල්‍ය නිරාවරණයක් නොමැති වුවද, සම්බන්ධිත ආයතනවල අලාභ හෝ ලාභ අඩුවීම් පිළිබඳ පුවත්, මූල්‍ය ආයතන කෙරෙහි තැන්පත්කරුවන්ගේ ඇති විශ්වාසය අඩු කිරීමටත්, ඒ තුළින් ආයතනයේ ද්‍රවශීලතාවයට පීඩනයක් ඇති කිරීමටත් හැකියාව තිබේ.

**(ආ) විනිවිදභාවය අවම වීම:**

විනිවිදභාවය යනුවෙන් අදහස් වන්නේ, සමස්ත ආයතන සමූහය පිළිබඳ නිවැරදි, කාලීන සහ අදාළ තොරතුරු, උනන්දුවක් දක්වන සියලුම පාර්ශවකරුවන්ට ලබා දීමයි. සමස්ත ආයතන සමූහයේම නෛතික සහ පරිපාලන ව්‍යුහය, ආයතන සියල්ල සමස්තයක් ලෙස සළකා නියාමනයන් පැනවීම සඳහා නියාමකයන්ට වැදගත් වේ. සංකීර්ණ සමූහ ව්‍යුහයක් තුළින් වංක සහ වංචාකාරී පුද්ගලයන්ට, ඔවුන්ගේ ක්‍රියාකාරකම් නියාමකයන්ගෙන් සැඟවීමට පහසුකම් සලසයි. මූල්‍ය ආයතන විසින් තම සත්‍ය ක්‍රියාකාරකම් සහ සත්‍ය හිමිකාරත්වය හිතාමතා සැඟවීමට සංකීර්ණ වූ ව්‍යුහයක් තෝරා ගත හැකි අතර, ඒ තුළින් ඵලදායි නියාමන අධීක්ෂණයක් සිදු වීම මග හැරී යයි.

**(ඇ) නියාමන පරස්පරය:**

විවිධ මූල්‍ය ආයතනවලට විවිධ නියාමකයන් සිටිය හැකි අතර, එම ආයතන අතර නියාමන අවශ්‍යතා විවිධ විය හැක. "නියාමන පරස්පරය" ලෙස හඳුන්වන්නේ සමහරක් ක්‍රියාකාරකම් හෝ තත්ත්වයන් එකම සමූහයට අයත් ආයතන අතර විතැන් කරමින්, එක් නියාමකයෙකුට සාපේක්ෂව තවත් නියාමකයෙකුගේ දැඩි විචක්ෂණශීලී අධීක්ෂණයෙන් මග හැරීමට හෝ අධීක්ෂණයෙන් සම්පූර්ණයෙන්ම මග හැරීමට ක්‍රියාකිරීමයි (අධීක්ෂණයට යටත් නොවන ආයතනයකට ක්‍රියාකාරකම් සහ තත්ත්වයන් විතැන් කිරීම තුළින්).

**(ඈ) ආයතන සමූහය තුළ ගණුදෙනු සහ නිරාවරණයන්:**

ආයතන සමූහය තුළ සිදුවන ගණුදෙනු සහ නිරාවරණයන්, සමූහයට අයත් ආයතන අතර පවතින ඍජු හෝ වක්‍ර හිමිකම්පෑම්වල ස්වරූපයෙන් පැවතිය හැකිය. බැංකු, රක්ෂණ සහ සුරැකුම් ව්‍යාපාරවලට අදාළ සුපරීක්ෂකවරුන්ගේ ඒකාබද්ධ කමිටුව, අන්තර් සමූහ ගණුදෙනු හා නිරාවරණයන් විවිධාකාරයෙන් ජනිත වීමට හැකි බව පෙන්වා දී ඇත. නිදසුන් ලෙස, ප්‍රතිකොටස් හිමිකාරිත්වය මගින්, මධ්‍යගත කෙටිකාලීන ද්‍රවශීලතා කළමනාකරණය තුළින්, කළමනාකරණ සහ අනෙකුත් සේවා සැපයීම තුළින්, ඇප ලබාදීම් තුළින්, ආයතන සමූහය තුළ ණය සහ බැඳීම් තුළින්, අනෙකුත් සමූහ ආයතන අතර වත්කම් මිලදී ගැනීම් සහ විකුණුම් තුළින් සහ ප්‍රතිරක්ෂණය මගින් අවදානම් විතැන් කිරීම යනාදිය මගින් මෙය සිදු විය හැක. ඕනෑම ප්‍රමාණාත්මක අන්තර් සමූහ ගණුදෙනුවක් මගින් විසඳුම් ක්‍රියාවලියක් ප්‍රේරණය වීමක් හෝ සමූහයට අයත් සමාගම්වල බිඳ වැටීමක් ඇති

කළ හැකි අතර, එය මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට බලපෑම් ඇති කළ හැකිය.

**මූල්‍ය අන්තර් සම්බන්ධතාවය පිළිබඳව ගත හැකි ක්‍රියාමාර්ග**

කිසියම් සමූහයකට අයත් ආයතන අතර, අන්තර් සම්බන්ධතාවය ඉහළ යාමත් සමඟ එම ආයතන වඩාත් පුළුල් වූ නියාමන යාන්ත්‍රණයක් තුළින් නියාමනය හා අධීක්ෂණය කිරීමේ අවශ්‍යතාවය පැන නගී. මෙම අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා පහත දැක්වෙන නියාමන උපක්‍රම භාවිතා කළ හැකිය.

**(අ) තොරතුරු හුවමාරු කර ගැනීම සහ සහයෝගීතාවය වර්ධනය කිරීම:**

කිසියම් සමූහයක් තුළ පවතින විවිධ ආයතන, බහුවිධ නියාමකයන් විසින් අධීක්ෂණය කිරීමේදී එම ආයතනවල මූල්‍ය තත්ත්වය සහ අවදානම් කළමනාකරණ උපක්‍රමවල ප්‍රමාණවත් බව පිළිබඳව තොරතුරු හුවමාරු කර ගැනීමට නියාමකයන් අතර එකඟතාවයක් ඇති කර ගත යුතු වේ.

**(ආ) පිවිසුම් බාධක පද්ධතීන් (Firewalls) ඇති කිරීම:**

ව්‍යාප්ත වීමේ අවදානම ඇතුළුව අනෙකුත් අවදානම් අඩු කිරීම සඳහා පොදු හිමිකාරීත්වයක් යටතේ පවතින ආයතන අතර, පිවිසුම් බාධක පද්ධතීන් ඇති කළ හැකිය. මෙම පද්ධතීන් මගින් අනුමත කාර්යයන්, වෙනත් සමාගම්වල හිමිකාරීත්වය දැරීම සහ සම්බන්ධිත පාර්ශවවලට ණය දීම්/ආයෝජන ආදිය සඳහා විචක්ෂණ සීමාවන් පැනවීම සිදු කළ හැකිය.

**(ඇ) ඒකාබද්ධ අධීක්ෂණය:**

මෑතකාලයේ දී, ඒකල පදනම මත අධීක්ෂණය වෙනුවට ඒකාබද්ධ අධීක්ෂණය කෙරෙහි වැඩි ප්‍රමුඛතාවයක් ලබා දී තිබේ. ඒකාබද්ධ අධීක්ෂණය මගින් මූල්‍ය ආයතන අධීක්ෂණ කටයුතු සඳහා පුළුල් ප්‍රවේශයක් ලබා දෙන අතර, එමගින් කිසියම් අවදානමක් බැංකුවේ හෝ වෙනත් සම්බන්ධිත ආයතනවල හෝ පොත්වල වාර්තා වී ඇත්ද යන්න පිළිබඳව සැළකිලිමත් නොවී බැංකුවක් මුහුණ දෙන සියලු අවදානම් සැළකිල්ලට ගනිමින් බැංකුව අයත් ව්‍යාපාර සමූහයේම ශක්තිය විශ්ලේෂණය කරයි. (රොනල්ඩ් මැක්ඩොනල්ඩ් - 1998)

**(ඈ) අනිවාර්ය නියාමන වාර්තාකරණ මාර්ග පිහිටුවීම:**

අනිවාර්ය නියාමන වාර්තාකරණ රාමුවකින් නෛතික ව්‍යාපාර ඒකක මට්ටමෙහි විස්තර සහ ව්‍යාපාර ඒකකයන්හි මූල්‍ය තත්ත්වය හා ඉදිරි කටයුතු පිළිබඳ අනෙකුත් අත්‍යවශ්‍ය තොරතුරු හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවය නියම කළ යුතු වේ. මෙමගින් කාලීන හා ඵලදායී ලෙස තොරතුරු ලබා ගැනීමට අධීක්ෂකවරුන්ට ඉඩ සැලසෙනු ඇත.

**(ඉ) ඒකාබද්ධ පදනමක් මත මූල්‍ය වාර්තා පිළියෙල කිරීම:**

අධීක්ෂකවරුන් හට ආයතන සමූහයක මූල්‍ය තත්ත්වය පිළිබඳ වඩා පුළුල් අවබෝධයක් ඒකාබද්ධ මූල්‍ය වාර්තා මගින් ලබා දේ. අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිතීන් ලොවපුරා පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතීන් වේ. "ඒකාබද්ධ සහ වියෝජ්‍ය මූල්‍ය ප්‍රකාශන" පිළිබඳව වන අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිති අංක 27, මගින් ආයතන සමූහයකට අදාළ වන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම මව් සමාගමේ පාලනයට යටත් කෙරේ.

**ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතනයන්හි අන්තර් සම්බන්ධතාව**

බලපත්‍රලාභී බැංකු සහ වෙනත් ආයතන අතර ඇති අන්තර් සම්බන්ධතාවය තුළින් ඇති විය හැකි සංකේන්ද්‍රණ අවදානමෙහි බලපෑම තක්සේරු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධ්‍යයනයක් කිරීම ආරම්භ කරන ලදී. ඒ අනුව, පරිපාලිත සමාගම්, ආශ්‍රිත සමාගම්, අනෙකුත් ආයෝජක ව්‍යාපාර ඒකකයන් සහ ප්‍රමුඛ සමූහ ව්‍යාපාරයන්/ගණුදෙනුකරුවන් 20 දෙනා වෙත බැංකුවල නිරාවරණය වීම් පිළිබඳ තොරතුරු එක්රැස් කරන ලදී.

මෙහිදී පරිපාලිත සමාගම් 38 කින් සහ ආශ්‍රිත සමාගම් 22 කින් යුතු වූ බැංකු සමූහ සමාගම් 11 ක් හඳුනා ගන්නා ලදී. එමෙන්ම තම පරිපාලිත හා ආශ්‍රිත සමාගම් නොවන ව්‍යාපාර ඒකක 95 ක, බැංකු ආයෝජනය කර තිබුණි. රක්ෂණ, ආයෝජන බැංකුකරණය, කල්බදුකරණය හා මූල්‍ය ව්‍යාපාර, කොටස් තැරැව්කරණය, මුදල් හුවමාරු ව්‍යාපාර සහ ඒකක භාර කළමනාකරණය වැනි මූල්‍ය සේවා සැපයුම්කරුවන්ගේ සිට දේපළ වෙළෙඳාම්, සංචාරක සේවා, හෝටල් සේවා, ස්කන්ධ ප්‍රාග්ධන සැපයීම්, උපදේශක සේවා සහ තොරතුරු තාක්ෂණ සේවා වැනි මූල්‍ය නොවන සේවා සැපයුම්කරුවන් දක්වා මෙම අන්තර් සම්බන්ධතා පැතිර තිබුණි. ප්‍රමුඛ ව්‍යාපාරයන් 20 ට බැංකු අංශයේ නිරාවරණය වීම බැංකුවල මුළු වත්කම්වලින් සියයට 18 ක් පමණ වන අතර, එක් එක් බැංකුව සැළකීමේදී එය සියයට 0.04 සිට සියයට 78.1 ක් දක්වා පරාසයක පැවතුණි. කෙසේ වෙතත්, අනෙකුත් පරිපාලිත හා ආශ්‍රිත සමාගම්වලට බැංකුවල නිරාවරණයවීම බැංකුවල මුළු වත්කම්වලින් සියයට 1.4 ක් පමණක් වේ.

අනෙකුත් බොහෝ රටවල් මෙන්ම, ශ්‍රී ලංකාවේ ද පහත දැක්වෙන පරිදි ඉහත මූල්‍ය සේවා සැපයුම් ව්‍යාපාර නියාමනය කිරීම සඳහා බහුවිධ නියාමන පද්ධතියක් පවත්වා ගෙන යයි.

- බැංකු, මූල්‍ය සමාගම්, කල්බදු සමාගම් සහ රාජ්‍ය සුරැකුම් ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව.

- සුරැකුම්පත් වෙළෙඳපොළ සහ ආයෝජන බැංකුකරණය සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව.
- රක්ෂණ සමාගම් සඳහා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය.

ව්‍යාපාර සමූහයක් බහුවිධ නියාමකයින්ගේ අධීක්ෂණයට ලක් වන විට, එම නියාමකයින් අතර නියාමන නොගැලපීම් ජනිත විය හැක. එමනිසා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, විවිධ මූල්‍ය ආයතනයන්හි නියාමකයින් අතර වඩාත් යහපත් සන්නිවේදනයක් සහ අවබෝධයක් ඇති කර ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිතුමාගේ සභාපතීත්වයෙන් යුතුව අන්තර් නියාමන ආයතන කවුන්සිලය පිහිටුවා ගැනීම ආරම්භ කරන ලදී. මෙම කවුන්සිලයෙහි ප්‍රධාන වගකීම් වන්නේ, මූල්‍ය අංශයෙහි විධිමත් වර්ධනය සඳහා අදාළ ප්‍රතිපත්තිමය විධිවිධානයන් සැකසීමට වග බලා ගැනීම, පුළුල් මූල්‍ය පද්ධතියෙහි ස්ථායීතාවය සුරැකීම පිණිස සියලු නියාමන ආයතන සම්බන්ධීකරණය වීම සහ තොරතුරු හුවමාරු කර ගැනීම තහවුරු කිරීමයි. එමෙන්ම, බැංකු විසින් පාලනය කරනු ලබන මූල්‍ය සමූහ ඒකාබද්ධ පදනමක් මත නියාමනය කිරීමේ වැදගත්කම විශේෂයෙන් සළකා බලා, අන්තර්ජාතිකව පිළිගත් පරිචයන් අනුව යමින්, බලපත්‍රලාභී බැංකුවල අධීක්ෂණ සහ නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු පනතට සංශෝධනයන් ඉදිරිපත් කිරීම ආරම්භ කර ඇත.


**නිගමනය**

ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශය, තිරසාර ඉහළ වර්ධන මාවතකට පිවිසීම මගින් ආර්ථිකයේ ඇති වන වෙනස් වන අවශ්‍යතාවයන් සමඟ සමාන්තරව ගමන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. එවැනි වෙනසක් තුළින් ඇති වන නොවැළැක්විය හැකි ප්‍රතිඵලයක් වනුයේ, මූල්‍ය පද්ධතිය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව තම ව්‍යාපාර ආකෘතීන් යළි ගැලපීම තුළින් අන්තර් සම්බන්ධතාවය තවදුරටත් ඉහළ යාමයි.

පද්ධතිමය අවදානම නිසා ඇති විය හැකි අහිතකර බලපෑම්වලින් තැන්පත්කරුවන් සහ සමස්ත ආර්ථිකය ආරක්ෂා කිරීම සඳහාත්, මූල්‍ය ආයතන කෙරෙහි මහජන විශ්වාසය ආරක්ෂා කිරීම සඳහාත්, මූල්‍ය පද්ධතිය ශක්තිමත්ව සහ ප්‍රත්‍යස්ථව පවත්වාගෙන යෑම සඳහාත් මූල්‍ය ආයතනවල අන්තර් සම්බන්ධතාවය හා බැඳුනු අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අඛණ්ඩව හඳුන්වා දෙනු ඇත. මූල්‍ය සමූහයන් අධීක්ෂණය හා නියාමනයට ඇති බාධා ඉවත් කිරීම සඳහා නෛතික ප්‍රතිසංස්කරණ ඇති කිරීම, දේශීය සහ ජාත්‍යන්තර නියාමකයන් අතර, තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා යාන්ත්‍රණයක් ඇති කිරීම (අන්තර්ජාතික මූල්‍ය සමූහයන් සඳහා) සහ ඇඩි මූල්‍ය අපහසුතාවයන්ට මුහුණදීම සඳහා බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනවලට පුළුල් විසඳුම් සැලසුම් සකස් කිරීම ආදිය මෙම ක්‍රියාමාර්ග අතරට ඇතුළත් වේ.

අතර ප්‍රමාණාත්මකව ව්‍යාප්ත වූ ණය ආදිය තුළින් පිළිබිඹු වන ආකාරයට 2012 වසරේ බැංකු අංශයේ ණය අවදානම කළමනාකරණය කර ගත හැකි මට්ටමක පැවතුණි. බැංකු අංශය, 2011 වසරේ දී වාර්තා කළ සියයට 32 ක (රුපියල් බිලියන 626) ණය වර්ධනය,


**8.2 රූප සටහන** **බැංකු අංශයේ අක්‍රීය ණය**




2012 වසර අවසන් වන විට සියයට 21 ක් (රුපියල් බිලියන 541) දක්වා පහත වැටුණේ, අඛණ්ඩව පැවති ණය ප්‍රසාරණය තුළින් බැංකු අංශයේ ස්ථායීතාවට මෙන්ම ආර්ථික ස්ථායීතාවට සිදු විය හැකිව තිබූ අහිතකර බලපෑම අවම කරමිනි. රුපියල් බිලියන 434 ක් වූ රුපියල් ණය වර්ධනය අපේක්ෂිත ණය වර්ධන සීමාව තුළ පැවැතුණි.

අක්‍රීය ණය අනුපාතය 2011 වසරේ පැවැති සියයට 3.8 ක මට්ටමේ සිට 2012 දී සියයට 3.6 ක මට්ටමක් දක්වා අඩු වීම මගින් පිළිඹිබු කරන ලෙසට, බැංකු අංශයේ වත්කම්වල ගුණාත්මක බව වැඩිදියුණු විය. කෙසේ නමුත්, අක්‍රීය ණය වටිනාකම 2012 වසරේ දී රුපියල් බිලියන 18 කින් වැඩි විය. විශේෂයෙන් සඳහන් කළ වර්ගයට අයත් වන අක්‍රීය ණය (මුළු අක්‍රීය ණය වර්ධනයෙන් සියයට 26 ක්) සඳහා විශේෂිත වෙන් කිරීමක් අවශ්‍ය නොවීය. ඒ අනුව, අක්‍රීය ණය අනුපාතයේ ඉහළ යාමට සාපේක්ෂව විශේෂිත වෙන් කිරීම්වල වර්ධනය අඩු මට්ටමකට පැවතීම 2012 වසර අවසානය වන විට විශේෂිත වෙන් කිරීම් ආවරණය පහළ යාමට හේතු විය.

**8.3 රූප සටහන** **බැංකු අංශයේ අක්‍රීය ණය සඳහා වෙන් කිරීම්**





බැංකු අංශයේ ණය දීම්, වෙළෙඳ (සියයට 15), ඉදිකිරීම් (සියයට 14), පරිභෝජන (සියයට 14), කෘෂිකාර්මික (සියයට 13) සහ නිෂ්පාදන (සියයට 11) යනාදි ක්ෂේත්‍ර වලට සංකේන්ද්‍රණය වීම තව දුරටත් පැවැතුණි.

**වෙළෙඳපොළ අවදානම:** 2012 වසරේ දී, දේශීය මූල්‍ය වෙළෙඳපොළවල විචලනයක් පැවැතිය ද, බැංකුවල සමස්ත අවදානම් ව්‍යුහය තුළ වෙළෙඳපොළ අවදානම අඩු මට්ටමක පැවතුණි. 2012 වසරේ දී වෙළෙඳපොළ අවදානම මත බර තැබූ වත්කම්, සමස්ත අවදානම මත බර තැබූ වත්කම්වලින් සියයට 2 ක අගයක් වූ අතර, 2011 දී එහි වටිනාකම සියයට 3 ක් විය. ඒ හේතුවෙන්, වෙළෙඳපොළ අවදානම සඳහා වූ ප්‍රාග්ධන අය කිරීම 2011 දී වූ රුපියල් බිලියන 7 ක් සිට 2012 අවසන් වන විට රුපියල් බිලියන 5 ක් දක්වා අඩු විය.

**පොලී අනුපාත:** සලකා බලන කාලපරිච්ඡේදය තුළදී, බැංකු අංශයේ වත්කම් සහ වගකීම් අතර

**8.4 රූප සටහන** **බැංකු අංශයේ ණය සංයුතියේ ආංශික දායකත්වය**




පරතරය (පොලී අනුපාතික සංවේදී වත්කම්වලින් පොලී අනුපාතික සංවේදී වගකීම් අඩුකල පසු) එම අංශයේ සමස්ත වත්කම්වල අනුපාතයක් ලෙස ගණනය කිරීමෙන් මනිනු ලබන ප්‍රතිමිලකරණ අවදානමට ඇති අනාවරණය ඵලදායී ලෙස කළමනාකරණය කරගැනීමට බැංකුවලට හැකිවිය. වසරක කාලයක් තුළ කල්පිරෙන සමස්ත වත්කම්වලට පොලී අනුපාතික සංවේදී වත්කම් සහ පොලී අනුපාතික සංවේදී වගකීම් අතර පරතරය 2011 වසරේ දී වූ සියයට සෘණ 14.1 ක සිට සියයට සෘණ 13.2 ක් දක්වා අඩු විය. එම නිසා, 2011 ට සාපේක්ෂව බැංකුවල ලාභදායීත්වය කෙරෙහි පොලී අනුපාතිකයේ විචලනයන්හි සමස්ත බලපෑම, 2012 දී ඉතා අවම විය. බැංකු අංශයේ ශුද්ධ පොලී ආන්තිකය, 2011 අවසානයේ දී වූ සියයට 4.2 ක සිට 2012 අවසානයේ දී සියයට 4.1 ක් දක්වා ආන්තික ලෙස පහළ ගියේය.

**කොටස් මිල ගණන්:** කොටස් වෙළෙඳපොළට බැංකු දක්වනු ලැබූ අනාවරණය අවම වූ බැවින්, කොටස් මිල ගණන්වල විචලනය නිසා පැන නගින අවදානම් ඉතා අල්ප මට්ටමක වූයේය. 2012 වර්ෂයේ දී, කොටස් වෙළෙඳපොළට බැංකු දක්වනු ලැබූ අනාවරණය මත සීමාවන් මහ බැංකුව විසින් පනවනු ලැබීය. එම නිසා කොටස් ප්‍රාග්ධන ආයෝජනයන් තුළින් කොටස් වෙළෙඳපොළ සඳහා ඇති අනාවරණය, බැංකු ක්ෂේත්‍රයේ සමස්ත ආයෝජන සහ සමස්ත වත්කම්වලින් පිළිවෙළින් සියයට 3 ක් හා සියයට 0.7 ක් වූයේය.

**විනිමය අනුපාත:** බැංකුවල සමස්ත ශුද්ධ විවෘත අනාවරණ තත්ත්වයන් සැලකිය යුතු නොවන මට්ටමක පැවැතීම නිසා විනිමය අනුපාතිකයේ විචලනය තුළින් මතුවන අවදානම් මනාව මැඩ පැවැත්වීමට හැකි විය. 2012 වසර අවසානයට බැංකු අංශයේ වත්කම්වලින් සියයට 10 ක් පමණක් විදේශ ව්‍යවහාර මුදල්වලින් සමන්විත විය. විවිධ ව්‍යවහාර මුදල්වලින් යුතු ශුද්ධ විවෘත තත්ත්වයන් පදනම් කරගෙන එක් එක් බැංකුවල විදේශ විනිමය අවදානමට වූ අනාවරණයන් විවිධ ප්‍රමාණයන්ගෙන් යුතු විය. කෙසේ වෙතත්, 2012 වර්ෂය අවසන් වන විට බැංකු අංශයේ ව්‍යවස්ථාපිත ප්‍රාග්ධන වටිනාකමට සාපේක්ෂව සමස්ත ශුද්ධ විවෘත විදේශ විනිමය තත්ත්වය සියයට 3 කටත් වඩා අඩු අගයක් ලබා ගත් බැවින්, මෙම අංශයේ ස්ථායීතාවට විදේශ විනිමය අවදානම තුළින් විශාල බලපෑමක් සිදු නොවුණි. 2012 වසරේ දී, බැංකු අංශයේ විදේශ විනිමය තත්ත්වය අඩු වීමට ප්‍රධාන හේතුව වූයේ, 2012 මාර්තු මාසයේ දී පැවති ව්‍යවස්ථාපිත ශුද්ධ විවෘත තත්ත්වයේ සීමාවන් පහත හෙළීමය. මීට අමතරව, බැංකු විසින් විදේශ විනිමය විචලනයන් සඳහා අනාවරණය අඩු කිරීමට තම ශුද්ධ විවෘත තත්ත්වයන් පහත හෙළන ලදී. විශේෂයෙන්ම, 2011 අවසානයට එ.ජ ඩොලර් සඳහා වූ සෘණ ශුද්ධ විවෘත තත්ත්වය රුපියල් බිලියන

**8.4 සංඛ්‍යා සටහන** **බැංකු අංශයෙහි ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම්වල සංයුතිය**

| අයිතමය | 2011 (අ) | | 2012 (ආ) | | වෙනස (රුපියල් බිලියන) | |
|---|---|---|---|---|---|---|
| | රුපියල් බිලියන | සමස්තයේ ප්‍රතිශතයක් ලෙස | රුපියල් බිලියන | සමස්තයේ ප්‍රතිශතයක් ලෙස | 2011 | 2012 |
| භාණ්ඩාගර බිල්පත් | 255 | 22.3 | 285 | 21.0 | (120.4) | 29.9 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 378 | 33.1 | 424 | 31.3 | 27.4 | 45.8 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 174 | 15.3 | 217 | 16.1 | 67.5 | 43.2 |
| මුදල් | 61 | 5.3 | 73 | 5.4 | 13.4 | 12.6 |
| ඉල්ලුම් තැන්පතු | 46 | 4.0 | 46 | 3.4 | (6.9) | 0.2 |
| දේශීය බැංකු සතු විදේශීය බැංකු ගිණුම්වල ශේෂයන් | 87 | 7.6 | 134 | 9.9 | (3.2) | 46.8 |
| වෙනත් | 140 | 12.3 | 175 | 12.9 | 51.7 | 34.4 |
| **ද්‍රවශීල වත්කම්වල එකතුව** | **1,141** | **100.0** | **1,354** | **100.0** | **29.5** | **212.9** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව


4 සිට 2012 අවසානයට රුපියල් බිලියන 0.2 දක්වා අඩු විය. 2012 වසර තුළ, එ.ජ ඩොලරයට එරෙහිව සියයට 10.43 කින් රුපියල අවප්‍රමාණය වීම නිසා විදේශ ව්‍යවහාර මුදල්වල වත්කම් සහ වගකීම්වල සිදු වූ ප්‍රත්‍යාගණන හේතුවෙන් බැංකුවල ලාභදායීත්වය මත ධනාත්මක බලපෑමක් ඇතිවිය. මේ නිසා, 2011 වසරේ දී වූ රුපියල් බිලියන 9 ට සාපේක්ෂව 2012 දී රුපියල් බිලියන 15 ක සැලකිය යුතු ප්‍රතිලාභයක් බැංකු අංශයට ලබා ගැනීමට හැකි විය.

**ද්‍රවශීලතා අවදානම**ː 2012 වසරේ දී, බැංකු අංශය ප්‍රමාණාත්මක ද්‍රවශීලතා මට්ටම් වලින් යුතුව ක්‍රියාත්මක විය. තැන්පතු හා ණය දීමේ අනුපාතවලට සාපේක්ෂව ණය දීම්වල සිදු වූ වර්ධනය 2011 දී වූ සියයට 70 ක මට්ටමේ සිට 2012 අවසානයේ දී සියයට 71 ක මට්ටම දක්වා වැඩි වීමට අනුකූලව බැංකු අංශයේ ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතය ද 2011 දී වූ සියයට 32 සිට 2012 දී සියයට 31 දක්වා ඉතා සුළු අගයකින් අඩු විය. ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතයේ අඩු වීමට ප්‍රධාන හේතුව වූයේ, සමස්ත වගකීම් පදනමේ ඇති වූ වර්ධනයයි (රුපියල් බිලියන 781 කින්). එසේ වුව ද, පවත්වා ගනු ලැබූ ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා මට්ටම, අවම නියාමන අවශ්‍යතාවට වඩා (සියයට 20 ට) ඉතා ඉහළ අගයක පැවතුණි. බැංකු අංශයේ ද්‍රවශීලතා මට්ටමේ මධ්‍යස්ථ බව, මුළු වත්කම්වලට සාපේක්ෂව ද්‍රවශීල වත්කම් අනුපාතිකයෙන් සහ තැන්පතුවලට සාපේක්ෂව ද්‍රවශීල වත්කම් අනුපාතිකයෙන් තවදුරටත් පිළිබිඹු විය.


මුළු ද්‍රවශීල වත්කම්, 2012 වසර තුළ දී රුපියල් බිලියන 213 කින් ඉහළ ගිය අතර, එය 2011 වසරේ දී රුපියල් බිලියන 30 ක් විය. භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය ඉහළ යෑම මෙන්ම විදේශ බැංකුවල වූ කෙටිකාලීන විදේශ ව්‍යවහාර මුදල් ශේෂයන්ගේ ඉහළ යෑම මූලික වශයෙන් මෙයට හේතු විය.

පැවැති ඇඩි මූල්‍ය ප්‍රතිපත්තිය සහ වත්කම් හා වගකීම් කළමනාකරණ ක්‍රමවේදයන්හි සිදු වූ වර්ධනය සමඟ, 2012 වසර අවසානය වන විට සියලු පරිණත කාලයන්හි සමුච්චිත වගකීම්වල ප්‍රතිශතයක් ලෙස, සමුච්චිත පරිණත පරතරයේ අගය 2011 වසරට

**8.5 රූප සටහන** **බැංකු අංශයේ ද්‍රවශීලතා අනුපාතයන්**




**8.6 රූප සටහන** **සමුච්චිත පරිණත කාලය-බැංකු අංශයේ සමුච්චිත වගකීම්වල ප්‍රතිශතයක් ලෙස**



සාපේක්ෂව අඩු වී ඇත. විශේෂයෙන්ම වසර එකකට අඩු කාලය සැළකීමේදී මෙම ප්‍රතිශතක අගය, 2011 වසරේ දී පැවති සෘණ 17 ක මට්ටමේ සිට 2012 අවසානයේ දී සෘණ 13 ක මට්ටම දක්වා අඩු වී ඇත.

**සම්පත්**

**ලාභදායීත්වය:** 2012 වසරේ දී බැංකු අංශයේ ලාභදායිත්වය වැඩි දියුණු විය. බැංකු අංශය රුපියල් බිලියන 82 ක ඉහළ බදු පසු ලාභයක් 2012 වසර සඳහා වාර්තා කළ අතර, 2011 දී එය රුපියල් බිලියන 66 ක් වූයේ ය. තවද, බැංකු අංශයේ ශුද්ධ පොලී ආන්තිකය 2011 වසරේ දී වාර්තා වූ සියයට 4.2 සිට 2012 දී සියයට 4.1 ක් දක්වා ආන්තික ලෙස අඩු වුව ද, 2012 වසර අවසානය වන විට බැංකු අංශයට එහි වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය සියයට 1.7 ක මට්ටමක පවත්වාගෙන යාමට හැකි විය. පොලී නොවන ආදායම 2011 වසරේ දී වාර්තා කළ රුපියල් බිලියන 7 ට සාපේක්ෂව 2012 වසරේ දී රුපියල් බිලියන 18 ක් දක්වා ඉහළ යෑම මෙම තත්ත්වය පවත්වාගෙන යෑම සඳහා දායක විය. විදේශ මුදල් සංචිත ප්‍රත්‍යාගණන කිරීම තුළින් ලබාගත් ලාභය හේතුවෙන් ඇති වූ ඉහළ විදේශ විනිමය ආදායම, ප්‍රධාන වශයෙන් පොලී නොවන ආදායමේ මෙම සැලකිය යුතු වැඩිවීම සඳහා හේතු විය. එය පොලී නොවන ආදායමේ වැඩි වීමෙන් සියයට 45 කි.

ඒ අනුව, ශුද්ධ පොලී ආන්තිකය, වත්කම් මත ප්‍රතිලාභ සහ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ යනාදී බැංකු අංශයේ සියලුම ලාභදායීත්ව දර්ශක යහපත් මට්ටමක පවත්වාගෙන ගිය අතර, එමගින් බැංකු අංශයේ අවදානම් දරා ගැනීමට ඇති හැකියාවේ වැඩි දියුණු වීමක් පිළිබිඹු කරනු ලැබීය.


**8.5 සංඛ්‍යා සටහන** **බැංකු අංශයෙහි ලාභදායිත්වය**

| අයිතමය | 2011 (අ) වටිනාකම (රු. බිලියන) | 2011 (අ) සමස්තයේ ප්‍රතිශතයක් ලෙස | 2012 (ආ) වටිනාකම් (රු. බිලියන) | 2012 (ආ) සමස්තයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| පොලී ආදායම | 357.7 | 9.2 | 494.7 | 10.3 |
| පොලී වියදම | 192.7 | 4.9 | 298.0 | 6.2 |
| **ශුද්ධ පොලී ආදායම** | **165.0** | **4.2** | **196.7** | **4.1** |
| පොලී නොවන ආදායම | 60.6 | 1.6 | 78.7 | 1.6 |
| විදේශීය හුවමාරු ආදායම | 14.9 | 0.4 | 26.7 | 0.6 |
| පොලී නොවන වියදම | 116.6 | 3.0 | 135.2 | 2.8 |
| සේවක පිරිවැය | 59.1 | 1.5 | 66.3 | 1.4 |
| අක්‍රීය ණය මත වෙන් කිරීම් | (2.9) | (0.1) | 6.3 | 0.1 |
| **බදු පෙර ලාභය (එකතු කළ අගය මත බදු අඩු කළ පසු)** | **94.1** | **2.4** | **116.3** | **2.4** |
| සාංගමික බදු පසු ලාභය | 65.6 | 1.7 | 82.3 | 1.7 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**8.7 රූප සටහන** **බැංකු අංශයේ ලාභදායීත්ව දර්ශක**




**ප්‍රාග්ධනය:** බැංකු අංශයේ ප්‍රාග්ධන අරමුදල්, 2011 වසරේ දී වූ සියයට 26 ක වැඩි වීමට සාපේක්ෂව 2012 වසරේ දී සියයට 18 ක වර්ධනයක් පෙන්නුම් කළ අතර, බැංකුවල අභ්‍යන්තර වශයෙන් උත්පාදනය කරගත් ලාභ මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. 2011 වසරේ දී පැවැති එම ඉහළ වර්ධනයට හේතු වූයේ, අවම ප්‍රාග්ධන අවශ්‍යතාව සපුරාලීම සඳහා බැංකු කිහිපයක් නව කොටස් නිකුතු සහ හිමිකම් නිකුතු මගින් ප්‍රාග්ධනය රැස්කර ගැනීමය.

2012 වර්ෂය සඳහා බැංකුවල විගණනය කරන ලද ලාභය ද ප්‍රාග්ධනයට ඇතුළත් කළ පසු මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය සහ මූලික ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය පිළිවෙළින් සියයට 16 ක් සහ සියයට 14 ක් පමණ වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.


**8.6 සංඛ්‍යා සටහන** **බැංකු අංශයෙහි නියාමන ප්‍රාග්ධන සංයුතිය**

| අයිතමය | වටිනාකම (රු. බිලියන) 2011 (අ) | වටිනාකම (රු. බිලියන) 2012 (ආ) | සංයුතිය (%) 2011 (අ) | සංයුතිය (%) 2012 (ආ) |
|---|---|---|---|---|
| **ප්‍රථම ස්ථරය** | **330.3** | **337.8** | **100.0** | **100.0** |
| කොටස් ප්‍රාග්ධනය | 126.4 | 128.6 | 38.3 | 38.1 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල් | 20.2 | 20.9 | 6.1 | 6.2 |
| නොබෙදූ ලාභ | 103.3 | 94.5 | 31.3 | 28.0 |
| පොදු හා අනෙකුත් සංචිත | 100.9 | 101.9 | 30.5 | 30.2 |
| වෙනත් | 0.0 | 14.7 | 0.0 | 4.4 |
| නියාමක ගැලපීම් | (20.5) | (22.8) | (6.2) | (6.7) |
| **දෙවන ස්ථරය** | **38.7** | **46.7** | **100.0** | **100.0** |
| ප්‍රත්‍යාගණන සංචිත | 8.5 | 8.9 | 22.0 | 19.1 |
| උපකාරක ණය | 33.2 | 38.9 | 85.8 | 83.3 |
| පොදු වෙන්කිරීම් | 11.2 | 13.5 | 28.9 | 28.9 |
| නියාමක ගැලපීම් | (14.2) | (14.6) | (36.7) | (31.3) |
| **මුළු ප්‍රාග්ධන පදනම** | **369.0** | **384.5** | | |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**8.8 රූප සටහන** **බැංකු අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත**




2012 වසරේ දී, මහ බැංකුව විසින් අවදානම් ඇගයීමේ හා ප්‍රාග්ධනය සැලසුම් කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් බාසල් II සම්මුතියෙහි ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා රාමුවේ II වන අදියර යටතේ අධීක්ෂණ විමසුම් ක්‍රියාවලිය සඳහා කෙටුම්පත් කළ ලියවිල්ලක් ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකාවේ බැංකු අංශය සියයට 14 ක් වූ පොදු කොටස් අනුපාතිකයක් (ඇස්තමේන්තු කළ) සහ සියයට 16 ක් වූ සමස්ත ප්‍රාග්ධන අනුපාතිකයක් (ඇස්තමේන්තු කළ) පවත්වාගෙන ගිය අතර, එමගින් පිළිවෙළින් සියයට 6 ක් සහ සියයට 10.5 ක් වූ අවම අවශ්‍යතාවය ඉක්මවා යමින් බාසල් ෦ ප්‍රාග්ධන සම්මුතියට අදාළ නව ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සපුරාගෙන ඇති බව පිළිබිඹු කෙරේ.

**අධීක්ෂණ සහ නියාමන සංවර්ධනයන්:** 2012 වසරේ දී මහ බැංකුව විසින් නියාමන සහ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කිහිපයක්ම හඳුන්වා දෙන ලදී. ඉහළ ණය වර්ධනය සීමා කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු විසින් ප්‍රදානය කරනු ලබන රුපියල් ණය වර්ධන මත සීමාවක් පනවනු ලැබීය. විදේශ විනිමය වෙළෙඳ කටයුතුවලට අදාළවන ව්‍යාපාරික හැසිරීම සහ වෙළෙඳපොළ පරිචය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු විශේෂිත පියවරයන් ඇතුළත් නියෝග නිකුත් කරන ලදී. අභ්‍යන්තර විගණන සහ තොරතුරු තාක්ෂණය යනාදිය සම්බන්ධ කටයුතු ඇතුළත් ව්‍යාපාරික මෙහෙයුම් සඳහා බාහිර සේවා ලබා ගැනීමේදී අනුගමනය කළ යුතු විශේෂිත පියවරයන් සඳහා ද නියෝග නිකුත් කරනු ලැබීය. තවද, බැංකු ශාඛා වර්ගීකරණය සංශෝධනය කරනු ලැබූ අතර, බලපත්‍රලාභී බැංකු ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ පවත්වාගෙන යනු ලබන රජයේ සුරැකුම්පත්වල සිදු කළ ආයෝජනයන් ද්‍රවශීල වත්කම් වශයෙන් ඇතුළත් කිරීම සඳහා ද්‍රවශීලතා නිර්වචනයට අදාළ සංශෝධන ඉදිරිපත්කර ඇත. බැංකු තුළ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවක් ක්‍රියාත්මක කිරීමට මෙන්ම බැංකුවල සාංගමික යහපාලනය තවදුරටත් ශක්තිමත් කරලීම සඳහා විශේෂ අවධානයක් වර්ෂය තුළ දී යොමුකරන ලදී. මේ අතර, පාරිභෝගික සුරක්ෂිතතාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් පාරිභෝගික සේවාවන්වලට අදාළ බැංකුවල ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් පරීක්ෂා කරනු ලැබූ අතර, එමගින්, බැංකු අංශය කෙරෙහි ඇති මහජන විශ්වාසය වර්ධනය වූයේය. මෙම ප්‍රතිපත්ති සම්බන්ධ වැඩිපුර විස්තර මෙම වාර්තාවේ II කොටසේ සහ III කොටසේ ඉදිරිපත් කර ඇත. ඉහත විස්තර කරනු ලැබූ නියාමන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම මගින්, බැංකු අංශයේ අවදානම් මෙන්ම බැංකු අංශය ඇතුළත සිදුවන ක්‍රියාවලීන් සහ පරිචයන් ශක්තිමත් වීම සිදුවනු ලබන අතර, එමගින් බැංකු අංශයේ ස්ථායීතාව වැඩිවනු ඇත.

### බැංකු නොවන මූල්‍ය ආයතන අංශය

**බලපත්‍රලාභී මුදල් සමාගම්වලින් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වලින් සමන්විත බැංකු නොවන මූල්‍ය ආයතන අංශය, 2012 වර්ෂය තුළ දී සියයට 22 ක වර්ධනයක් වාර්තා කරනු ලැබීය.** බැංකු නොවන මූල්‍ය ආයතනවල සුරක්ෂිතතාව සහ ශක්තිමත් බව ඉහළ නැංවීමට ගනු ලැබූ පියවර සහ එම ආයතනවල ශාඛා ජාලයේ ඇති වූ ප්‍රසාරණය බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ වර්ධනයට දායක විය. බැංකු නොවන මූල්‍ය ආයතන අංශයට අවදානම් දරා ගැනීමට හැකිවන අයුරින් අවදානම් කළමනාකරණ භාවිතයන් ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර මහ බැංකුව විසින් අඛණ්ඩව ගනු ලැබීය. එහි ප්‍රතිඵලයක් ලෙස, එම අංශයේ වත්කම්වල ගුණාත්මකභාවය ඇති වීම, ද්‍රවශීලතාවය යහපත් මට්ටමක පැවතීම, ප්‍රමාණවත් ලාභදායීත්වයක් වාර්තා කිරීම සහ ප්‍රමාණවත් තරම් වූ ප්‍රාග්ධන මට්ටම් වාර්තා වීම යනාදිය ද දක්නට ලැබුණි. වර්ෂය තුළ දී ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රතිපත්ති යෝජනාවලට අනුකූලව පීඩාවට පත් බැංකු නොවන මූල්‍ය ආයතනවල මූල්‍ය තත්ත්වය තහවුරු කිරීම සහ ශක්තිමත් කිරීම අඛණ්ඩව සිදු වනු ලැබීය. කෙසේ වුවද, පසුගිය වසරේ මාර්තු මාසයේ සිට වාහන ආනයනය කිරීමේ දී අය කරනු ලැබූ ආනයන බදු ඉහළ දැමීම නිසා වාහන ආනයනය පහත වැටීම සහ 2012 වසර තුළ රුපියල අවප්‍රමාණය වීම යනාදිය බැංකු නොවන මූල්‍ය ආයතන අංශයෙහි කල්බදු මූල්‍යකරණ සහ කුලී සින්නක්කර කටයුතුවල වර්ධනයට බලපෑම් කරනු ලැබීය.

**8.7 සංඛ්‍යා සටහන**

**බැංකු නොවන මූල්‍ය ආයතනයන්හි ශාඛා ව්‍යාප්තිය - පළාත් අනුව**

| පළාත | 2011 දෙසැම්බර් අවසානයට (අ) | 2012 දෙසැම්බර් අවසානයට (ආ) |
|---|---|---|
| බස්නාහිර | 265 | 316 |
| දකුණ | 91 | 112 |
| සබරගමුව | 59 | 76 |
| වයඹ | 67 | 99 |
| මධ්‍යම | 82 | 107 |
| ඌව | 43 | 52 |
| උතුරුමැද | 55 | 69 |
| නැගෙනහිර | 60 | 78 |
| උතුර | 44 | 63 |
| **එකතුව** | **766** | **972** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## ව්‍යාපාර වර්ධනය

**ව්‍යාප්තිය:** 2012 වර්ෂය අවසානය වන විට බැංකු නොවන මූල්‍ය ආයතන අංශය බලපත්‍රලාභී මුදල් සමාගම් 47 කින් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 13 කින් සමන්විත විය. වර්ෂය තුළ දී, දේශෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්, අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ්, මෙල්ස්ටා රීගල් ෆිනෑන්ස් ලිමිටඩ් සහ රිචඩ් පීරිස් ආර්පිකෝ ෆිනෑන්ස් ලිමිටඩ් යන සමාගම් හතර 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ ඒවායේ ලියාපදිංචිය සඳහා අවශ්‍ය බලපත්‍ර ලබා ගන්නා ලදී. තවද, විශේෂිත කල්බදු මූල්‍යකරණ ආයතන හතරක් 2012 වර්ෂය තුළ දී බලපත්‍රලාභී මුදල් සමාගම් තත්ත්වයට පත්විණ. මේ අතර, බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ශාඛා ව්‍යාප්තිය 972 දක්වා ශාඛා 206 කින් වැඩි වූ අතර, ඉන් ශාඛා 155 ක් බස්නාහිර පළාතෙන් පිටත වෙනත් පළාත්වල විවෘත කරන ලදී. උතුරු සහ නැගෙනහිර පළාත්වල සිදුවිය හැකි වර්ධනය පිළිබිඹු කරමින් එම පළාත්වල බැංකු නොවන මූල්‍ය ආයතන ශාඛා සංඛ්‍යාව පිළිවෙළින් 19 කින් හා 18 කින් වර්ධනය විය.

## වත්කම් සහ වගකීම්

**වත්කම්:** බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ සමස්ත වත්කම් ප්‍රමාණය 2011 වසරේ දී වූ සියයට 26 ක වර්ධනය හා සසඳන විට 2012 වර්ෂය තුළ දී එය සියයට 22 කින්, රුපියල් බිලියන 597 ක් දක්වා වැඩි විය. ප්‍රදානය කරනු ලැබූ ණයවල වර්ධනය වත්කම් පදනමේ සිදු වූ වර්ධනය, ප්‍රසාරණයට ප්‍රධාන වශයෙන් දායක විය. 2011 වසරේ දී සිදු කළ ණය පහසුකම්වල වාර්තා වූ සියයට 46 ක සැලකිය යුතු වර්ධනය හා සසඳා බලන විට 2012 වර්ෂය අවසාන වන විට එය රුපියල් බිලියන 472 ක් දක්වා සියයට 21 කින් වර්ධනය විය. කල්බදු මූල්‍යකරණය, කුලී පිට ගැනුම් සහ අනෙකුත් සුරක්ෂිත ණය, ණය පහසුකම්වල ප්‍රධාන මූලාශ්‍ර වූ අතර, ඒවා සමස්ත ණයවලින් සියයට 46 ක්, සියයට 26 ක් සහ සියයට 16 ක් වූයේය. අනෙකුත් පහසුකම් අතර, තැන්පතු සුරැකුම් ලෙස තබාගෙන සපයන ණය, උකස් ණය සහ අනෙකුත් සුරක්ෂිත ණය පිළිවෙළින් සියයට 66 ක, සියයට 53 ක සහ සියයට 30 ක ඉහළ වර්ධනයක් වාර්තා කෙරිණ. බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ආයෝජන කළඹ 2011 වසරේ දී වාර්තා කළ සියයට 46 ක ඍණ වර්ධනය හා සසඳන කළ, මෙම වර්ෂයේ දී එය සියයට 14 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

**8.8 සංඛ්‍යා සටහන**


**බැංකු නොවන මූල්‍ය ආයතන අංශයෙහි වත්කම් සහ වගකීම් සංයුතිය**

| අයිතමය | 2011 (අ) | | 2012 (ආ) | | වෙනස (%) | |
|---|---|---|---|---|---|---|
| | රුපියල් බිලියන | සමස්තයේ ප්‍රතිශතයක් ලෙස | රුපියල් බිලියන | සමස්තයේ ප්‍රතිශතයක් ලෙස | 2011 | 2012 |
| **වත්කම්** | | | | | | |
| ණය පහසුකම් | 388.4 | 79.3 | 471.7 | 79.1 | 46.3 | 21.4 |
| මූල්‍ය කල්බදු | 166.1 | 33.9 | 214.9 | 36.0 | 89.8 | 29.4 |
| කුලීපිට ගැනුම් | 118.4 | 24.2 | 123.0 | 20.6 | 23.3 | 3.9 |
| ආයෝජන | 13.5 | 2.8 | 15.4 | 2.6 | (46.4) | 14.1 |
| වෙනත් | 88 | 18.0 | 109.6 | 18.4 | (9.5) | 24.5 |
| **වගකීම්** | | | | | | |
| මුළු තැන්පතු | 186.0 | 38.0 | 254.1 | 42.6 | 27.3 | 36.6 |
| මුළු ණය ගැනීම් | 171.6 | 35.0 | 176.0 | 29.5 | 23.5 | 2.6 |
| ප්‍රාග්ධන මූලිකාංග | 77.0 | 15.7 | 94.9 | 15.9 | 60.1 | 23.2 |
| සමස්ත අරමුදල් | 434.6 | 88.7 | 525 | 88.0 | 30.5 | 20.8 |
| වෙනත් | 55.3 | 11.3 | 71.6 | 12.0 | 1.1 | 29.6 |
| **සමස්ත වත්කම්/වගකීම්** | 489.9 | 100.0 | 596.6 | 100.0 | 26.3 | 21.8 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**8.9 රූප සටහන** **බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ සේවාවන් අනුව සපයන ලද මුළු ණය පහසුකම්**





අනෙකුත් වත්කම් ප්‍රධාන වශයෙන් ද්‍රවශීල වත්කම්, විකිණීමේ අරමුණින් රැස්කර තබාගත් වත්කම් සහ ස්ථාවර වත්කම් වලින් සමන්විත විය.

**වගකීම්:** බලපත්‍රලාභී මුදල් සමාගම්වල ප්‍රධාන අරමුදල් මූලාශ්‍රය තැන්පතු වන අතර, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ප්‍රධාන අරමුදල් මූලාශ්‍රය ණය ගැනීම් විය. එමෙන්ම, ඒවා බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ මුළු වගකීම් වලින් පිළිවෙළින් සියයට 43 ක් හා සියයට 30 ක් විය. බලපත්‍රලාභී මුදල් සමාගම් කෙරෙහි ඇති මහජන විශ්වාසය ඉහළ යාම පිළිබිඹු කරමින්, 2011 වසරේ දී තැන්පතුවල අත්කර ගත් සියයට 27 ක වර්ධනය හා සසඳන කළ, 2012 වසර අවසානය වන විට තැන්පතු රුපියල් බිලියන 254 ක් දක්වා සියයට 37 කින් වර්ධනය විය. මෙයට අමතරව, වගකීම්වල ණය ගැනීම් ප්‍රමාණය අඩුවී තැන්පතු ප්‍රමාණය වැඩි වීමට විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 4 ක් බලපත්‍රලාභී මුදල් සමාගම් තත්ත්වයට පත්වීමට හේතු විය. බලපත්‍රලාභී මුදල් සමාගම් තැන්පතු රැස් කිරීම ප්‍රධාන වශයෙන් කාලීන තැන්පතු මගින් සිදුකළ අතර, එය මුළු තැන්පතුවලින් සියයට 98 ක් විය. මහජන තැන්පතුවලින් හැරුණු කොට, බලපත්‍රලාභී මුදල් සමාගම් ණය ගැනීම් තුළින් ද අරමුදල් රැස් කරනු ලැබීය. බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ සමස්ත ණය ගැනීම් ප්‍රමාණය 2011 වසරේ වාර්තා වූ සියයට 24 ක ශීඝ්‍ර වර්ධනය හා සසඳන කළ, 2012 වර්ෂ අවසානය වන විට රුපියල් බිලියන 176 ක් දක්වා සියයට 3 කින් වර්ධනය විය. 2012 වර්ෂයේ මුළු ණය ගැනීම්වලින් සියයට 21 ක් විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් හි ණය ගැනීම්වලින් සමන්විත වේ. බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ සේවාවන් සඳහා ඇති ඉල්ලුම පිළිබිඹු කරමින්, ප්‍රදානය කර ඇති ණය, තැන්පතු හා ණය ගැනීම්වල අනුපාතයක් ලෙස, 2011 වසරේ පැවති සියයට 109 ක අගයේ සිට 2012 වර්ෂයේ දී සියයට 110 දක්වා ආන්තික ලෙස වැඩි විය. බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ප්‍රාග්ධන අරමුදල් අගය, 2011 වසරේ වාර්තා වූ සියයට 60 ක වර්ධනය හා සසඳන කළ, 2012 වසර අවසානය වන විට එය රුපියල් බිලියන 95 දක්වා සියයට 23 කින් වර්ධනය විය. මෙම අංශයේ ලාභදායිත්වය නොකඩවා පවත්වා ගෙන යාම ප්‍රාග්ධන අරමුදල් ශක්තිමත් වීමට හේතු විය.

### අවදානම් කළමනාකරණය

**ණය අවදානම:** මුළු අක්‍රීය ණය ප්‍රමාණය, 2011 වසරේ දී පැවැති රුපියල් බිලියන 20 ක ප්‍රමාණයේ සිට 2012 වසරේ දී රුපියල් බිලියන 24 ක් දක්වා සියයට 19 කින් ඉහළ ගියේය. මුළු අක්‍රීය ණයවලින් සියයට 92 ක් බලපත්‍රලාභී මුදල් සමාගම්වලින් වූ අතර, පීඩාවට පත් සමාගම් මීට ප්‍රධාන වශයෙන් දායක විය. තවද, ණය පහසුකම්වල ඇති වූ වර්ධනය හේතුවෙන්, අක්‍රීය ණය, මුළු ණය පහසුකම්වලට දක්වන අනුපාතිකය 2011 වසර අවසානයේ දී වූ සියයට 5.1 සිට 2012 වසර අවසානය වන විට සියයට 5.0 දක්වා සුළු වශයෙන් අඩු විය. 2012 වසර අවසානය වන විට ණය අලාභ සඳහා වූ වෙන්

**8.10 රූප සටහන** **බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ අක්‍රීය ණය පහසුකම් සහ වෙන්කිරීම් ආවරණයන්**



**8.9 සංඛ්‍යා සටහන** **බැංකු නොවන මූල්‍ය ආයතන අංශයෙහි ආදායම් සහ වියදම් සංයුතිය**

| අයිතමය | වටිනාකම (රු. බිලියන) | | වර්ධනය | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2011 (අ) | | 2012 (ආ) | |
| | 2011 (අ) | 2012 (ආ) | වටිනාකම (රු. බිලියන) | ප්‍රතිශතය | වටිනාකම (රු. බිලියන) | ප්‍රතිශතය |
| පොලී ආදායම | 68.0 | 92.9 | 14.8 | 27.7 | 24.8 | 36.5 |
| පොලී වියදම | 35.1 | 52.6 | 5.2 | 17.4 | 17.5 | 49.7 |
| **ශුද්ධ පොලී ආදායම** | **32.9** | **40.3** | **9.6** | **40.9** | **7.4** | **22.4** |
| පොලී නොවන ආදායම | 17.2 | 13.3 | 4.9 | 39.8 | (3.9) | (22.6) |
| පොලී නොවන වියදම | 26.0 | 30.1 | 5.6 | 27.7 | 4.1 | 15.9 |
| සේවක පිරිවැය | 8.7 | 11.0 | 2.0 | 29.3 | 2.3 | 26.0 |
| අක්‍රිය ණය සඳහා වෙන් කිරීම් (ශුද්ධ) | (1.4) | 1.5 | (5.9) | (132.2) | 3.0 | 205.2 |
| **බදු පෙර ලාභය** | **25.6** | **22.7** | **14.8** | **137.3** | **(2.9)** | **(11.5)** |
| බදු | 6.6 | 6.5 | 0.7 | 12.0 | (0.1) | (2.4) |
| **බදු පසු ලාභය** | **19.0** | **14.9** | **14.1** | **289.0** | **(4.1)** | **(27.1)** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කිරීම් සලකා බලන කළ, ශුද්ධ අක්‍රීය ණය අනුපාතය සියයට 1.6 ක් ලෙස වාර්තා විය. 2011 වසර අවසානයේ දී වාර්තා වූ සියයට 55.4 ක අක්‍රීය ණය සඳහා වූ මුළු වෙන් කිරීම් ආවරණ අනුපාතය, 2012 වසර අවසානය වන විට සියයට 55.6 ක් දක්වා ආන්තික ලෙස වර්ධනය විය.


**වෙළෙඳපොළ අවදානම:** 2012 වසරේ දී ඇති වූ ණය වර්ධනයෙහි පසුබෑම සහ වෙළෙඳපොළ පොලී අනුපාත ඉහළ යෑම මධ්‍යයේ වුව ද බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ඉපැයීම් අඛණ්ඩව ස්ථාවර මට්ටමක පැවතිණි. බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ මුළු වත්කම්වලට ශුද්ධ ආන්තික ආදායම දක්වන අනුපාතය ලෙස ගණනය කරනු ලබන ශුද්ධ පොලී ආන්තිකය 2011 වසරේ පැවැති සියයට 6.7 සිට 2012 අවසානයට සියයට 6.8 දක්වා ආන්තික ලෙස ඉහළ ගියේය. මෙම අංශයේ ශුද්ධ පොලී ආදායම පසුගිය වර්ෂයේ දී පැවැති රුපියල් බිලියන 33 ක ප්‍රමාණයේ සිට 2012 වසර අවසානය වන විට රුපියල් බිලියන 40 දක්වා සියයට 22 කින් වර්ධනය විය.

**ද්‍රවශීලතා අවදානම :** බලපත්‍රලාභී මුදල් සමාගම්වල ඉපැයීම්වල සිදු වූ වර්ධනය හේතුවෙන්, 2012 වසර අවසාන වන විට එම අංශයේ පැවැති සමස්ත ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් ප්‍රමාණය, නියාමන අවම අවශ්‍යතාව වන රුපියල් බිලියන 26 ට වඩා රුපියල් බිලියන 4.4 ක අතිරික්තයක් පවත්වාගෙන යනු ලැබීය. (කාලීන තැන්පතු හා තැන්පතු සහතික සියයට 10 ක් සහ ඉතිරිකිරීම් තැන්පතු සියයට 15 ක්). ද්‍රවශීලතාව සම්බන්ධව පනවනු ලැබූ නව විධානයට අනුකූලව සියලුම කල්බදු මූල්‍යකරණ සමාගම් 2012.09.01 දින සිට ඒවායේ ද්‍රවශීල වත්කම් පවත්වා ගත යුතුය. 2012 අවසානය වන විට විශේෂිත කල්බදු මූල්‍යකරණ අංශයේ පැවති සමස්ත ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් ප්‍රමාණය, නියාමන අවම අවශ්‍යතාව වන රුපියල් බිලියන 1.6 ට වඩා රුපියල් බිලියන 1.7 ක අතිරික්තයක් පැවතිණ (මුළු වගකීම් වලින්, කොටස්කරුවන් වෙත ඇති වගකීම්, සුරැකුම්කරණ ණය හා වත්කම්වලින් සුරක්ෂිත වසරකට වඩා වැඩි දිගුකාලීන ණය හැරුණු කොට ඇති ශේෂ පත්‍රයෙන් බැහැර අයිතමයන්ගෙන් සියයට 5 ක්).

**සම්පත්**

**ලාභදායිත්වය:** පොලී ආන්තික මත පැවති පීඩනය සහ වාහන ආනයනය කිරීමේ දී වැඩි වූ බදු හේතුවෙන් වාහන කල්බදුකරණය සඳහා ඇති ඉල්ලුම පහළ යමින් පැවතියද, බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ලාභදායිත්වය යහපත් මට්ටමකින් පවත්වා ගැනීමට හැකිවිය. 2011 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 19 ක බදු පසු ලාභය හා සසඳන කළ, 2012 වර්ෂය තුළ දී බැංකු නොවන මූල්‍ය ආයතන අංශය රුපියල් බිලියන

**8.11 රූප සටහන** **බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ලාභදායිත්ව දර්ශක**



**8.10 සංඛ්‍යා සටහන — බැංකු නොවන මූල්‍ය ආයතන අංශයෙහි නියාමන ප්‍රාග්ධන සංයුතිය**

| අයිතමය | වටිනාකම (රු. බිලියන) | | සංයුතිය (%) | |
|---|---|---|---|---|
| | 2011 (අ) | 2012 (ආ) | 2011 (අ) | 2012 (ආ) |
| **ප්‍රථම ස්ථරය** | **56.5** | **75.0** | **100** | **100** |
| කොටස් ප්‍රාග්ධනය | 41.2 | 53.4 | 73 | 71 |
| කොටස් අධිමිල | 2.7 | 2.6 | 5 | 3 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල් | 4.7 | 6.7 | 8 | 9 |
| සාමාන්‍ය සහ අනෙකුත් සංචිත | 13.3 | 17.0 | 24 | 23 |
| වෙනත් | (5.5) | (4.8) | (10) | (6) |
| **දෙවන ස්ථරය** | **3.4** | **4.7** | **100** | **100** |
| ප්‍රත්‍යාගණන සංචිත | 2.1 | 2.5 | 60 | 53 |
| පොදු වෙන් කිරීම් | 0.6 | 0.4 | 16 | 7 |
| උපකාරක ණය | 0.7 | 0.9 | 21 | 18 |
| වෙනත් | 0.1 | 1.0 | 2 | 21 |
| නියාමක ගැලපීම් | (4.7) | (2.5) | | |
| **මුළු ප්‍රාග්ධන පදනම** | **55.2** | **77.2** | | |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

15 ක බදු පසු ලාභයක් වාර්තා කළේය. මෙම අංශයේ ලාභ පහළ යාමට, සියයට 23 ක් වූ පොලී නොවන ආදායමෙහි අඩුවීම සහ සියයට 16 ක් වූ පොලී නොවන වියදමෙහි වැඩි වීම ප්‍රධාන වශයෙන් ආයක විය. ඒ අනුව, 2011 වර්ෂයේ දී, පිළිවෙළින් සියයට 6 ක් හා සියයට 34 ක්ව පැවති බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ලාභදායිතා දර්ශක වන වත්කම් මත ප්‍රතිලාභ සහ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාත, 2012 වසරේ දී පිළිවෙළින් සියයට 4 ක් සහ සියයට 19 ක් දක්වා පහළ ගියේය.

**ප්‍රාග්ධනය:** බැංකු නොවන මූල්‍ය ආයතන අංශයෙහි ප්‍රාග්ධන අරමුදල්, 2011 වසරේ වාර්තා වූ සියයට 57 ක වර්ධනය හා සසඳන කළ, 2012 වසර අවසාන වන විට රුපියල් බිලියන 86 ක් දක්වා සියයට 27 කින් වර්ධනය විය. මෙම අංශයේ පවත්වා ගනු ලැබූ ලාභදායිත්වය සහ නව ප්‍රාග්ධනය හඳුන්වා දීමත් සමග 2013.01.01 දින සිට බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් ඔවුන්ගේ අවම මූලික ප්‍රාග්ධනය, පිළිවෙළින් රුපියල් මිලියන 300 ක් හා රුපියල් මිලියන 150 ක් දක්වා ඉහළ නංවා ගත යුතුය යන අවශ්‍යතාවය මත මෙම අංශයේ ප්‍රාග්ධන අරමුදල් ශක්තිමත් විය. රුපියල් බිලියන 1.3 ක් වන හිමිකම් නිකුතුවක්, රුපියල් බිලියන 1.9 ක උපායමාර්ගික ආයෝජන සහ රුපියල් බිලියන 1.8 ක ප්‍රාග්ධන ආයෝජන යනාදිය තුළින් බැංකු නොවන මූල්‍ය ආයතන අංශය වෙත රුපියල් බිලියන 5 ක නව ප්‍රාග්ධන ප්‍රමාණයක් ඒකරාශී කර ගැනීමට හැකිවිය. ප්‍රාග්ධන අරමුදල් ඉහළ මට්ටමක පවත්වා ගැනීම හේතුවෙන්, බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත අවශ්‍ය අවම මට්ටමට වඩා ඉහළ අගයක පවත්වා ගැනීමට හැකිවිය. 2011 වසර අවසානයට පැවති සියයට 14 ක් වූ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය 2012 අවසානය වන විට සියයට 16 ක් දක්වා ඉහළ ගියේය. 2012 අවසානය වන විට අවශ්‍ය අවම මූලික ප්‍රාග්ධන අනුපාතය සියයට 5 ඉක්මවා සියයට 15 දක්වා ඉහළ ගොස් තිබිණි. එමෙන්ම, බලපත්‍රලාභී මුදල් සමාගම් හි ප්‍රාග්ධන අරමුදල් මුළු තැන්පතු වලට දක්වන අනුපාතය 2011 අවසානයට වූ සියයට 20 සිට 2012 වසර අවසානය වන විට සියයට 28 දක්වා වර්ධනය වී ඇත.

**පීඩාවට පත් සමාගම් ප්‍රතිව්‍යුහගත කිරීම:** මහ බැංකුව විසින් අඛණ්ඩව සිදු කරනු ලැබූ දුරස්ථ පරීක්ෂණ සහ බැංකු නොවන මූල්‍ය ආයතනයන්හි අධ්‍යක්ෂ මණ්ඩල සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සමග නිරන්තරව පවත්වනු ලැබූ හමුවීම් තුළින් පීඩාවට පත් සමාගම්වල කාර්ය සාධනය සමීපව පරීක්ෂාවට ලක් කිරීම සිදුකරනු ලැබීය. පීඩාවට පත් සමාගම් බොහොමයක් සඳහා උපාය මාර්ගික ආයෝජකයන් සම්බන්ධ කරගනු ලැබීය.

**අවසර නොමැතිව මුදල් ව්‍යාපාර පවත්වාගෙන යාමට එරෙහිව ගන්නා ලද ක්‍රියාමාර්ග:** අවසරයක් නොමැතිව මුදල් ව්‍යාපාරවල නිරත වූ බවට චෝදනා ලද ආයතන සම්බන්ධව මහ බැංකුව විමර්ශන කටයුතු සිදුකරනු ලැබීය. අධිකරණවල විභාග වෙමින් පවතින නඩු සම්බන්ධයෙන් ද සහාය දක්වන ලදී. 2012 වර්ෂය තුළ දී, දීප ව්‍යාප්ත සම්මන්ත්‍රණ/වැඩමුළු වැනි මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 26 ක් මගින් අනවසර මුදල් ව්‍යාපාරවල ආයෝජනය කිරීමේ ඇති අවදානම සම්බන්ධයෙන් දැනුවත් කිරීම සිදු කෙරිණ. අනවසර මුදල් ව්‍යාපාරවල ආයෝජනය කිරීමේ ඇති අවදානම පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ කලාපීය විකාශන සේවා මගින් විශේෂ වැඩසටහන් විකාශනය කිරීම සහ සිංහල හා දෙමළ භාෂාවලින් රූපවාහිනි වෙළෙඳ දැන්වීම් විකාශය කිරීම යනාදිය සිදු කෙරිණ. තවද, බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම්වල නම් ලැයිස්තු ඇතුළත් පෝස්ටර්, තෝරාගත් දිස්ත්‍රික්කවල ග්‍රාම නිලධාරීන් අතර බෙදා හරින ලදී. බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම්වල නම් ලැයිස්තු සහ ප්‍රයෝජනවත් අනෙකුත් තොරතුරු ඇතුළත් පත්‍රිකා මහජනයා අතර බෙදා හැරි අතර, තැන්පතු භාර ගැනීමට අවසරලත් ආයතනවල නම් ලැයිස්තු කාර්තුමය වශයෙන් පුවත්පත්වල භාෂා ත්‍රිත්වයෙන්ම පළ කරන ලදී. 2012 වර්ෂය තුළ දී, මෙම මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා මහ බැංකුව විසින් ආසන්න වශයෙන් රුපියල් මිලියන 31.1 වියදමක් දරා ඇත.

**විශේෂ සටහන 11**

## අනවසර මුදල් ව්‍යාපාරයන්හි ප්‍රතිවිපාක

අනවසර මුදල් ව්‍යාපාරයන්හි කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා විධිමත් මූල්‍ය ආයතන විසින් පිරිනමනු ලබන ප්‍රතිලාභයන්ට වඩා ඉතා ඉහළ ප්‍රතිලාභයක් පිරිනැමීම හෝ පොරොන්දුවීම මූලික වශයෙන් යොදාගනු ලබයි. බොහෝ අවස්ථාවල එවන් අනවසර මුදල් ව්‍යාපාර සඳහා ආකර්ශණය වන ආයෝජකයන්ගෙන් වැඩි පිරිසක් එම ආයතනවල නීති විරෝධීභාවය සහ/හෝ ඒවායේ ආයෝජනය කිරීමේ අවදානම ගැන නොදනී. ආකර්ශණීය ප්‍රතිලාභයන්ට අමතරව මෙවන් අනවසර මුදල් ව්‍යාපාරයන්හි ආයෝජන කිරීම සඳහා ආයෝජකයන් පෙළඹීමට හේතු වූ සාධක ලෙස බඳු ගෙවීම් පැහැර හැරීමට ඇති හැකියාව, මුදල් විශුද්ධිකරණයේ යෙදීමට ඇති අවස්ථාව ආදිය හඳුනාගෙන ඇත. මෙම ආයතනවලින් පිරිනමන ඉහළ ප්‍රතිලාභයක් නිසා අයෝජකයන් එකී ආයෝජනයේ ඇති අවදානම භාරගැනීමට හෝ හිතාමතාම එයින් ඇතිවිය හැකි ප්‍රතිවිපාක නොසලකා හැරීමට යොමු වී ඇත. අනවසර මුදල් ව්‍යාපාරයන්හි ව්‍යාපාර ස්වභාවයේ පවතින දෝෂ සහ අස්ථිරභාවය හේතුවෙන් මෙන්ම අරමුදල් කළමනාකරණයේ දුර්වලතාවයන් නිසා මෙම ආයතන අවසානයේ බිඳවැටීමකට ලක්වන අතර ඒවායේ ආයෝජකයන්ට තමන් දුක් මහන්සියෙන් උපයාගත් මුදල්, ඇතැම්විට තම ජීවිත කාලය පුරා කල ඉතිරිකිරීම් අහිමිවීම සිදුවේ. ඒ අතරම, අනවසර මුදල් ව්‍යාපාරයන්හි බිඳවැටීම විධිමත් මූල්‍ය ආයතනයන් කෙරෙහි පවතින මහජන විශ්වාසය පළුදු කිරීමටත්, ඒ තුලින් මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට බලපෑම් එල්ලකිරීමකටත් හේතුවේ.

අනවසර මුදල් ව්‍යාපාරයන්හි නිරතවන කුට පුද්ගලයින් විසින් රටවල් තුල මුදල් ව්‍යාපාර පාලනය කිරීම සඳහා පවතින නීතීන්ට පටහැනිව යමින්, අවසරයකින් තොරව ප්‍රචාරන කටයුතු සිදුකිරීමත් තැන්පතු රැස්කිරීමත් සිදුකරනු ලබයි. කඩිනම් හා ඉහල ප්‍රතිලාභ පසුපස අසීමිතව හඹායන ආයෝජකයන් හේතුවෙන් බොහෝ රටවල් අනවසර මුදල් ව්‍යාපාර සම්බන්ධ ගැටළුවට මුහුණ පා සිටී. මෙවන් ආයතනවල දැකිය හැකි ප්‍රධාන ලක්ෂණයක් වන්නේ පවතින තැන්පතු සඳහා ඉහළ ප්‍රතිලාභයන් ගෙවීම සඳහා පසුකාලීනව මෙම තැන්පත් ක්‍රමයට සම්බන්ධවන්නන්ගෙන් ලැබෙන අරමුදල් යොදා ගැනීමයි. බොස්ටන් හි චාල්ස් පොන්සි නැමැත්තා විසින් පවත්වාගෙන යන ලද වංචාකාරී ආයෝජන ක්‍රමය 1920 දී බිඳවැටීමත් සමගම ලොවපුරා මෙවන් ව්‍යාපාර ක්‍රමයන් ''පොන්සි ව්‍යාපාර ක්‍රම'' ලෙස හඳුන්වන ලදී. වර්ෂ 2008 කාලයේ දී වඩා නිර්මාණාත්මක ලෙස පොන්සි ව්‍යාපාර ක්‍රමයක් පවත්වාගෙන යන ලද බර්නාඩ් මැඩොෆ් නැමැත්තා මෑත කාලයේ දී ඒ සම්බන්ධයෙන් වරකරුවකු කරන ලද අතර එම වංචාකාරී ව්‍යාපාරය හේතුවෙන් සිදුවූ පාඩුව ඇමෙරිකානු ඩොලර් මිලියන 64.8 ක් බවට ඇස්තමේන්තු කර ඇත. බිඳවැටුන අනවසර මුදල් ව්‍යාපාරයන් නැවත ස්ථාපනය කිරීම සඳහා මහජන මුදල් යෙදවීම කිසිසේත්ම ආකර්ශණීය හෝ සාධාරණ දෙයක් නොවන අතර එමගින් රජයට ලැබිය යුතු විශාල ආදායමක් අහිමි විය හැක.

අනවසර මුදල් ව්‍යාපාරයන්ට එරෙහිව පියවර ගතහැකිවන ආකාරයේ නීතිමය රාමුවක් ශ්‍රී ලංකාව තුළ නොපැවතීම හේතුවෙන් ලියාපදිංචිවීමකින් තොරව මුදල් ව්‍යාපාරයන්හි නිරතවීම නීතිවිරෝධී බවට පත්කිරීම සඳහා අදාල ප්‍රතිපාදන 1988 අංක 78 දරන මුදල් සමාගම් පනතට ඇතුලත් කරන ලදී. තැන්පතු භාරගැනීම මුදල් ව්‍යාපාරයන්හි මූලික කාර්යයක් වන බැවින්, මුදල් සමාගම් පනතෙහි ''තැන්පතු'' යන්න නියමාකාරයෙන් අර්ථ දක්වා නොතිබීම අවසර නොමැතිව මුදල් ව්‍යාපාරයන්හි නිරතවන බව ඔප්පු කිරීමට යාමේදී ගැටළු මතුකරන්නක් විය. මෙම අඩුපාඩුව ප්‍රයෝජනයට ගනිමින්, අනවසර ලෙස මහජන මුදල් රැස්කරන්නන් / රැස් කරන ආයතන, මුදල් රැස්කිරීම සඳහා එවකට පැවති නීතිරීතිවල ප්‍රතිපාදනයන් මගහැරීමට හැකිවන ආකාරයේ උපකරණ නිර්මාණය කරගෙන තිබිණ. උදාහරණයක් ලෙස ''තැන්පතු'' යන්න වෙනුවට ඇතැම් අනවසර මුදල් රැස්කරන්නන් / රැස් කරන ආයතන විසින් ''පොරොන්දු නෝට්ටු'', ''අරමුදල් කළමනාකරණ ගිවිසුම්'', ''ආයෝජන සහතික'' ආදී විවිධ උපකරණ මහජනයාගෙන් අරමුදල් රැස්කිරීම සඳහා යොදාගෙන තිබිණ. ඇතැම් නීත්‍යානුකූල එහෙත් අපරීක්ෂාකාරී මූල්‍ය ආයතන විසින් ද නියාමන අවශ්‍යතා මගහරිමින් අරමුදල් රැස්කිරීම සඳහා, ආයෝජන හස්තයන් වැනි ඡායා ආයතන යොදාගැනීමක් ද දක්නට ලැබුණි.

මේ අනුව, වර්ෂ 2008/2009 කාලය තුළ සිදුවූ අනවසර ආයතනයන් කිහිපයක බිඳවැටීමත් සමගම, වසර 20 කට පමණ පෙර පනවන ලද මුදල් සමාගම් පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය ශ්‍රී ලංකා මහ බැංකුව හා මූල්‍ය අංශය විසින් විශේෂාකාරයෙන් හඳුනාගන්නා ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස පුද්ගලයන් හා ආයතන විසින් අනවසරයෙන් තැන්පතු භාර ගැනීම් ප්‍රවර්ධනය කිරීමේ කටයුතු ඵලදායී ලෙස මැඩලීම සඳහා අදාළ බලතල වැඩිකරමින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත ක්‍රියාත්මක කරන ලදී. එකී මුදල් ව්‍යාපාර පනත යටතේ පහත සඳහන් නව ප්‍රතිපාදනයන් හඳුන්වාදී ඇත.

අ. අවසර නොමැතිව තැන්පතු භාරගැනීම වරදක් බවට පත් කිරීම.

ආ. අනවසර පුද්ගලයින්/ආයතනයන් විසින් තැන්පතු කැඳවමින් ප්‍රචාරණ කටයුතු සිදුකිරීම තහනම් කිරීම.

ඇ. මාධ්‍ය ආයතන විසින් එවන් දැන්වීම් පලකිරීමට පෙර දැන්වීම පළකරන්නාට ඒ සඳහා අවසර ඇත්ද යන්න සොයා බැලිය යුතු බව.

ඈ. මහ බැංකුවෙන් අවසර නොලත් ආයතන විසින් තම නමේ කොටසක් ලෙස "මුදල්", "මූල්‍යකරණ" හා "මූල්‍ය" යන වචන යොදා ගැනීම තහනම් කිරීම.

ඉ. අනවසර මුදල් ව්‍යාපාරයන්හි මුදල් තැන්පත් කරන්නන් එකී ව්‍යාපාරයන් සඳහා ආධාර හා අනුබල දීම සම්බන්ධයෙන් වරදකරුවකු කල හැකි බව.

ඊ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍ර ලබා ඇති බැංකු හා මූල්‍ය ආයතනවල සේවකයින් විසින්, කිසියම් පුද්ගලයකු/ආයතනයක් විසින් අවසර නොමැතිව තැන්පතු භාරගන්නා බවට සාධාරණ සැකයක් පවතින අවස්ථාවක ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත දැනුම්දිය යුතු බව.

අවසර නොමැතිව මුදල් ව්‍යාපාරයන්හි නිරතවන හෝ තැන්පතු භාරගන්නා බවට සැකකරනු ලබන පුද්ගලයින් හා ආයතනවල කටයුතු සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබයි. එකී දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරනු ලබන වාර්තා මත පදනම්ව, කිසියම් ආයතනයක් අවසර නොමැතිව මුදල් ව්‍යාපාරයන්හි නිරත වන්නේද යන්න මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන අතර, මුදල් ව්‍යාපාර පනත යටතේ එකී ව්‍යාපාරය අන්සතු කරන ලෙස, තැන්පතු ආපසු ගෙවන ලෙස හෝ ආයතනය වසාදමන ලෙස නියෝග කිරීමට මුදල් මණ්ඩලයට හැකිවේ. එමෙන්ම, අවසර නොමැතිව මුදල් ව්‍යාපාරයන්හි නිරත වන පුද්ගලයකු / ආයතනයක් මහාධිකරණය ඉදිරියේ නඩු විභාගයකින් පසුව වරදරකරු බවට පත්වුනහොත් ඒ සඳහා වසර පහකට නොවැඩි සිරදඬුවමක්, රුපියල් මිලියන පහකට නොවැඩි දඩයක් හෝ මේ දෙකටම යටත් කිරීමට මුදල් ව්‍යාපාර පනත යටතේ හැකියාව ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැනටමත් තොරතුරු සැපයීමට අපොහොසත්වූ සහ අවසර නොමැතිව මුදල් ව්‍යාපාරයන්හි නිරතවූ ආයතන කිහිපයකට එරෙහිව මුදල් සමාගම් පනත යටතේ නීතිමය පියවර ගෙන ඇත. ඊට අමතරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඇතැම් ආයතන සඳහා තැන්පතු ආපසු ගෙවන ලෙස නියම කර ඇති අතර එම ආපසු ගෙවීම් නිරීක්ෂණයද කරනු ලැබේ.

අනවසර මුදල් ව්‍යාපාර කටයුතුවල ඇති සංකීර්ණතාවය හේතුවෙන් එකී ආයතනවල පැතිරීම මෙන්ම ඒවායේ කටයුතු මුලිනුපුටා දැමීම අපහසු කාර්යයකි. තම ආයෝජන තීරණයන්හි පවතින අයහපත් ප්‍රතිවිපාක සම්බන්ධයෙන් දැනුවත්ව පවා ඉහළ ප්‍රතිලාභ පසුපස හඹායන්නා වූ මහජන කොටස් නිසා මෙවන් ව්‍යාපාරවල කටයුතු සම්පූර්ණයෙන් නැතිකර දැමීම තවදුරටත් අපහසු වී ඇත. මහජනතාව අනවසර මුදල් ව්‍යාපාරයන්හි ගොදුරු බවට පත්වීමෙන් වළක්වාගැනීම සඳහා මහජනයා අතර මූල්‍ය සාක්ෂරතාවය වර්ධනය කිරීමේ හා මූල්‍ය අන්තර්ග්‍රහනය ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුනාගෙන ඇත. ඒ අනුව, මහජනතාව දැනුවත් කිරීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහජනතාවගෙන් තැන්පතු භාරගැනීම සඳහා බලපත්‍ර ලබා දී ඇති බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතනවල ලැයිස්තු පුවත්පත්වල පළකිරීම සිදුකරනු ලබයි. මෙයට අමතරව, අනවසර මූල්‍ය ව්‍යාපාරයන්හි ආයෝජනය කිරීමේ ආදීනව ඉස්මතුවන ආකාරයේ මහජනයා දැනුවත්කිරීමේ වැඩසටහන් මාලාවක් විවිධ රූපවාහිනී හා ගුවන්විදුලි නාලිකා ඔස්සේ විකාශනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2012 වසරේ දී කටයුතු කරන ලදී.

**අධීක්ෂණ සහ නියාමන සංවර්ධනයන්:** 2012 වර්ෂය තුළ දී අභ්‍යන්තර අවදානම් ශ්‍රේණිගත කිරීමේ ආකෘතියක් සහ පූර්ව අවදානම් හඳුනා ගැනීමේ පද්ධතියක් ක්‍රියාත්මක කරනු ලැබූ අතර, එමගින් වියහැකි අවදානම් හඳුනා ගැනීමට සහ ඒවා වැළැක්වීමේ ක්‍රියාමාර්ග කාලානුරූපීව හඳුනා ගැනීමට හැකි විය. මහ බැංකුව මගින් ස්ථාපනය කරනු ලැබූ අධීක්ෂණ යාන්ත්‍රණය මගින් රට තුළ පවතින ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල ව්‍යාපාර කටයුතු නියාමනයට අවශ්‍ය පියවර ගනිමින් පවතින අතර, මේ සම්බන්ධයෙන් නව ක්ෂුද්‍ර මූල්‍ය පනතක් කෙටුම්පත් කර ඇත. එය 2013 වසර තුළදී නීතිගත කිරීමට අපේක්ෂිතය.

තොරතුරු පද්ධතියට සම්බන්ධ ආරක්ෂණ ප්‍රතිපත්තියට අදාළව පිළිපැදිය යුතු මාර්ගෝපදේශයන් සහ තැන්පතු රැස්කිරීමේදී අදාළවන පොලී අනුපාතවල ඉහළ සීමාවන් සම්බන්ධයෙන් වූ නව විධාන දෙකක් බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත නිකුත් කරන ලදී. තවද, විශේෂිත කලබදු මූල්‍යකරණ සමාගම් අංශය සඳහා විධාන හතරක් නිකුත් කළ අතර, ඒවා අධ්‍යක්ෂවරුන්ගේ හා විධායක කාර්යන්හි නියුතු නිළධාරීන්ගේ යථා යෝග්‍යතාව ඇගයීම හඳුන්වාදීම, ව්‍යවස්ථාපිත ද්‍රවශීල අවශ්‍යතාව ගණනය කිරීමේදී භාවිතාවන අර්ථ දැක්වීම්හි සිදුව ඇති වෙනස්කම්, අවම මූලික ප්‍රාග්ධනය සහ තෝලන අනුපාතය යනාදිය සම්බන්ධයෙන් විය. බැංකු නොවන මූල්‍ය ආයතනයන්හි

සිදුකරන විගණන කාර්යයන් අවශ්‍ය ප්‍රමිතීන්වලට අනුව සිදුකරනු ලැබීම සහතික කිරීම පිණිස එම අංශය සඳහා බාහිර විගණන නිළධාරීන්ගෙන් යුත් මණ්ඩලයක් පත් කරනු ලැබීය. තවද, බැංකු නොවන මූල්‍ය ආයතනයන්හි විගණනයන්හි සම්මත ක්‍රියාපටිපාටියක් පවත්වාගැනීම තහවුරු කිරීම සඳහා තෝරාගත් බාහිර විගණන මඩුල්ලක් වෙත බාහිර විගණනය සඳහා උපදෙස් මාලාවක් නිකුත් කරන ලදී. වසර තුළදී නිකුත් කරන ලද විධාන හා උපදෙස් මාලාවන් මෙම වාර්ෂික වාර්තාවෙයි III කොටසේ දැක්වේ.

### රජයේ සුරැකුම්පත්හි ප්‍රාථමික අලෙවිකරුවන්

ප්‍රාථමික අලෙවිකරු අංශයේ ප්‍රධාන ක්‍රියාකාරිත්ව දර්ශකයන් මගින් පිළිබිඹු කරන ලෙසට, එම අංශයේ කාර්යසාධනයක් දක්නට ලැබිණි. වසරේ මුල් කාර්තු තුන තුළ දී ඵලදා අනුපාතිකයන්ගේ ඉහළ යාම හේතුකොට ගෙන සෘණාත්මක බලපෑම් ඇති වුව ද, 2011 වසරට සාපේක්ෂව 2012 වසර තුළ දී මුළු වත්කම්, මුළු සුරැකුම්පත් කළඹ, ලාභදායිත්වය සහ ප්‍රාග්ධන පදනම යන අංශයන්හි හිතකර වර්ධනයක් වාර්තා කරනු ලැබීය.

**වත්කම් හා වගකීම්:** 2011 වසරේ දී ප්‍රාථමික අලෙවිකරු අංශයේ මුළු වත්කම් හි සිදු වූ සියයට 4.3 ක වර්ධනයට සාපේක්ෂව, 2012 වසර තුළ දී මුළු වත්කම් රුපියල් බිලියන 160.4 ක් දක්වා සියයට 20.8 කින් වර්ධනය විය. වෙළෙඳ, ආයෝජන සහ ප්‍රතිවිකුණුම් වලින් සමන්විත රජයේ සුරැකුම්පත් කළඹ ප්‍රාථමික අලෙවිකරු කර්මාන්තයේ මුළු වත්කම් වලින් සියයට 98.3 ක් විය. සමස්ත කළඹ වර්ධනය වීමට මූලිකවම දායක වූ සාධකය වූයේ, 2011 වසර අග දී රුපියල් බිලියන 22.9 ක් වූ ආයෝජන කළඹ 2012 වසර අග දී රුපියල් බිලියන 50.9 ක් දක්වා සියයට 122 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වීමයි. කෙසේ වෙතත්, 2011 වසරේ අවසානය හා සසඳන කළ 2012 වසර අවසානය වන විට වෙළෙඳ කළඹ සියයට 5.9 කින් පහත වැටී ඇත. 2011 වසර අග දී රුපියල් බිලියන 85.3 ක් හෙවත් මුළු වගකීම් වලින් සියයට 64.2 ක් ව පැවති ප්‍රතිමිලදී ගැනීම් යටතේ වූ ණය රැස් කිරීම්, 2012 වසර අගදී රුපියල් බිලියන 103.6 ක් හෙවත් මුළු වගකීම් වලින් සියයට 65.7 ක් දක්වා වර්ධනය වී ඇත.

**ප්‍රාග්ධනය:** 2012 වසරේ දී ප්‍රාථමික අලෙවිකරු අංශයේ ප්‍රාග්ධන පදනම රුපියල් බිලියන 15.9 දක්වා වර්ධනය විය. කෙසේ වෙතත්, ප්‍රාථමික අලෙවිකරුවන්ගේ මුළු වත්කම්වල ඉහළ යාමත් සමඟ 2011 වසර අවසානයේ දී සියයට 23.3 ක්ව පැවති අවදානම් මත බර තබන ලද ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතය 2012 වසර අවසානයේ දී සියයට 17.9 ක් දක්වා පහත වැටී ඇත. සියළුම ප්‍රාථමික අලෙවිකරුවන් විසින් ඔවුන්ගේ අවදානම් මත බර තබන ලද ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතයන් අවම නියාමන අනුපාතය වූ සියයට 8 ක ප්‍රමාණයට ඉහළින් පවත්වාගෙන යනු ලැබීය. 2012 වසර අවසානයේ දී ප්‍රාථමික අලෙවිකරු අංශයේ ප්‍රාග්ධන තෝලන අනුපාතය 6.5 වාරයක් ලෙස මධ්‍යස්ථ මට්ටමක පවත්වා ගන්නා ලදී. සියළුම ප්‍රාථමික අලෙවිකරුවන් සිය ප්‍රාග්ධන පදනම, අවම නියාමන ප්‍රාග්ධන මට්ටම වූ රුපියල් මිලියන 300 ට ඉහළින් පවත්වා ගැනීමට සමත් වූහ.

**ලාභදායිත්වය** : 2011 වසරේ දී රුපියල් මිලියන 1,513 ක් ව පැවති ප්‍රාථමික අලෙවිකරු අංශයේ ලාභදායිත්වය 2012 වසර තුළ දී රුපියල් මිලියන 2,528 දක්වා ඉහළ ගියේය. හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය (ROE) සහ වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (ROA) පිළිවෙළින්, 2011 දී සියයට 7.7 සිට 2012 දී සියයට 16 දක්වා ද, 2011 දී සියයට 1.1 සිට 2012 දී සියයට 1.9 දක්වා ද සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇත. 2012 වසරේ දී වර්ධනය වූ මෙහෙයුම් ක්‍රියාකාරිත්වයට හේතු වූයේ, 2012 වසරේ අවසාන භාගය වන විට ඵලදා අනුපාතිකයන් පහළ යාම නිසා උපලබ්ධි වූ ප්‍රාග්ධන ප්‍රතිලාභ සහ වෙළෙඳ කළඹ වෙළෙඳපොළ මිල ගණන් මත මිල කිරීමෙන් ඇතිවූ ප්‍රත්‍යාගණන ලාභයන්ය.

**8.11 සංඛ්‍යා සටහන** — **ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ක්‍රියාකාරිත්වය**

රුපියල් මිලියන

| අයිතමය | 2011 (අ) | 2012 (ආ) | වාර්ෂික වර්ධනය (%) 2011 (අ) | වාර්ෂික වර්ධනය (%) 2012 (ආ) |
|---|---|---|---|---|
| මුළු වත්කම් | 132,710 | 160,351 | 4.3 | 20.8 |
| **සමස්ත කළඹ** | **130,750** | **157,669** | **4.6** | **20.6** |
| වෙළෙඳ සුරැකුම් | 88,586 | 83,387 | 19.2 | (5.9) |
| ආයෝජන සුරැකුම් | 22,944 | 50,945 | (37.7) | 122.0 |
| ප්‍රතිවිකුණුම් | 19,221 | 20,202 | 38.6 | 5.1 |
| විකිණීම සඳහා පවතින | - | 3,135 | - | 100.0 |
| හිමිකම් සහ වගකීම් | 132,710 | 160,351 | 4.3 | 20.8 |
| මුළු ප්‍රාග්ධනය | 14,403 | 15,974 | 6.6 | 10.9 |
| ප්‍රතිමිලදී ගැනුම් | 85,259 | 103,609 | 13.2 | 21.5 |
| බදු පෙර ලාභය | 1,513 | 2,528 | (69.2) | 67.1 |
| බදු පසු ලාභය | 1,116 | 2,287 | (75.7) | 105.0 |
| වත්කම් ප්‍රතිලාභ අනුපාතය (%) | 1.1 | 1.9 | (2.7) | 0.8 |
| හිමිකම් ප්‍රතිලාභ අනුපාතය (%) | 7.7 | 16.0 | (26.2) | 8.2 |
| අවදානම් මත බරතැබූ ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතය (%) | 23.3 | 17.9 | 0.8 | (5.4) |
| තෝලන කාලය | 5.9 | 6.5 | 0.3 | 0.6 |
| ගණුදෙනු | 8,951,533 | 10,406,840 | 12.6 | 16.3 |
| ප්‍රාථමික වෙළෙඳපොළ ගණුදෙනු | 1,767,521 | 2,576,323 | 17.2 | 45.8 |
| ද්විතීයික වෙළෙඳපොළ ගණුදෙනු | 7,184,012 | 7,830,517 | 11.5 | 9.0 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## අවදානම් කළමනාකරණය

**වෙළෙඳපොළ අවදානම:** ප්‍රාථමික අලෙවිකරුවන්ගේ මූලික ව්‍යාපාරික කටයුතු රාජ්‍ය සුරැකුම්පත් හා බැඳී පවතින බැවින් ඔවුන් වෙළෙඳපොළ අවදානමට නිරාවරණය වීම මධ්‍යස්ථ තත්ත්වයක පවතී. පොලී අනුපාතිකයන්ගේ හානිකර වෙනස්වීම් අවශෝෂණය කර ගැනීම සඳහා එක් එක් ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ප්‍රාග්ධන හැකියාව මැනීමට භාවිතා කරනු ලබන ආතති පරීක්ෂාව මගින් පිළිබිඹු වූයේ, 2012 වසර අවසානයේ දී පැවති වෙළෙඳපොළ පොලී අනුපාතිකය පාදකාංක 100 කින් ඉහළ ගිය ද සියළුම ප්‍රාථමික අලෙවිකරුවන්ට අවම නියාමන ප්‍රාග්ධන අවශ්‍යතාවය සහ අවම නියාමන අවදානම මත බර තබන ලද ප්‍රාග්ධන අවශ්‍යතාවය පිළිවෙළින් රුපියල් මිලියන 300 ක සහ සියයට 8 ක ප්‍රමාණයට වඩා ඉහළින් පවත්වා ගත හැකි බවයි.

**ද්‍රවශීලතා අවදානම:** ප්‍රාථමික අලෙවිකරුවන්ගේ මුළු වත්කම්වලින් සියයට 98.3 ක් අනපේක්ෂිත ද්‍රවශීලතා අවශ්‍යතාවයක දී ඇපකරයක් ලෙස තබාගෙන මුදල් ලබාගත හැකි ඉතා ඉහළ ද්‍රවශීලතාවයකින් යුතු රජයේ සුරැකුම්පත්වලින් සමන්විත නිසා ඔවුන්ගේ ද්‍රවශීලතා අවදානම අඩුය. තවද, කිසියම් අනපේක්‍ෂිත ද්‍රවශීලතා අවශ්‍යතාවයක් ඇති වුවහොත් භාවිතා කිරීමට අරමුදල් සපයා ගැනීම සඳහා ඇති කරගත් විකල්ප ක්‍රියාමාර්ගයන් ද ප්‍රාථමික අලෙවිකරුවන් සතු වේ.

## වෙළෙඳපොළ සහභාගීත්වය

**වසර තුළ පවත්වන ලද භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිවලදී බැංකු ප්‍රාථමික අලෙවි ඒකකයන් සියයට 64.2 ක ඵලදායී සහභාගීත්වයක් වාර්තා කරන ලදී.** කෙසේ වෙතත්, ඊට සාපේක්ෂව 2012 වසර තුළ දී ස්වාධීන 'බැංකු ප්‍රාථමික අලෙවිකරු සමාගම්' සහ 'බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරු සමාගම්' යන දෙවර්ගයේම ඵලදායී සහභාගිත්වය පිළිවෙළින් සියයට 23.7 ක් සහ සියයට 11.2 ක් වැනි පහළ මට්ටමක පැවතිණි. ඒ අතර, භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික වෙන්දේසි සඳහා ප්‍රධාන ආයකත්වය ලබාදී තිබුණේ සමස්ත නිකුතුවෙන් සියයට 78.5 ක් සඳහා ආයක වූ සේවක අර්ථසාධක අරමුදලය (EPF). 2011 වසරට සාපේක්ෂව රාජ්‍ය සුරැකුම්පත්හි ද්විතීයික වෙළෙඳපොළ ගණුදෙනු මෙම වසර තුළ දී සියයට 9 කින් වර්ධනය විය. මුළු ද්විතීයික වෙළෙඳපොළ ගණුදෙනු ප්‍රමාණයෙන් සියයට 79.8 ක් ප්‍රතිවිකුණුම් ගණුදෙනු විය.

## ඒකක භාර

**ඒකක භාර අංශය සමස්ත වත්කම් සහ ශුද්ධ වත්කම් වටිනාකම යන අංශයන්ගෙන් පෙන්නුම් කරන ලෙසට, 2012 වසර තුළ දී වර්ධනයක් වාර්තා කරනු ලැබීය.** 2012 වසර අවසානය වන විට ඒකක භාර කළමනාකරණ සමාගම් 11 ක් මගින් පාලනය කරනු ලබන ඒකක භාර 37 ක් (නව ඒකක භාර 12 ක් ඇතුළුව) මෙහෙයුම් කටයුතු වල යෙදුණි. ඒ අතරින් ඒකක භාර සමාගම් 35 ක් විවෘත අරමුදල් වූ අතර, ඒකක භාර සමාගම් 2 ක් සංවෘත අරමුදල් වූයේය. මෙම අරමුදල්වල ආයෝජන ස්වභාවය අනුව ද, ඒකක භාර වර්ගීකරණය කළ හැක. ඒ අනුව, ආදායම් අරමුදල් 7 ක් ද, මුදල් වෙළෙඳපොළ අරමුදල් 6 ක් ද, වර්ධන අරමුදල් 6 ක් ද, කොටස් අරමුදල් 4 ක් ද, සමබර අරමුදල් 4 ක් ද සහ ගිල්ට් එජ් (gilt edged) අරමුදල් 4 ක් ද පැවතියේය. ඊට අමතරව, සාරියා (Sharia), මූලික හිමිකම් නිකුතු (IPOs) සංචාරක සහ මූල්‍ය යනාදී විශේෂිත අංශයන්ගෙන් යුතු අරමුදල් 6 ක් පැවතියේය. එක් සංවෘත අරමුදලක් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කර ඇත.

**2012 දෙසැම්බර් අවසානයට ඒකක භාර අංශයේ ශුද්ධ වත්කම් වටිනාකම රුපියල් බිලියන 30.9 ක් දක්වා සියයට 37 කින් වර්ධනය වූ අතර, එම අගය 2011 දෙසැම්බර් අවසානයට රුපියල් බිලියන 22.5 ක් වූයේය.** වසර තුළ අලුතින් අරමුදල් 12 ක් මෙම අංශයට එකතු වුව ද, වසරේ මුල් භාගයේදී කොටස් වෙළෙඳපොළ මිල ගණන් අඛණ්ඩ පහළයාම මගින් කොටස්වල සැලකිය යුතු ලෙස ආයෝජන සිදුකල අරමුදල් සඳහා කිසියම් බලපෑමක් සිදුවිය. කෙසේ වෙතත්, බොහොමයක් අරමුදල් ඒවායේ ආයෝජන කළඹ මනාලෙස කළමනාකරණය සහ විවිධාංගීකරණය කිරීම නිසා කොළඹ කොටස් වෙළෙඳපොළේ මිල ගණන්වලට වඩා වැඩි කාර්යසාධනයක් පෙන්නුම් කිරීමට හැකිවිය. වසරේ අවසාන කාලය තුළ පොලී අනුපාතික අඩුවීමට පටන්ගන්නා තෙක් ඉහළ යමින් පැවැති පොලී

**8.12 සංඛ්‍යා සටහන — ඒකක භාර අංශයෙහි ක්‍රියාකාරීත්වය**

| අයිතමය | 2011(අ) | 2012(ආ) |
|---|---|---|
| ඒකක භාර සංඛ්‍යාව | 24 | 37 |
| මුළු ඒකක හිමියන්ගේ සංඛ්‍යාව | 23,403 | 27,253 |
| ඒකක නිකුතුන් ගණන (මිලියන) | 1,286 | 2,227 |
| මුළු වත්කම් (රු. මිලියන) | 22,674 | 31,088 |
| ශුද්ධ වත්කම් අගය (රු. මිලියන) | 22,547 | 30,890 |
| කොටස්වල ආයෝජන (රු. මිලියන) | 9,549 | 8,841 |
| මුළු වත්කම්වල ප්‍රතිශතයක් ලෙස (%) | 42 | 29 |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජනය (රු. මිලියන) | 10,975 | 5,919 |
| මුළු වත්කම්වල ප්‍රතිශතයක් ලෙස (%) | 48 | 19 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා ඒකක භාර සංගමය

අනුපාතික හේතුවෙන් සිදු වූ වෙළෙඳපොළ අගය මත ගලපන ලද (mark to market) පාඩු නිසා රජයේ සුරැකුම්පත්වල සිදුකළ ආයෝජන සඳහා ද පාඩු ඇති විය. ආයෝජන කළඹ තුළ කොටස් සහ රජයේ සුරැකුම්පත්වල (භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ ප්‍රතිවිකුණුම්) සිදුකළ ආයෝජන පිළිවෙළින් සියයට 28.5 ක් සහ සියයට 19.1 දක්වා පහළ ගියේය. 2011 දෙසැම්බර් අවසානයට එම අගයන් පිළිවෙළින් සියයට 42.3 ක් සහ සියයට 48.6 ක් විය. අනෙකුත් ආයෝජනයන්ගේ ප්‍රමාණය (වාණිජ පත්‍ර, ණයකර, භාරකාර සහතික සහ බැංකු තැන්පතු) සියයට 52.4 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

**ඒකක භාරවල සිදු වූ ධනාත්මක සංවර්ධනය වූයේ, ඒකක භාර හිමියන්ගේ සංඛ්‍යාව සහ ඒකක නිකුතුවල සිදු වූ වැඩි වීමයි.** සමස්ත ඒකක භාර හිමියන්ගේ සංඛ්‍යාව සහ ඒකක නිකුතු සංඛ්‍යාව 2012 දෙසැම්බර් අවසානයට පිළිවෙළින් 27,253 ක් සහ මිලියන 2,227 ක් විය. 2011 අවසානයට එම අගයන් පිළිවෙළින් 23,403 ක් සහ මිලියන 1,286 ක් විය. කොටස් වෙළෙඳපොළෙහි ආයෝජන පදනම පුළුල් කිරීමට සහ විවිධ වර්ගයේ අරමුදල් හඳුන්වා දීම උනන්දු කිරීම පිණිස සෑම මහජන නිකුතුවකින්ම සියයට 10 ක කොටස් ප්‍රමාණයක් ඒකක භාර සඳහා වෙන්කළ යුතු බවට අදාළ නියෝගයක් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබීය. තව ද, ඒකක භාර වල විදේශ ආයෝජනය සිදුකිරීම සඳහා අවකාශය ලබාදෙන ලදී. ඒකක භාර නීති සංග්‍රහයට වෙළෙඳ හුවමාරු අරමුදල් (Exchange Traded Funds) සඳහා වන නියාමන රාමුවක් ඇතුලත් කිරීම, ශ්‍රී ලංකාව තුළ එවැනි අරමුදල් හඳුන්වා දීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සඳහා මඟ පාදනු ඇත.

## රක්ෂණ සමාගම්

**රක්ෂණ අංශයේ සිදු වූ වත්කම් වල ප්‍රසාරණය, හිතකර ලාභදායිත්වය, ප්‍රමාණවත් නුබුන්වත් ආන්තික සහ ශක්තිමත් වූ නියාමන රාමුව යනාදිය 2012 වසරේ දී රක්ෂණ අංශයේ ශක්තිමත් බව වැඩිදියුණු කරනු ලැබීය.** මූල්‍ය අංශයේ වත්කම්වලින් සියයට 3 ක් පමණ වන රක්ෂණ අංශය, 2012 වසර තුළ දී සියයට 16 කින් වර්ධනය විය. 2012 දෙසැම්බර් අවසානයට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය යටතේ ලියාපදිංචි වූ රක්ෂණ සමාගම් 22 ක් පැවතියේය. මේවායින් සමාගම් 21 ක් වර්තමානයේ දී ව්‍යාපාරික කටයුතුවල නිරත වේ. එසේම, රක්ෂණ සමාගම් 12 ක් දිගු කාලීන සහ සාමාන්‍ය රක්ෂණ දෙවර්ගයේම ව්‍යාපාරික කටයුතුවල නියැළෙන සංයුක්ත රක්ෂණ සමාගම් වලින් සමන්විත වන අතර, සමාගම් 6 ක් සාමාන්‍ය රක්ෂණ කටයුතු පමණක් ද, සමාගම් 3 ක් දිගුකාලීන රක්ෂණ කටයුතු පමණක් ද සිදුකරනු ලැබේ. මීට අමතරව, රක්ෂණ සමාගම් 7 ක් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කර ඇත.

**ව්‍යාපාර වර්ධනය :** රක්ෂණ අංශයේ සමස්ත වත්කම්, වාරික ආදායම, ආයෝජන ආදායම සහ ලාභදායීත්වය 2012 වසරේ දී ප්‍රසාරණය විය. රක්ෂණ අංශයේ සමස්ත වත්කම් පදනම 2012 දී සියයට 16 කින් වර්ධනය වූ අතර, 2011 දී එය සියයට 20 කින් වර්ධනය විය. රක්ෂණ අංශයේ සමස්ත දළ ලියාහළ වාරික ආදායම 2012 වසර තුළ දී සියයට 11 කින් රුපියල් බිලියන 89 ක් දක්වා වර්ධනය වූ නමුත්, 2011 දී එය සියයට 17 ක් වූ තරමක් ඉහළ අගයකින් වැඩි වූයේය. එහෙත්, ආර්ථික ක්‍රියාකාරකම්වල අඛණ්ඩව සිදු වූ ප්‍රසාරණය හමුවේ රක්ෂණ අංශයේ වර්ධන නම්‍යතාව අඛණ්ඩව සිදු වුණි. ආනයනය කරනු ලබන මෝටර් රථ සඳහා ඉහළ දැමූ ආනයන බදු මගින් මෝටර් රථ රක්ෂණ අංශය කෙරෙහි ආන්තික බලපෑමක් පමණක් සිදුකරනු ලැබීය. එමනිසා, සාමාන්‍ය රක්ෂණ අංශය අඛණ්ඩව රක්ෂණ සමාගම් අංශයේ වර්ධන ක්‍රියාවලියේ මූලික නියමුවා ලෙස කටයුතු කළ අතර, දිගුකාලීන රක්ෂණ අංශය ද ප්‍රසාරණය වනු ලැබීය. සාමාන්‍ය රක්ෂණ අංශයේ දළ ලියාහළ වාරික ආදායම 2012 වසර තුළ දී සියයට 14 කින් රුපියල් බිලියන 52 ක්

**8.13 සංඛ්‍යා සටහන — රක්ෂණ අංශයෙහි ක්‍රියාකාරිත්වය**

රුපියල් බිලියන

| අයිතමය | | 2011 (අ) | 2012 (ආ) |
|---|---|---|---|
| මුළු වත්කම් | | 265.8 | 307.0 |
| රජයේ සුරැකුම්පත් | | 109.4 | 126.7 |
| සාමාන්‍ය කොටස් | | 40.2 | 35.0 |
| අතැති මුදල් හා තැන්පතු | | 35.4 | 47.2 |
| මුළු ආදායම | | 103.1 | 115.3 |
| වාරික ආදායම | | 80.4 | 89.2 |
| අයෝජන ආදායම | | 22.7 | 26.1 |
| බදු පෙර ලාභය | | 12.3 | 13.4 |
| නුබුන්වත් ආන්තික අනුපාතය | | | |
| | - ජීවිත රක්ෂණය | 6.5 | 7.4 |
| | - සාමාන්‍ය රක්ෂණය | 2.0 | 2.5 |
| රඳවා ගැනීම් අනුපාතය (%) | | | |
| | - ජීවිත රක්ෂණය | 96.2 | 96.2 |
| | - සාමාන්‍ය රක්ෂණය | 78.9 | 79.1 |
| හිමිකම් අනුපාතය (%) | - ජීවිත රක්ෂණය | 31.0 | 37.2 |
| | - සාමාන්‍ය රක්ෂණය | 63.8 | 59.9 |
| ඒකාබද්ධ මෙහෙයුම් අනුපාතය (%) | | | |
| | - ජීවිත රක්ෂණය | 74.2 | 81.6 |
| | - සාමාන්‍ය රක්ෂණය | 101.8 | 105.0 |
| වත්කම් මත ප්‍රතිලාභය (%) | | | |
| | - ජීවිත රක්ෂණය | 5.0 | 3.4 |
| | - සාමාන්‍ය රක්ෂණය | 5.1 | 6.7 |
| හිමිකම් මත ප්‍රතිලාභය (%) | | | |
| | - සාමාන්‍ය රක්ෂණය | 10.2 | 12.3 |
| ප්‍රාරක්ෂණ අනුපාතය (%) | | | |
| | - සාමාන්‍ය රක්ෂණය | 19.1 | 16.2 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය

දක්වා වර්ධනය විය. 2011 වසරේ දී එය සියයට 21 ක ඉහළ වර්ධනයක් වාර්තා කරනු ලැබීය. දිගු කාලීන රක්ෂණය සඳහා වූ දළ ලියාපදිංචි වාරික ආදායම 2012 දී සමස්ත දළ ලියාපදිංචි වාරික වටිනාකමින් සියයට 42 ක් වූ අතර, එය සියයට 7 කින් රුපියල් බිලියන 37 ක් දක්වා වර්ධනය විය. 2011 වසර සමඟ සැසැඳීමේ දී එය එම වසර තුළ සියයට 13 කින් ඉහළ ගියේය.

**ඉපයීම්:** 2012 වසරේ දී රක්ෂණ සමාගම් වල සමස්ත ආයෝජන ආදායම සියයට 15 කින් රුපියල් බිලියන 26 ක් දක්වා වර්ධනය වූ අතර, 2011 වසරේ දී එය සියයට 37 ක පහළ යෑමක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, කොටස් වෙළෙඳපොළේ පැවති අඩු කාර්ය සාධනය සහ ඵලදා අනුපාතිකයන්ගේ ඉහළ යෑම හේතුවෙන් ඇති වූ වෙළෙඳපොළ අගය මත ගණනය කරනු ලැබූ පාඩු (Re-pricing loses) යනාදිය රක්ෂණ අංශයේ ආයෝජන ආදායම සඳහා ඍණාත්මක බලපෑමක් සිදුකරන ලදී. රක්ෂණ සමාගම්වල සමස්ත ආදායම (ආයෝජන ආදායම සහ වාරික ආදායම) 2012 වසර තුළ දී සියයට 12 කින් රුපියල් බිලියන 115 ක් දක්වා වර්ධනය වූ අතර, 2011 වසර තුළ දී එය ආන්තික ලෙස පහළ ගියේය. රක්ෂණ අංශයේ බදුවලට පෙර ලාභය සියයට 8.4 කින් රුපියල් බිලියන 13.4 දක්වා 2012 වසරේ දී වර්ධනය වූ අතර, එය 2011 වසරේ දී රුපියල් බිලියන 12.3 ක් වූයේය. සාමාන්‍ය රක්ෂණ අංශයේ වාර්තා වූ ඉහළ ලාභ මේ සඳහා හේතු විය. සමාගම් බොහෝමයක් සමස්ත ලාභ වාර්තා කරනු ලැබීය. එහි ප්‍රතිඵලයක් ලෙස, සාමාන්‍ය රක්ෂණය සඳහා වූ හිමිකම මත ප්‍රතිලාභ (ROE) සහ වත්කම් මත ප්‍රතිලාභ (ROA) අනුපාත, 2012 වසර තුළ පිළිවෙළින් සියයට 12.3 ක් සහ සියයට 6.7 ක් දක්වා 2011 වසරේ දී වූ පිළිවෙළින් සියයට 10.2 ක සහ සියයට 5.1 ක ප්‍රමාණයේ සිට ඉහළ ගියේය. කෙසේ වෙතත්, දිගුකාලීන රක්ෂණය සඳහා වන වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය 2011 වසරේ දී පැවැති සියයට 5.0 සිට 2012 දී සියයට 3.4 දක්වා පහළ ගියේය. තවද, ඉහළ හිමිකම් ගෙවීම් සහ කළමනාකරණ පිරිවැය පිළිබිඹු කරමින් සාමාන්‍ය රක්ෂණය සඳහා වන ප්‍රාරක්ෂණ ලාභ 2012 දී සියයට 4 කින් රුපියල් බිලියන 6.2 ක් දක්වා පහළ ගියේය.

**ප්‍රාග්ධනය සහ ආයෝජනය:** සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී රක්ෂණ සමාගම් විසින් සිය ශක්තිමත් බව පවත්වාගෙන යනු ලැබීය. සියළුම රක්ෂණ සමාගම් 2012 වසර අවසානයට ව්‍යවස්ථාපිත නුබුන්වත් ආන්තික අවශ්‍යතාවයන් සපුරා ගන්නා ලදී. සාමාන්‍ය රක්ෂණය සඳහා වන නුබුන්වත් ආන්තික අනුපාතය 2012 අවසානයට 2.5 වාරයක් දක්වා ඉහළ ගිය අතර එම අනුපාතය 2011 අවසානයට 2.0 වාරයක් වූයේය. දිගුකාලීන රක්ෂණය සඳහා වන නුබුන්වත් ආන්තික අනුපාතය 2012 අවසානයට 7.4 වාරයක් ලෙස ඉහළ ගිය අතර, 2011 අවසානයට එම අනුපාතය 6.5 වාරයක් වූයේය. රක්ෂණ සමාගම් විසින් සිය තාක්ෂණික සංචිත වලින් අවම වශයෙන් සියයට 20 ක් සහ දිගුකාලීන රක්ෂණ අරමුදල්වලින් සියයට 30 ක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළ යුතුය. ඒ අනුව, රක්ෂණ සමාගම් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළ ප්‍රමාණය, සමස්ත වත්කම්වල ප්‍රතිශතයක් ලෙස ගත්කළ සියයට 41 ක් වූයේය. කොටස්වල සිදුකළ ආයෝජනයේ ප්‍රමාණය 2011 අවසානයේ දී වූ සියයට 15 සමඟ සංසන්දනය කරන විට 2012 අවසානයට එය සියයට 11 ක් වූයේය. සාංගමික ණය සුරැකුම්පත්වල සිදුකළ වූ ආයෝජනය රක්ෂණ සමාගම්වල සමස්ත වත්කම්වල ප්‍රතිශතයක් ලෙස ගත්කළ එය 2012 අවසානය වන විට සියයට 5.5 ක් වූයේය. 2011 වසර අවසානයේ දී මෙම ප්‍රමාණය සියයට 5.4 ක් විය.

**අධීක්ෂණ සහ නියාමන සංවර්ධනයන්:** වසර තුළ දී රක්ෂණ කර්මාන්තයට අදාළ නියාමන රාමුව, අධීක්ෂණය සහ නීති බලාත්මක කිරීම යනාදිය ශක්තිමත් කරනු ලැබීය. රක්ෂණ අංශයේ සෑම ව්‍යාපාරික අංශයක් සඳහාම නුබුන්වත් ආන්තිකයක් පවත්වා ගැනීමේ අවශ්‍යතාව නියම කරමින්, 2012 වසර තුළ දී ද නුබුන්වත් ආන්තික නීතිය තවදුරටත් සංශෝධනය කරන ලදී. සාමාන්‍ය සහ දිගුකාලීන යන රක්ෂණ දෙවර්ගයම සඳහා නුබුන්වත් ආන්තිකය තීරණය කිරීමේ දී සලකා බැලෙන පිළිගතහැකි වත්කම් හෙවත් සුරැකුම් මත පදනම් වූ වත්කම් (Admissible Assets) වලට අදාළව මෙම සංශෝධනය සිදුවිය. රක්ෂණ සමාගම්වල අවදානම් ව්‍යුහය තක්සේරු කිරීමට සහ ක්‍රියාත්මක වෙමින් පවතින අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ගයන් සහතික කිරීමට, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් එතැන් හා දුරස්ථ පරීක්ෂණයන් සිදුකිරීම අධීක්ෂණය කිරීම අඛණ්ඩව කරනු ලැබීය. රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත සඳහා 2011 ජනවාරි මාසයේ දී සංශෝධන සිදුකරනු ලැබූ අතර, 2015-2016 වන විට ඒවා ක්‍රියාත්මක කර අවසන් කිරීමට නියමිතය. දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර දෙකම එක් ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යන රක්ෂණ සමාගම් 2015 වන විට වෙන වෙනම සමාගම් දෙකක් ලෙස ඒවා පවත්වාගෙන යෑම අවශ්‍ය වනු ඇත. එක් අංශයක අලාභ අනෙක් අංශයේ ලාභ වලින් පියවීම වැලැක්වීම පිණිස වත්කම් සහ වගකීම් හඳුනාගැනීමට පහසුවන අයුරින් රක්ෂණ සමාගම් සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා මෙම නියාමන අවශ්‍යතාවයන් මූලිකවම හඳුන්වා දෙන ලදී. 2016 වන විට සියලුම රක්ෂණ සමාගම් කොටස් හුවමාරුවේ

ලැයිස්තුගත වීම අනිවාර්ය කරනු ලැබ ඇත. කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත වීම රක්ෂණ සමාගම්වල පාරදෘශ්‍ය බව සහතික කරනු ලබන අතර, අවශ්‍ය විටකදී ප්‍රාග්ධනය රැස්කිරීම සඳහා කොටස් වෙළෙඳපොළට ප්‍රවේශ වීමට රක්ෂණ සමාගම්වලට මෙමගින් හැකියාව ලැබෙනු ඇත. රක්ෂණ සමාගම් අවදානම් පදනම් වූ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා රාමුවකට යොමු කිරීමට හැකිවන පරිදි අවශ්‍ය කටයුතු ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් ආරම්භ කර ඇත.

### විශ්‍රාම අරමුදල්

**මූල්‍ය අංශයේ වත්කම්වලින් සියයට 16 කට හිමිකම් කියන විශ්‍රාම අරමුදල් අංශය සේවක අර්ථසාධක අරමුදල විසින් බලපවත්වන අතර එම අරමුදල විශ්‍රාම අරමුදල් අංශයේ වත්කම් වලින් සියයට 79 ක් පමණ අගයක් ගනු ලැබීය.** සේවක අර්ථසාධක අරමුදල රාජ්‍ය කළමණාකාරීත්වයෙන් යුතු අරමුදලක් වන අතර, සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සහ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල ලෙස තවත් රාජ්‍ය කළමණාකාරීත්වයෙන් යුතු අරමුදල් 2 ක් ඇත. ඊට අමතරව, පෞද්ගලික කළමණාකාරිත්වයෙන් යුතු අනුමත විශ්‍රාම සහ අර්ථසාධක අරමුදල් 171 ක් පමණ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වනු ඇත.

**මූල්‍ය අංශයේ සමස්ත වත්කම්වලින් සියයට 13 ක් පමණ වන සේවක අර්ථසාධක අරමුදල, එහි වටිනාකම අනුව ගත්කළ 2012 වසරේ දී රුපියල් ට්‍රිලියන 1 ක් ඉක්මවා ගියේය.** 2012 දෙසැම්බර් අවසානයට සේවක අර්ථසාධක අරමුදලේ සමස්ත වත්කම් වටිනාකම රුපියල් බිලියන 1,144 ක් සහ ක්‍රියාකාරී සාමාජික ගිණුම් සංඛ්‍යාව මිලියන 2.25 ක් වූයේය. කලින් සේවායෝජකයන් යටතේ සාමාජිකව පැවත වර්තමානයේ ද දායකත්ව මුදල් නොගෙවන සාමාජික ගිණුම් මිලියන 12 ක් පැවතියේය. සේවක අර්ථසාධක අරමුදල කම්කරු කොමසාරිස් විසින් පරිපාලනය කරනු ලබන අතර, අරමුදලේ කළමණාකාරීත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වගකියනු ලැබේ. 2012 වසර තුළ දී සමස්ත දායකත්වය සියයට 13.4 කින් රුපියල් බිලියන 70.2 ක් දක්වා වර්ධනය වූ අතර, දායක මුදල් ප්‍රතිගෙවීම් රුපියල් බිලියන 48.7 ක් දක්වා සියයට 3 කින් ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස රුපියල් බිලියන 21.5 ක ශුද්ධ දායක මුදල් ලැබීමක් (දායක මුදල්වලින් ප්‍රතිගෙවුම් අඩුකල පසු) වාර්තා කරනු ලැබීය. 2012 දෙසැම්බර් අවසානයට සේවක අර්ථසාධක අරමුදලේ සමස්ත වත්කම් වටිනාකම සියයට 12.4 කින් රුපියල් බිලියන 1,144 ක් දක්වා වර්ධනය වූ අතර, සමස්ත ආයෝජන කළඹේ වටිනාකම රුපියල් බිලියන 1,105.5 ක් විය. 2012 දෙසැම්බර් මාසයෙන් අවසන් වන වසරක කාලය තුළ මෙම අරමුදලේ ආයෝජන ආදායම රුපියල් බිලියන 121.4 ක් වූයේය. 2012 දෙසැම්බර් අවසානයට රජයේ සුරැකුම්පත්වල සියයට 91.5 ක් ද කොටස්වල සියයට 5.4 ක් ද සාංගමික ණයකරවල සියයට 1 ක් ද සහ ප්‍රතිවිකුණුම්වලින් ආයෝජන කළඹ සමන්විත විය. සාමාජික ගිණුම්ශේෂ සඳහා වූ සඵල පොලී අනුපාතිකය මෙම වසර සඳහා සියයට 11.5 ක් විය. මේ සමඟ සැසඳීමේදී, කොටස් වෙළෙඳපොළෙහි සියයට 29 ක් සහ රජයේ සුරැකුම්පත්වල සියයට 18 ක ආයෝජනයන්ගෙන් සමන්විත වූ ඒකක භාර අංශය, 2012 වසර සඳහා සියයට 1.96 ක බර තබන ලද සාමාන්‍ය පොලී අනුපාතයක් ලබා දෙන ලදී. අරමුදලේ ඵලදායී කළමණාකාරීත්වය සඳහා සහ සාමාජිකයන් හට තවදුරටත් ප්‍රතිලාභ ලබාදීම සඳහා සේවක අර්ථසාධක අරමුදල් පනත 2012 පෙබරවාරි මාසයේ දී සංශෝධනය කරන ලදී.

**මූල්‍ය අංශයේ වත්කම්වලින් සියයට 1.8 ක් පමණ වන සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලද, එහි දළ ආදායමේ සුළු ඍණ වර්ධනයක් පැවතිය ද ඉහළ ගිය ශුද්ධ දායකත්ව අරමුදල් ලැබීම් සමඟ එහි වත්කම් පදනමෙහි වර්ධනයක් පෙන්නුම් කරනු ලැබීය.** සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලේ පවතින වත්කම් වටිනාකම 2012 දෙසැම්බර් අවසානයට රුපියල් බිලියන 158 ක් වූ අතර, සාමාජික ගිණුම් මිලියන 9.8 ක් පැවතියේය. එයින් මිලියන 2.2 ක් පමණ ක්‍රියාකාරී ගිණුම් විය. 2012 දෙසැම්බර් අවසානයට සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට සේවා යෝජකයන්

**8.14 සංඛ්‍යා සටහන — සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලේ ක්‍රියාකාරිත්වය**

| අයිතමය | සේවක අර්ථසාධක අරමුදල | | සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල | |
|---|---|---|---|---|
| | 2011 (අ) | 2012 (ආ) | 2011 (අ) | 2012 (ආ) |
| මුළු වත්කම් (රු. බිලියන) | 1,018.0 | 1,144.0 | 142.4 | 158.4 |
| මුළු නොපියවූ සාමාජික ගිණුම් ශේෂය (රු. බිලියන) | 986.0 | 1,125.0 | 135.5 | 139.6 |
| සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන) | 14.0 | 14.3 | 9.8 | 9.8 |
| ක්‍රියාකාරී සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන) | 2.2 | 2.3 | 2.2 | 2.2 |
| දායකවන්නා වූ සේවාදායකයින් සංඛ්‍යාව | 64,562 | 68,771 | 67,041 | 70,194 |
| මුළු දායකත්වය (රු. බිලියන) | 61.9 | 70.2 | 11.1 | 12.7 |
| මුළු ප්‍රතිගෙවුම් (රු. බිලියන) | 47.3 | 48.7 | 7.8 | 8.6 |
| මුළු ආයෝජන කළඹ (රු. බිලියන) | 985.6 | 1,105.5 | 134.1 | 149.8 |
| එයින් රජයේ සුරැකුම්පත් (%) | 91.3 | 93.9 | 90.1 | 89.5 |
| දළ ආදායම (රු. බිලියන) | 116.0 | 121.4 | 15.5 | 13.9 |
| බෙදාහැරීම සඳහා පවත්නා ලාභය (රු. බිලියන) | 107.5 | 111.8 | 12.5 | 14.1 |
| ආයෝජනය මත ප්‍රතිලාභය (%) | 12.4 | 11.6 | 8.9 | 8.4 |
| සාමාජික ගිණුම් සඳහා ගෙවූ පොලී අනුපාතිකය (%) | 11.5 | 11.5 | 10.0 | 10.0 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව
සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල

70,194 ක් දායකත්වය සපයනු ලැබීය. 2012 වසර තුළ දී මෙම අරමුදලේ සිදු වූ සමස්ත දායකත්ව මුදල් ලැබීම් සහ ප්‍රතිලාභ ගෙවීම් පිළිවෙළින් රුපියල් බිලියන 12.7 ක් සහ රුපියල් බිලියන 8.6 ක් දක්වා ඉහළ ගියේය. 2011 වසරේ දී එම අගයන් පිළිවෙළින් රුපියල් බිලියන 11.1 ක් සහ රුපියල් බිලියන 7.8 ක් වූයේය. 2012 වසර තුළ දී ශුද්ධ දායකත්ව ලැබීම් රුපියල් බිලියන 4.2 ක් දක්වා සියයට 25.4 කින් වැඩි විය. 2012 දෙසැම්බර් අවසානයට සේවා නියුකතයන්ගේ භාරකාර අරමුදලේ සමස්ත වත්කම් රුපියල් බිලියන 158.4 දක්වා සියයට 11.3 කින් වර්ධනය විය. නොපිය වූ සාමාජික ගිණුම් ශේෂය 2012 වසර සඳහා රුපියල් බිලියන 139.6 ක් වූ අතර, 2011 වසර සඳහා එය රුපියල් බිලියන 135.5 ක් වූයේය. සේවක අර්ථසාධක අරමුදල මෙන්ම සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලේ ද සමස්ත ආයෝජන කළඹෙන් වැඩි ප්‍රමාණයක් රජයේ සුරැකුම්පත්වලින් සමන්විත වූ අතර එය සියයට 89.5 ක් විය. කොටස්වල සහ සාංගමික ණයකරවල සිදුකළ ආයෝජනය පිළිවෙළින් සියයට 4.7 ක් සහ සියයට 0.6 ක් විය. කෙසේ වෙතත්, වසර තුළ දී අරමුදලෙහි දළ ආදායම රුපියල් බිලියන 13.9 ක් දක්වා සියයට 10 කින් අඩුවිය.

**විශ්‍රාම අරමුදල් දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණය කරනු ලබන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල සතුව 2012 දෙසැම්බර් අවසානයට ක්‍රියාකාරී සාමාජිකයින් 239,134 ක් පැවතුණි.** 2012 දෙසැම්බර් අවසානයට රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ සමස්ත වත්කම් වටිනාකම රුපියල් බිලියන 32.9 ක් දක්වා සියයට 10 කින් වර්ධනය විය. 2012 වසර තුළ සමස්ත දායකත්ව මුදල් ගෙවීම් සහ ප්‍රතිගෙවුම් පිළිවෙළින් රුපියල් මිලියන 1,557 ක් සහ රුපියල් මිලියන 484 ක් වූයේය. 2012 දෙසැම්බර් අවසානයට රජයේ සුරැකුම්පත්වල ආයෝජනය සියයට 88 ක් විය.

**කම්කරු දෙපාර්තමේන්තුව මගින් අධීක්ෂණය කරන පෞද්ගලිකව කළමනාකරණය කරනු ලබනු සාමාජිකයන් 167,096 කින් සමන්විත අනුමත අර්ථසාධක හා විශ්‍රාම මුදල් 171 ක් පවතී.** 2012 දෙසැම්බර් අවසානයට අනුමත අර්ථසාධක හා විශ්‍රාම අරමුදලේ සමස්ත වත්කම් රුපියල් බිලියන 110 ක් දක්වා සියයට 4.2 කින් අඩුවිය.

## 8.3 මූල්‍ය වෙළෙඳපොළවල ක්‍රියාකාරිත්වය

### මුදල් වෙළෙඳපොළ

**2012 වසරේ දී වෙළෙඳපොළ ද්‍රවශීලතා මට්ටම ක්‍රමයෙන් අඩු වූ අතර, වසරේ අවසාන භාගය වන විට තුලිත මට්ටමක් කරා ළඟා විය.** වසරේ පළමු මාස හය තුළ සාමාන්‍ය වශයෙන් රුපියල් බිලියන 12 ක අතිරික්තයක් වාර්තා කළ වෙළෙඳපොළ අතිරික්ත ද්‍රවශීලතාව, 2012 ජූලි මාසය අවසානයේ දී ස්වෛරීත්ව බැඳුම්කර වලින් කොටසක් රුපියල් බවට හැරවීමත් සමග රුපියල් බිලියන 58.9 ක් වූ වසරේ ඉහළම අතිරික්ත ද්‍රවශීලතාව දක්වා වැඩි විය. කාලීන ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි සහ මහ බැංකු ආයෝජන කළඹෙන් භාණ්ඩාගාර බිල්පත් අලෙවි කිරීම යනාදී වෙළෙඳපොළ ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීමට යොදාගත් උපායයන් වෙළෙඳපොළ අතිරික්ත ද්‍රවශීලතාව අඩු කිරීමට උපකාරී විය. සැප්තැම්බර් මාසය වන විට, වෙළෙඳපොළ ද්‍රවශීලතා හිඟයක් ඇති විය. ඉන් පසුව, කෙසේ වුවත්, මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම් කවුළුව තුළින් මුදල් වෙළෙඳපොළ තුළට ද්‍රවශීලතාව එකතු කළ ද, මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් විශ්‍රාම ගැන්වීම, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තුළ සිදු කරන ලද විදේශ ණය ආපසු ගෙවීම් සහ විදේශ විනිමය හුවමාරු ගණුදෙනුවල ප්‍රතිඵලයක් වශයෙන් 2012 වසර අවසන් වන විට වෙළෙඳපොළ තුළ ද්‍රවශීලතා තුලිත තත්වයක් ඇති විය.

**ජූලි මාසය අවසානය තෙක් වැඩි වූ ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ පොලී අනුපාත, වාණිජ බැංකු මත පනවන ලද ණය සීමා ඇතුළත් දැඩි මූල්‍ය ප්‍රතිපත්ති උපාය මාර්ගයන්ට ප්‍රතිචාර දක්වමින් දෙසැම්බර් මාසයේදී මුදල් ප්‍රතිපත්ති ලිහිල් කරන තුරු බොහෝ දුරට ස්ථායීව පැවතුණි.** වර්ෂයේ මුල් මාස 7 තුළ, බර තබන ලද සාමාන්‍ය ඒක්ෂණ පොලී අනුපාතිකය පදනම් අංක 150 කින් පමණ ඉහළ ගිය අතර, ජූලි මස 18 වන දින එහි උපරිමය වූ සියයට 10.71 ක අගයට ළඟා විය. මේ අතර, මූල්‍ය ප්‍රතිපත්තිය දැඩි කිරීමට ප්‍රතිචාර දක්වමින් ණය වර්ධනය මන්දගාමී විය. මෙකී ප්‍රවණතා පිළිබිඹු කරමින්, බර තබන ලද සාමාන්‍ය ඒක්ෂණ පොලී අනුපාතිකය, අගොස්තු මාසයේ පමණ සිට, දෙසැම්බර් මාසයේ මූල්‍ය ප්‍රතිපත්ති ලිහිල් කරන තුරු සියයට 10.55 ක අගය ආසන්නයේ ගැවසෙමින් ස්ථාවරව පැවතුණි. ප්‍රතිපත්ති පොලී අනුපාතික පහළ දැමීමත්, වසර අග ණය

**8.15 සංඛ්‍යා සටහන** **මුදල් වෙළෙඳපොළ ගණුදෙනු**

| වෙළෙඳපොළ | පරිමාව (රුපියල් බිලියන) | | පොලී/ඵලදා අනුපාතිකය | |
|---|---|---|---|---|
| | 2011 | 2012 | 2011 | 2012 |
| ඒක්ෂණ මුදල් | 2,434 | 3,179 | 7.57-9.40 | 8.53-10.71 |
| අන්තර් බැංකු ප්‍රතිමිලදී ගැණුම් | 1,099 | 1,431 | 6.88-8.34 | 7.91-9.68 |
| මහ බැංකු ප්‍රතිමිලදී ගැණුම් | 14,490 | 2,740 | 7.00-7.58 | 7.00-9.46 |
| මහ බැංකු ප්‍රති විකුණුම් | 141 | 793 | 7.25-9.00 | 7.94-9.75 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සීමාව අවසාන වීමේ අපේක්ෂාවන් සමඟම, බර තබන ලද සාමාන්‍ය ඒක්ෂණ පොලී අනුපාතිකය 2012 වසර අවසාන වන විට, පදනම් අංක 70 කින් පමණ සියයට 9.83 දක්වා තියුණු ලෙස පහළ ගියේය. බඳු ගැලපූ පසු, බර තබන ලද සාමාන්‍ය ඒක්ෂණ පොලී අනුපාතිකයෙහි, වර්ෂයේ මුල් මාස 7 තුළ දක්නට ලැබුණු විචලනය, පසුකාලීනව අඩුවෙමින් පැවතීම දක්නට ලැබුණු අතර, එම අනුපාතිකය දෙසැම්බර් මස මැද පමණ වනතෙක් ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාවට ආසන්නව ස්ථායිව පැවතුණි. එසේ වුවද, බදු ගැලපූ පසු බර තබන ලද සාමාන්‍ය ඒක්ෂණ පොලී අනුපාතිකය වසර පුරාම ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව තුළ පැවතුණි.

### දේශීය විදේශීය විනිමය වෙළෙඳපොළ

**2012 පෙබරවාරි මාසයේ මැද සිට විදේශ විනිමය අනුපාතිකය වඩාත් නම්‍යශීලීව නිර්ණය වීමට ඉඩ හරින ලදී.** වර්ෂයේ පළමු භාගය තුළ දී එ.ජ ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වුව ද, දෙවන භාගය තුළ දී මෙම ප්‍රවනතාවය යම් ප්‍රමාණයකින් ප්‍රතිවර්තනය විය. 2011 වර්ෂය අවසානයේ වූ රුපියල් 113.90 සිට 2012 වර්ෂය අවසානයට රුපියල් 127.16 දක්වා ශ්‍රී ලංකා රුපියල සියයට 10.43 ක සමස්ත අවප්‍රමාණයකට වසර තුළ දී ලක්විය. විදුලි මුදල් හුවමාරු සඳහා වාණිජ බැංකු යොදා ගන්නා ලද එ.ජ ඩොලරයේ ගැනුම් සහ විකුණුම් අනුපාතයෙහි සාමාන්‍ය ද සැලකිය යුතු ලෙස වැඩි වීමක් පෙන්නුම් කළ අතර, එය පිළිවෙළින් රුපියල් 125.56 සහ රුපියල් 128.82 ලෙස 2012 වසරේ දී වාර්තා විණි. 2011 වසර හා සැසඳීමේ දී මෙම අගයන් පිළිවෙළින් රුපියල් 113.01 ක් සහ රුපියල් 114.88 ක් විය. ඒ අයුරින්ම අනෙකුත් ප්‍රධාන මුදල් ඒකකයන්ට සාපේක්ෂව ද ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය විය. ඒ අනුව, බ්‍රිතාන්‍ය පවුම, යූරෝ, ජපාන යෙන් සහ ඉන්දියානු රුපියලට එරෙහිව ශ්‍රී ලංකා රුපියලෙහි අවප්‍රමාණය වීම් පිළිවෙළින් සියයට 14.61 ක්, සියයට 12.31 ක්, සියයට 0.88 ක් සහ සියයට 7.45 ක් ලෙස වාර්තා විය.

**2012 වර්ෂයේ දී සිදු වූ ගෝලීය ආර්ථික පසුබෑම සහ ආර්ථිකය වඩාත් තිරසාර මාවතක ගමන් කරවීමෙහි ලා 2012 වසරේ දී ගන්නා ලද ප්‍රතිපත්තීන් හේතුවෙන් දේශීය විදේශීය විනිමය වෙළෙඳපොළෙහි ගණුදෙනු පරිමාව කෙරෙහි බලපෑමක් ඇති විය.** ගෝලීය ආර්ථිකයේ පසුබෑම හේතුවෙන් ඇති වූ අපනයනවල අඩු වීම සහ ආනයන වියදම් අඩු කිරීම සඳහා ගන්නා ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග යනාදිය වෙළෙඳපොළ ගණුදෙනු පරිමාවෙහි සමස්ත අඩුවීමකට ඉවහල් විය. මේ අනුව, 2012 වසර තුළ දී දේශීය වෙළෙඳපොළෙහි විදේශ විනිමය ගණුදෙනු ප්‍රමාණය එ.ජ ඩොලර් මිලියන 13,420 ක් ලෙස වාර්තා විය. එය 2012 වසරේ දී වූ එ.ජ ඩොලර් මිලියන 16,442 හා සැසඳීමේ දී එ.ජ ඩොලර් මිලියන 3,022 ක හෝ සියයට 18 ක අඩු වීමක් විය. අන්තර් බැංකු විදේශ විනිමය වෙළෙඳපොළෙහි දෛනික සාමාන්‍ය ගණුදෙනු ප්‍රමාණය ද 2011 වසරෙහි වූ එ.ජ ඩොලර් මිලියන 68.5 සිට එ.ජ ඩොලර් මිලියන 55.4 දක්වා 2012 දී පහත වැටුණි.

**විදේශ විනිමය වෙළෙඳපොළ තුළ අවදානම් අවම කිරීමේ අරමුණෙන්, 2012 වර්ෂයේ දී, වාණිජ බැංකුවල විදේශ මුදල් ගණුදෙනු සඳහා වූ දෛනික ශුද්ධ අනාවරණ තත්ත්වය (net open position) 2011 වසරේ වූ එ.ජ ඩොලර් මිලියන 185 සිට එ.ජ ඩොලර් මිලියන 64.7 දක්වා අඩුවන ලෙස සංශෝධනය කරන ලදී.** දේශීය විදේශීය විනිමය වෙළෙඳපොළෙහි අධි උච්චාවචනයන් වැළැක්වීම පිණිස වසරේ පළමු මාස තුන තුළ දී එ.ජ ඩොලර් මිලියන 1,155 ක් විකිණීමට සිදු වුණි. මෙලෙස සිදු වූ වෙළෙඳපොළ උච්චාවචනයන් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වෙනස්වීමට පසුව සමනය වූ අතර, වසරේ ඉතිරි කාලය තුළ දී මහ බැංකුවට වෙළෙඳපොළේ මැදිහත් වීමට වූ අවශ්‍යතාව අඩුවීමට ද හේතු විය. සමස්තයක් ලෙස ගත් විට, මහ බැංකුව වසර තුළ දී දේශීය විදේශීය විනිමය වෙළෙඳපොළෙන් එ.ජ ඩොලර් මිලියන 631 ක් මිල දී ගත් අතර, එ.ජ ඩොලර් මිලියන 1,797 ක් විකුණන ලදී.

### රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ

**ඇඩි මූල්‍ය ප්‍රතිපත්තිය සහ ආයෝජකයින්ගේ අභිමතය, ඵලදා වක්‍රයේ දීර්ඝ කාලීන අන්තයේ සිට කෙටිකාලීන අන්තය දක්වා වෙනස්වීම යනාදිය හේතුවෙන් 2012 වසරේ පළමු කාර්තු දෙක තුළ ප්‍රාථමික වෙළෙඳපොළෙහි භාණ්ඩාගාර බිල්පත්වල ඵලදා අනුපාතිකවල ඉහළ යාමක් දක්නට ලැබුණි.** ඒ අනුව, දින 91, දින 182 සහ දින 364 යනාදී භාණ්ඩාගාර බිල්පත් සඳහා ප්‍රාථමික වෙළෙඳපොළේ බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතික 2012 වසරේ ජුනි මස අග භාගය වන විට පිළිවෙළින් සියයට 11.12, සියයට 12.61 සහ සියයට 12.88 දක්වා පිළිවෙළින් පාදකාංක 244 කින්, පාදකාංක 390 කින් සහ පාදකාංක 357 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කෙසේ වෙතත්, මහ බැංකුව විසින් නිසි කලට ක්‍රියාත්මක කරන ලද උපාය මාර්ග, එනම් වෙළෙඳපොළ වෙත කෙටි කාලීන බිල්පත් නිකුත් කිරීම ක්‍රමයෙන් අඩු කිරීම, භාණ්ඩාගාර බිල්පත්හි සෘජු නිකුතු නතර කිරීම, සාර්ව මූලධර්මවලට අනුකූල ඵලදා අනුපාතිකයන් ලබා දීම තුළින් ප්‍රාථමික වෙළෙඳපොළ තුළ භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය ප්‍රවර්ධනය කිරීම සහ භාණ්ඩාගාර බැඳුම්කරවල විදේශ ආයෝජන දිරිමත්

කිරීම යනාදිය හේතුවෙන් වසරේ තෙවන කාර්තුවේ දී භාණ්ඩාගාර බිල්පත් හි ප්‍රාථමික වෙන්දේසිවල බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතික මන්දගාමී මට්ටමකින් පවත්වා ගත හැකි විය. ඒ අනුව, දින 91 සහ දින 364 භාණ්ඩාගාර බිල්පත් සඳහා බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතිකවල ඉහළ යාම පිළිවෙළින් පාදකාංක 18 කට සහ පාදකාංක 14 කට සීමා කිරීමට හැකි වූ අතර, දින 182 භාණ්ඩාගාර බිල්පත් සම්බන්ධයෙන් එම අනුපාතිකය පාදකාංක 4 කින් අඩු කිරීමට හැකි විය. 2012 වසරේ හතරවන කාර්තුවේ දී භාණ්ඩාගාර බිල්පත් සඳහා බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතිකයන් පහත බැසීම ආරම්භ වූ අතර, 2012.12.12 දින ප්‍රතිපත්තිමය පොලී අනුපාතයන් අඩු කිරීම හේතුවෙන් මෙම ඵලදා අනුපාතිකයන් පහළ බැසීම වඩාත් තීව්‍ර විය. ඒ අනුව, ප්‍රාථමික වෙන්දේසියේ දී දින 91, දින 182 සහ දින 364 යනාදී භාණ්ඩාගාර බිල්පත් සඳහා වන බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතිකයන් පිළිවෙළින් පාදකාංක 130 කින්, පාදකාංක 125 කින් සහ පාදකාංක 133 කින් පහත වැටුණු අතර දෙසැම්බර් මස අවසානය වන විට ඒවා සියයට 10.00, සහ සියයට 11.32 සහ සියයට 11.69 අගයන්වල පැවතියේය.

**වසරේ පළමු කාර්තු දෙක තුළ දී භාණ්ඩාගාර බිල්පත්හි බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතයන්ගේ ඉහළ යාමට අනුකූලව ද්විතීයික වෙළෙඳපොළ භාණ්ඩාගාර බැඳුම්කරවල ඵලදා අනුපාතිකයන්හි ඉහළ යාමේ නැඹුරුතාවයක් දක්නට ලැබිණ.** කෙසේ වෙතත්, 2012 ජූලි මස අග භාගය ආරම්භ වන විට සැලකිය යුතු මට්ටමකින් භාණ්ඩාගාර බැඳුම්කර සඳහා විදේශීය ඉල්ලුම ඉහළ යාමත්, ප්‍රාථමික වෙළෙඳපොළ තුළ භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව සීමාසහිත වීමත්, මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තිය ලිහිල් වීමත් හේතුවෙන් 2012 සිව්වන කාර්තුවේ දී භාණ්ඩාගාර බැඳුම්කරවල ඵලදා අනුපාතික සැලකිය යුතු මට්ටමකින් පහත වැටුණි.

| 8.16 සංඛ්‍යා සටහන | රජයේ සුරැකුම්පත්වල වෙළෙඳපොළ ඵලදා අනුපාතික | | | |
|---|---|---|---|---|
| | | | | වසරකදී සියයට |
| අයිතමය | ප්‍රාථමික වෙළෙඳපොළ | | ද්විතියික වෙළෙඳපොළ | |
| | 2011 | 2012 | 2011 | 2012 |
| භාණ්ඩාගාර බිල්පත් | | | | |
| දින 91 | 6.97-8.68 | 8.67-12.19 | 6.97-8.63 | 8.63-12.06 |
| දින 182 | 7.05-8.71 | 8.71-13.12 | 7.05-8.75 | 8.71-13.10 |
| දින 364 | 7.25-9.31 | 9.30-13.16 | 7.23-9.29 | 9.28-13.34 |
| භාණ්ඩාගාර බැඳුම්කර | | | | |
| වසර 2 | 7.77 | 9.45-13.62 | 7.55-9.56 | 9.37-13.77 |
| වසර 3 | 7.99 | 10.20-13.50 | 7.97-9.87 | 9.58-13.93 |
| වසර 4 | 8.20-8.30 | 9.55-14.10 | 8.18-9.99 | 9.69-14.16 |
| වසර 5 | 8.50-8.60 | 10.75-14.15 | 8.38-10.15 | 9.78-14.35 |
| වසර 6 | 8.50-8.85 | 9.75-14.25 | 8.48-10.18 | 9.81-14.36 |
| වසර 10 | 9.00-9.15 | 10.25-14.75 | 9.01-11.13 | 9.93-14.63 |
| වසර 15 | - | - | 8.76-10.75 | 10.07-14.59 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සමස්ත රාජ්‍ය ණය කළඹෙහි ප්‍රතිමූල්‍යකරණ අවදානම මැනීම සඳහා භාවිතා කරන ප්‍රධාන දර්ශකයක් වන භාණ්ඩාගාර බැඳුම්කර පරිණත වීම සඳහා ඇති සාමාන්‍ය කාලය (The average time to maturity) 2012 වසර තුළ තවදුරටත් වැඩිදියුණු විය.** 2012 වසර තුළ දී, වසර 20 ක පරිණත කාලයක් සහිත භාණ්ඩාගාර බැඳුම්කරයක් සියයට 11.00 ක ඵලදා අනුපාතයක් සහිතව නිකුත් කිරීම මගින් ඵලදා වක්‍රය වසර 20 දක්වා දීර්ඝ කරනු ලැබිණි. තවද, භාණ්ඩාගාර බිල්පත් නිකුතුව සීමා කිරීමත්, අනුමත කරන ලද සීමාව තුළ විදේශීය ඉල්ලුම විචක්ෂණශීලීව කළමනාකරණය කිරීමත් හේතුවෙන්, භාණ්ඩාගාර බැඳුම්කර පරිණත වීම සඳහා ඇති සාමාන්‍ය කාලය 2011 දී පැවති වසර 5.65 සිට 2012 දී වසර 6.86 දක්වා පුළුල් කිරීම මගින් සමස්ත රාජ්‍ය ණය කළඹෙහි ප්‍රතිමූල්‍යකරණ අවදානම මැනීම සඳහා භාවිතා කරන ප්‍රධානම දර්ශකය, 2011 වසර අවසානයේ දී පැවති වසර 2.35 සිට 2012 අවසාන වන විට වසර 3.23 දක්වා ඉහළ අගයකට පත් කරගත හැකි විය.

### සාංගමික ණය සුරැකුම්පත් වෙළෙඳපොළ

#### වාණිජ පත්‍ර

**2012 වසර තුළ දී වාණිජ පත්‍ර වෙළෙඳපොළ සාපේක්ෂව බොහෝ දුරට ක්‍රියාකාරී මට්ටමක පැවතුණි.** බැංකුවල සහාය ඇතිව නිකුත් කරනු ලැබූ වාණිජ පත්‍රවල සමස්ත වටිනාකම 2011 දී වූ රුපියල් බිලියන 13.6 ට සාපේක්ෂව 2012 දී රුපියල් බිලියන 36.9 ක් විය. බැංකු මත පැනවූ ණය සීමාවන් සහ වසරේ වැඩි කාලයක් තුළ බැංකු සහ මූල්‍ය සමාගම් විසින් අයකරනු ලැබූ ඉහළ ණය දීමේ අනුපාතයන් මෙම ඉහළ යාමට හේතු විය. කෙසේ වුවද, 2011 වසරේ දී සියයට 8.26 - 12.80 ක පරාසයක පැවැති වාණිජ පත්‍ර සඳහා වූ පොලී අනුපාතික 2012 වසරේ දී 11.25 - 22.00 දක්වා වර්ධනය විය. මාස 3 ක් හෝ ඊට අඩු කල්පිරීමේ කාලයක් සහිත වාණිජ පත්‍රවල දායකත්වය, සමස්ත වාණිජ පත්‍ර වටිනාකමින් සියයට 87.5 ක් වූ අතර, මාස 6 ක සහ මාස 12 ක කල්පිරීමේ කාලයක් සහිත වාණිජ පත්‍රවල දායකත්වය පිළිවෙළින් සියයට 2.1 සහ සියයට 10.4 ක් වූයේය. වාණිජ පත්‍රවල නොපියූ සමස්ත වටිනාකම, 2011 දෙසැම්බර් අවසානයට පැවති රුපියල් බිලියන 7.7 ට සාපේක්ෂව 2012 දෙසැම්බර් අවසානයට රුපියල් බිලියන 10.6 ක් විය.


**සාංගමික බැඳුම්කර**

බැංකු ආයතන 2 ක් මගින්, වසර 5 ක පරිණත කාලයක් සහිත සාංගමික ණයකර නවයක් ලැයිස්තුගත කිරීමත් සමග, 2012 වසර තුළ දී සාංගමික බැඳුම්කර වෙළෙඳපොළේ ක්‍රියාකාරකම් වර්ධනය වුණි. ස්ථාවර පොලී අනුපාත සහ පාවෙන පොලී අනුපාත යටතේ නිකුත්කළ මෙම ණයකර මගින් රුපියල් බිලියන 12.5 ක මුදලක් රැස්කර ගැනීමට හැකිවිය. ස්ථාවර පොලී අනුපාත යටතේ වාර්ෂික පදනම යටතේ ගෙවන ණයකර 6 ක් සියයට 10.50-16.50 පරාසයේ පැවති අතර, ණයකර 3 ක්, පාවෙන විනිමය අනුපාතය යටතේ නිකුත් කෙරිණි. ඊට අමතරව, 2012 වසර තුළ දී ණයකර 3 ක් හඳුන්වාදීම් ලෙස වෙළෙඳපොළට නිකුත් කරනු ලැබීය. කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ණය සුරැකුම්පත් වෙළෙඳ පද්ධතියේ (DEX) ලැයිස්තුගත කරන ලද ණයකරවල වෙළෙඳ පිරිවැටුම 2011 පැවති රුපියල් මිලියන 2,694 සමග සැසඳීමේ දී, 2012 දී රුපියල් මිලියන 75.7 දක්වා සැලකිය යුතු ලෙස අඩු විය. සාංගමික බැඳුම්කර වෙළෙඳපොළේ වේගවත් සංවර්ධනයක් උදෙසා 2013 අයවැය යෝජනා මගින් සාංගමික ණය සුරැකුම්පත් පොලී ආදායම මත වූ ආදායම් බදු, 2013 ජනවාරි මාසයේ සිට ඉවත් කරන ලදී.

**කොටස් වෙළෙඳපොළ**

කොටස් වෙළෙඳපොළ 2009 සහ 2010 වසර තුළ පෙන්නුම් කරනු ලැබූ ශීඝ්‍ර ඉහළ යාමෙන් පසුව 2012 වසර තුළ අඩු කාර්ය සාධනයක් පවත්වාගෙන ගියද විශේෂයෙන්ම 2012 දෙවන භාගයේදී එය ධනාත්මක ප්‍රතිසාධනයක් පෙන්නුම් කරනු ලැබීය. සමස්ත කොටස් මිල දර්ශකය සියයට 7 කින් පමණක් පහළ ගිය අතර, එය පෙර වසරේ වූ සියයට 8.5 ක අඩුවීම හා සසඳන කළ හිතකර තත්ත්වයක් වේ. වැඩි කොටස් ගණුදෙනු ප්‍රමාණයක් සහිත සමාගම් 25 කින් සැදුම්ලත් මිලංක මිල දර්ශකය 2012 දෙසැම්බර් අවසාන වන විට සියයට 2 කින් පහළ ගියේය. 2013 ජනවාරි පළමු වැනි දින සිට මිලංක මිල දර්ශකය වෙනුවට එස් ඇන්ඩ් පී එස් එල් 20 (S&P SL 20) නමු වූ නව දර්ශකයක් හඳුන්වා දෙනු ලැබීය. පාරදෘශ්‍ය සහ නිර්ණායක මත පදනම් වූ ක්‍රමවේදයක් සඳහා ආයෝජකයන්ගේ ඉල්ලුම ළඟා කරගැනීමට 2012 ජුනි 27 වනදා හඳුන්වා දුන් මෙම එස් ඇන්ඩ් පී එස් එල් 20 දර්ශකය 2012 දෙසැම්බර් අවසාන වන විට සියයට 8 කින් ඉහළ ගියේය. මූර්ත අගය අනුව ගත් කළ සාපේක්ෂව ඉහළ අගයක පැවති ස්ථාවර ආදායම් සුරැකුම්පත් මත වූ ඵලදා අනුපාත, විනිමය අනුපාතයේ වූ විචලතාව සහ වෙළෙඳපොළේ පැවති ඌන ද්‍රවශීලතාව මෙන්ම ගෝලීය මූල්‍ය වෙළෙඳපොළ තුළ වැඩි දියුණු වූ සහ එහි

**8.12 රූප සටහන**
**කොළඹ කොටස් වෙළඳපොළේ සමස්ත කොටස් මිල දර්ශකය, මිලංක මිල දර්ශකය සහ වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය**




පැතිරුණු බලපෑම් මූලික ලෙස කොටස් වෙළෙඳපොළේ මෙම පහළ යන උපනතියට දායක විය. කොටස් වෙළෙඳපොළේ මෙම ක්‍රියාකාරකම්වලට බලපෑ තවත් සාධකයක් වූයේ, විශේෂයෙන්ම වසර මුල දී කොටස් තැරැව්කරුවන්ගේ ණය මත පැන වූ සීමාවන් ය.

කෙසේ වෙතත්, පහළ යමින් පැවැති ආනයන මධ්‍යයෙහි එ.ජ. ඩොලරයට එරෙහිව රුපියල සිදු වූ ක්‍රමිකව ප්‍රතිප්‍රමාණය වීම, මහ බැංකුව විසින් ප්‍රතිපත්ති පොලී අනුපාතිකවල සිදුකළ සංශෝධනය, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් තැරැව්කාර ණය සඳහා වෙළෙඳාම් මත පනවා තිබූ රෙගුලාසි ලිහිල් කිරීම සහ කොටස් වෙළෙඳපොළේ අඛණ්ඩව සිදු වූ විදේශීය ආයෝජන ගලාඒම් යනාදිය නිසා වසරේ දෙවන භාගය තුළ දී වෙළෙඳපොළ යථාතත්ත්වයට පත්වීමේ කිසියම් ඉහළ යන උපනතියක් පෙන්නුම් කළේය. 2012 වසර තුළ දී ප්‍රධාන මිල දර්ශකවල පහළයාමට දායක වෙමින්, උප අංශයන්ගේ එක් අංශයක් හැර (පාන වර්ග, ආහාර හා දුම්කොළ) අනෙකුත් සියළුම උප අංශයවල මිල දර්ශක පහළ ගියේය. වෙළෙඳපොළ මිල ඉපැයුම් අනුපාතය වසරේ අවම අගය වූ 11.4, 2012 මැයි මාසයේ දී වාර්තා කළ අතර, අනතුරුව 2012 දෙසැම්බර් අවසානය වන විට 15.9 දක්වා ඉහළ යාමක් පෙන්නුම් කරන ලදී. 2011 වසරේ මිල ඉපැයුම් අනුපාතය 15.8 ක් වූයේය. කොළඹ කොටස් හුවමාරුවේ වර්තමාන වෙළෙඳපොළ මිල ඉපැයුම් අනුපාතය වෙළෙඳපොළ අධි තක්සේරු වීමක් පිළිබිඹු නොකරමින් ඉහළ ද්‍රවශීලතාව, සමාගම්වල ඇතිවිය හැකි ඉපයීම් පිළිබඳව පුළුල්ව සලකා බැලීමක් පිළිබිඹු කරනු ලැබීය. කෙසේ වෙතත්,

කලාපයේ අනෙකුත් රටවල් සමඟ සංසන්දනය කිරීමේ දී, වර්තමාන දේශීය වෙළෙඳපොළ මිල ඉපැයුම් අනුපාතය, කලාපීය මිල ඉපැයුම් අනුපාතවල සාමාන්‍ය අගයට සමාන මට්ටමක පවතී.

**කොටස් මිල ගණන්වල වෙනස්වීමට අනුගාමීව වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය අඩු වූ නමුත් මූලික මහජන අර්පණ සහ හඳුන්වාදීම් මාර්ගයෙන් නව ලැයිස්තුගත කිරීම් කිහිපයක් සිදු කරනු ලැබිණ.** මූලික මහජන අර්පණ මාර්ගයෙන් වූ නව ලැයිස්තුගතවීම් හයක්, හඳුන්වාදීම් මාර්ගයෙන් සිදු වූ නව ලැයිස්තු ගත වීම් දොළහක් සහ හිමිකම් නිකුතූන් දහ නවයක් කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත වුව ද, දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 29 කට පමණ සමාන වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය 2011 වසරේ අවසානයට පැවති රුපියල් ට්‍රිලියන 2.21 සිට 2012 දෙසැම්බර් අවසානයට රුපියල් ට්‍රිලියන 2.17 ක් දක්වා සියයට 2 කින් (නැතහොත් බිලියන 46 කින්) ආන්තික ලෙස පහළ ගියේය. වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය අනුව විශාලතම උප අංශ පහ වනුයේ බැංකු, මූල්‍ය සහ රක්ෂණ (සියයට 22.6), විවිධාංගීකරණ (සියයට 21.9), ආහාර, පානීය සහ දුම්කොළ (සියයට 18.4), හොටල් සහ සංචාරක (සියයට 7.3) සහ විදුලි සංදේශ (සියයට 6.8) යනාදී උප අංශයන්ය. තවද, විශාලතම සමාගම් පහ සහ සමාගම් දහය වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණයෙන් පිළිවෙළින් සියයට 27.4 ක් සහ සියයට 42.1 ක් වූයේය. 2012 දෙසැම්බර් අවසානය වන විට කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත වූ සමාගම් සංඛ්‍යාව 287 ක් දක්වා සමාගම් 15 කින් ඉහළ ගියේය. කොළඹ කොටස් හුවමාරුව 2011 වසරේ දී වාර්තා කළ රුපියල් බිලියන 546 ක කොටස් පිරිවැටුමට සාපේක්ෂව රුපියල් බිලියන 214 ක අඩු කොටස් පිරිවැටුමක් 2012 වසරේ දී වාර්තා කරනු ලැබීය. මෙම පිරිවැටුම පහළ යෑම සඳහා කොටස් මිළ ගණන් පහළ යෑම අඩ වශයෙන් හේතු විය. දෛනික සාමාන්‍ය පිරිවැටුම ද, 2012 වසරේ දී රුපියල් මිලියන 884 ක් දක්වා පහළ ගිය අතර, එය 2011 වසරේ දී රුපියල් මිලියන 2,286 ක් වූයේය. දේශීය ආයෝජකයන් කොටස් හුවමාරුවේ මුළු පිරිවැටුමෙන් සියයට 75 කට ද, ගණුදෙනු වලින් සියයට 97 කට ද, සහ ගණුදෙනු වූ කොටස් වලින් සියයට 86 කට ද දායක විය. ඒවායින්, දේශීය සමාගම් සහ කුඩා ප්‍රමාණයේ ආයෝජකයින් පිළිවෙළින් සියයට 36 ක් සහ සියයට 30 ක් ලෙස සමස්ත පිරිවැටුමට දායක විය.

**8.17 සංඛ්‍යා සටහන** **කොටස් වෙළෙඳපොළේ ක්‍රියාකාරිත්වය**

| | 2011 | 2012 |
|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය (අ) | 6,074.4 | 5,643.0 |
| වාර්ෂික වෙනස (%) | (8.5) | (7.0) |
| මිලංක මිල දර්ශකය (අ) | 5,229.2 | 5,119.1 |
| වාර්ෂික වෙනස (%) | (25.9) | (2.0) |
| එස් ඇන්ඩ් පී එස් එල් 20 දර්ශකය (අ) | - | 3,085 |
| ජුනි සිට දෙසැම්බර් අවසානය දක්වා වෙනස (%) | - | 8.0 |
| වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන) (අ) | 2,213.9 | 2,167.6 |
| ද.ජා.නි.යේ ප්‍රතිශතයක් ලෙස (%) | 33.9 | 28.9 |
| වෙළෙඳපොළ මිල ඉපැයීම් අනුපාතිකය (අ) | 15.8 | 15.9 |
| වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය හා පිරිවැටුම අතර අනුපාතය (%) | 24.7 | 9.9 |
| දෛනික සාමාන්‍ය පිරිවැටුම (රු. මිලියන) | 2,285.6 | 884.0 |
| වෙළෙඳාම් කළ කොටස් වටිනාකම (රු. බිලියන) | 546.3 | 213.8 |
| වෙළෙඳාම් කළ කොටස් ගණන (මිලියන) | 24,543 | 9,691 |
| ලැයිස්තුගත කළ සමාගම් ගණන | 272 | 287 |
| කොටස් හඳුන්වාදීම් (ආ) | 16 | 11 |
| ආරම්භක මහජන අර්පණයන්/විකිණීම සඳහා වන අර්පණයන් සංඛ්‍යාව (ආ) | 13 | 6 |
| හිමිකම් නිකුතූන් ගණන | 22 | 19 |
| හිමිකම් නිකුතූන්ගෙන් සහ මූලික මහජන නිකුතූන්ගෙන් රැස්කරගත් අරමුදල් ප්‍රමාණය (රු. බිලියන) | 45.1 | 13.3 |


මූලය: කොළඹ කොටස් හුවමාරුව

(අ) වසර අවසානයට

(ආ) සමාගම් ලැයිස්තුගත කිරීමෙහි ක්‍රම 3ක් ඇත. මහජන නිකුතුවක් අවශ්‍ය නොවන හඳුන්වා දීමක්, දැනටමත් තිබෙන කොටස් නිකුත් කිරීම සඳහා මහජනයාට කරන අර්පණයක් සහ මහජනයාට දායකවීම සඳහා නව කොටස් නිකුත් කිරීමක් වශයෙනි.

**කොටස් වෙළෙඳපොළ තුළට සිදු වූ ශුද්ධ විදේශීය ගලාඒම් පසුගිය දෙවර්ෂයේ වාර්තා වූ ශුද්ධ විදේශීය ගලායෑම්වලට එරෙහිව මෙම වර්ෂයේදී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.** 2012 වසර තුළ දී සමස්ත විදේශ මිලදී ගැනුම් රුපියල් බිලියන 72.7 ක් වූ අතර, සමස්ත විදේශ විකුණුම් රුපියල් බිලියන 34.0 ක් වූයේය. එහි ප්‍රතිඵලයක් ලෙස රුපියල් බිලියන 38.7 ක (එ. ජ. ඩොලර් මිලියන 304 ක) ශුද්ධ විදේශීය ගලා ඒමක් මෙම වර්ෂයේදී වාර්තා කළ අතර එය 2011 වසරේ දී රුපියල් බිලියන 19 ක (එ.ජ. ඩොලර් මිලියන 167 ක) ශුද්ධ විදේශ ගලායාමක් වූයේය. ජෝන් කීල්ස් සමාගම, ලංකා දුම්කොළ සමාගම, නෙස්ට්ලේ ලංකා සමාගම, චෙව්රෝන් ලුබ්රිකන්ට් සමාගම, කොමර්ෂල් බැංකුව, සම්පත් බැංකුව හා ඩයලොග් ඇක්ෂියාටා යනාදී සමාගම් කොටස්වල ආයෝජනය කෙරෙහි විදේශීය ආයතනික ආයෝජකයන්ගේ කැමැත්ත ප්‍රධාන වශයෙන් දක්නට ලැබුණි. සමස්ත විදේශීය මිලදී ගැනීම්වලින් සියයට 95.8 කට හිමිකම් කියමින් විදේශීය සමාගම් එහි මූලික වූ අතර, විදේශීය පුද්ගලයින් එයින් සියයට 4.2 කට පමණ හිමිකමක් දැක්වූයේය. කොළඹ කොටස් හුවමාරුවේ මූලික හිමිකම් නිකුතූන් 6 ක් මගින් රුපියල් බිලියන 1.7 ක අරමුදලක් රැස්කරගත් අතර, හිමිකම් නිකුතූන් 19 ක් මගින් රුපියල් බිලියන 11.7 ක් රැස්කර ගන්නා ලදී.

**8.13 රූප සටහන කොළඹ කොටස් වෙළෙඳපොලේ පිරිවැටුම සහ විදේශීය සහභාගීත්වය**




කොටස් වෙළෙඳපොලේ කටයුතු ක්‍රමවත්ව සහ සරල ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා 2012 වසර තුළ දී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පියවර කිහිපයක් හඳුන්වා දෙනු ලැබීය. කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත වීමට අපේක්ෂාවෙන් සිටින නව පොදු සමාගම් සඳහා කොන්දේසි කිහිපයක් හඳුන්වා දෙන ලදී. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කුඩා ප්‍රමාණයේ ආයෝජකයන්ගේ ද්‍රවශීලතා සංරෝධක අවම කිරීම සහ වෙළෙඳපොළ විචලතාව අවම කිරීම පිණිස කොටස් තැරැව්කරුවන්ගේ ණය ප්‍රසාරණය මත පනවා තිබූ සීමා තවදුරටත් ලිහිල් කරන ලදී. ඊට අමතරව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් 2012 අප්‍රේල් මාසයේ දී විචලනය වන සුරැකුම් මත වෙළෙඳපොළ දින 5 ක් සඳහා පනවා තිබූ සියයට 10 මිල පරාස නීතිය ද ඉවත් කරන ලදී. වෙළෙඳපොළ පියවීම් අවදානම අවම කිරීම සඳහා ද ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී.

යෝජිත අවම නිදහස් චලිත අවශ්‍යතාවන් ක්‍රියාත්මක කිරීම මගින් වෙළෙඳපොළ ද්‍රවශීලතාව හා පිරිවැටුම ඉහළ නංවා ගැනීමට අපේක්ෂිතය. මධ්‍යම ප්‍රතිපාර්ශවීය නිශ්කාශන සමාගම පිහිටුවීම සඳහා වන මූලික කටයුතු සිදුවෙමින් පවතින අතර, එය ගෙවීමට එරෙහිව පැවරීමේ යාන්ත්‍රණයකට මාරු වීමට බලය පවරමින් පියවීම් අවදානම අවම කිරීම සඳහා දායක වනු ඇත.

ආයෝජන විශ්වාසය ඉහළ නැංවීමට, පද්ධතිමය අවදානම් වැළැක්වීමට සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අදාළ සියලුම ප්‍රධාන පාර්ශවකරුවන් සම්බන්ධ කරගනිමින් සිදුකරන උපදේශනාත්මක ක්‍රියාවලියක් දියත්කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ඉදිරි වසර 3 ඇතුළත ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් කාර්යන්/ව්‍යාපෘතීන් 10 ක් හඳුන්වා දී ඇත: අ) සුරැකුම්පත් කොමිෂම පිළිබඳ අන්තර්ජාතික සංවිධානයේ ප්‍රමිතීන් වලට අනුව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම කඩිනම් කිරීම, ආ) රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ලැයිස්තුගත කිරීම් තවදුරටත් දිරිමත් කිරීම, ඇ) නව විදේශීය හා දේශීය අරමුදල් ආකර්ෂණය කර ගැනීම, ඈ) වෙළෙඳ, මෙහෙයුම් කාර්යාල පද්ධති වැනි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, ඉ) සාංගමික ණය වෙළෙඳපොළ සංවර්ධනය කිරීම, ඊ) අධ්‍යාපනය සහ දැනුවත්බව වැඩිකිරීම, උ) ඒකකභාර කර්මාන්තය වැඩිදියුණු කිරීම, ඌ) අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීම, එ) නව ආයෝජන උපකරණ ප්‍රවර්ධනය කිරීම, ඒ) සාමාජිකයින්ට අයත් සමාගමක සිට කොටස් හිමියන්ට අයත් සමාගමක් බවට කොටස් වෙළෙඳපොළ සාමූහිකරණය කිරීම.

## 8.4 සංවර්ධන මූල්‍යකරණ සහ මූල්‍ය පහසුකම් සඳහා ඇති ඉඩ ප්‍රස්තා

2012 වසරේ දී උපාය මාර්ගික වශයෙන් වැදගත් වන අංශයන් වෙත ණය මුදාහැරීම සම්බන්ධීකරණය කිරීම සහ අනුබල දීම තුළින් ශ්‍රී ලංකා මහ බැංකුව තවදුරටත් ප්‍රාදේශීය සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ක්‍රියාකාරකම්වල නිරත විය. කෘෂිකාර්මික, සත්ව පාලන සහ ක්ෂුද්‍ර යනාදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශ වල ණය පහසුකම් අවශ්‍ය ව්‍යාපාර සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන හරහා මූලික වශයෙන් ප්‍රතිමූල්‍ය, පොලී සහනාධාර සහ ණය අතිරේකකරණ යෝජනා ක්‍රම මගින් ණය පහසුකම් සැපයීම තුළින් මෙම අරමුණ සාක්ෂාත් කර ගන්නා ලදී.

ආහාර සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණ ඇතිව 2012 වසරේ දී කෘෂිකාර්මික අංශය වෙත ණය පහසුකම් ලබාදීම සාර්ථකව අඛණ්ඩව ක්‍රියාත්මක විය. 2012 වසරේ දී ණයකරුවන් 115,787 දෙනෙකු ආවරණය කරමින් කෘෂි හා සත්ත්ව පාලන අංශ වෙත ප්‍රදානය කළ මුළු ණය ප්‍රමාණය රුපියල් බිලියන 10.4 කි. කෙටිකාලීන ආහාර බෝග 35 ක් සඳහා ගොවීන්ට කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සපයන නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ 2012 වසරේ දී මුළු මුදල රුපියල් මිලියන 9,388 ක් වූ ණය මුදා

හරින ලද අතර, එමගින් වැඩිම ණය ප්‍රමාණයක් (සියයට 30) ලැබූ දිස්ත්‍රික්කය ලෙස යාපනය වාර්තා විය. විස්කම් ණය යෝජනා ක්‍රමය මගින් සුදුසුකම් ඇති ආයෝජකයන් අතර රුපියල් මිලියන 523 මුදා හරින ලද අතර දෙවන බහුවාර්ෂික බෝග සංවර්ධන චක්‍රීය අරමුදල ණය යෝජනා ක්‍රමය, තේ සංවර්ධන චක්‍රීය අරමුදල ණය යෝජනා ක්‍රමය සහ කෘෂි සත්ව පාලන ණය යෝජනා ක්‍රමය 2012 වසරේ දී රුපියල් මිලියන 552 ක් වූ මුළු ණය ප්‍රමාණයක් මුදා හරින ලදී.

**ශ්‍රී ලංකා මහ බැංකුව වසර පුරා සහනදායී පොලී අනුපාත යටතේ ණය මුදාහැරීම තුළින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ට සහාය දැක්වීමෙහි නිරත විය.** සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ට ණය පහසුකම් සපයන සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය ප්‍රතිලාභීන් 6,985 දෙනෙකු අතර රුපියල් මිලියන 2,464 ක් මුදා හරින ලදී. සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රදානය කළ ණය මගින් හෝටල් සහ ආපනශාලා, සෞඛ්‍ය සහ අදාල සේවා වැනි විවිධ සේවාවන් සහ නිමැවුම් කර්මාන්ත ආවරණය කරයි. තවද, පළාත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය, ස්වයං රැකියා ප්‍රවර්ධනය කිරීමේ ණය යෝජනා ක්‍රමය, පශ්චාත් සුනාමි වෙරළබඩ පුනරුත්ථාපන සහ සම්පත් කළමනාකරණ වැඩසටහන, සබරගමු පළාත් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය සහ මාතලේ ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන චක්‍රීය අරමුදල් ව්‍යාපෘතිය ද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සංවර්ධනය සඳහා සහය සපයන ලදී. වෙළෙඳ, ප්‍රවාහන, අධ්‍යාපන සහ නිෂ්පාදන අංශ වල සුදුසුකම් ලැබූ මධ්‍ය හා දිගු කාලීන ව්‍යාපෘති සඳහා පළාත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය මගින් රුපියල් මිලියන 340 ක් ප්‍රදානය කරන ලදී. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ ව්‍යවසායකයින් 18,161 දෙනෙකු වෙත ප්‍රතිමූල්‍ය යෝජනාක්‍රම යටතේ රුපියල් මිලියන 4,129 ක් මුදා හරින ලදී.

**ගැටුම් වලින් හානියට පත් සහ ඌන සංවර්ධිත ප්‍රදේශ වෙත අරමුදල් ගලා යාම 2012 වසරේ දී නොකඩවා සිදු විය.** '' පිබිදෙන උතුර - අදියර II'' සහ ''නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා වන ණය යෝජනා ක්‍රමය - අදියර II'' යන ණය යෝජනා ක්‍රම දෙක මගින් පිළිවෙළින් වටිනාකම රුපියල් මිලියන 668 හා රුපියල් මිලියන 528 බැගින් වූ ණය 5,546 සහ 3,612 ක් ප්‍රදානය කරන ලදී. ඊට අමතරව උතුරු හා නැගෙනහිර පළාත්වල නිවාස අංශය සංවර්ධනය සඳහා රුපියල් මිලියන 84 ක් ප්‍රදානය කරන ලදී.

**මූල්‍ය ක්ෂේත්‍රයට ඇතුලත් කර ගැනීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව විධිමත් මූල්‍ය අංශයට ප්‍රවේශයන් නොමැති ජන කොටස් වලට සහභාගීත්ව මූල්‍ය ආයතන හරහා ක්ෂුද්‍රමූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා ස්ව උපකාරක කණ්ඩායම් ගොඩනඟන ලදී.** 2012 වසරේ දී දිළිඳුකම පිටුදැකීම සඳහා වන කෙටි හා මධ්‍යකාලීන සුළු පරිමාණ ණය යෝජනා ක්‍රමය - II මගින් දිස්ත්‍රික්ක 14 ක ප්‍රතිලාභීන් 10,116 දෙනෙකු අතර රුපියල් මිලියන 652 ක ණය මුදා හරින ලදී. දිළිඳුකම පිටුදැකීම සඳහා වන කෙටි හා මධ්‍යකාලීන සුළු පරිමාණ චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය මගින් ද අඩු ආදායම්ලාභීන්ට ඔවුන්ගේ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියන 387 ක් වටිනා ණය 9,612 ක් මුදා හරින ලදී. ඒ අතරම ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ආර්ථික තත්ත්වය හා පොදු සුභසාධනය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන සුළු පරිමාණ ණය ව්‍යාපෘති චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය ප්‍රතිලාභීන් 5,704 දෙනෙකු අතර වටිනාකම රුපියල් මිලියන 180 ක් වූ ණය ප්‍රදානය කරන ලදී. අනුරාධපුර, බදුල්ල, මොණරාගල සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල සුළු ඉඩම් හිමියන් සහ උස්බිම් වල ආහාර බෝග වගා කරන දිළිඳු ගොවීන්ගේ ජීවන තත්ත්වයන් ඉහළ නැංවීම අරමුණු කරගත් වියළි කලාපීය ජීවනෝපායයන් සඳහා සහාය වීමේ හා හවුල්වීමේ වැඩසටහන මගින් ප්‍රතිලාභීන් 1,424 දෙනෙකු වෙත රුපියල් මිලියන 84 ක් වටිනා ණය මුදාහරින ලදී. 2012 වසරේ දී ක්ෂුද්‍රමූල්‍ය ණය යෝජනා ක්‍රම මගින් සමස්තයක් ලෙස ප්‍රතිලාභීන් 26,878 දෙනෙකු වෙත රුපියල් මිලියන 1,351 වටිනාකමින් යුත් ණය ප්‍රදානය කරන ලදී.

## 8.5 මූල්‍ය යටිතල පහසුකම්

### ගෙවීම් සහ පියවීම් පද්ධති

**රට තුළ වර්ධනය වෙමින් පවතින ගෙවීම් අවශ්‍යතා සපුරාලීම සඳහා නවීන ගෙවීම් සහ පියවීම් ක්‍රමවේද බිහිවීම හා පවත්නා පද්ධතීන්හි වැඩි දියුණු වීම් හේතුකොට ගෙන ජාතික ගෙවීම් පද්ධතිය නියාමනය කරන්නා සහ පහසුකම් සලසන්නා ලෙස මහ බැංකුවේ කාර්යභාරය පුළුල් වී ඇත.** එබැවින්, 2012 වර්ෂය තුළදී, මහ බැංකුව ගෙවීම් සහ පියවීම් පද්ධතීන්ට අදාළව පවත්නා නියාමන රාමුව සහ පරිචයන් වැඩිදියුණු කිරීමෙහිත් නව ප්‍රතිපත්ති සම්පාදනයෙහිත් නිරත විය. පද්ධතිමය වශයෙන් වැදගත් ගෙවීම් පද්ධති දෙකකින් (එනම් මහ බැංකුව විසින් මෙහෙයවනු ලබන

**8.18 සංඛ්‍යා සටහන** **ගෙවීම් පද්ධති මගින් සිදු වූ ගණුදෙනු**

| ගෙවීම් පද්ධති | 2011 | | 2012 (අ) | |
|---|---|---|---|---|
| | ප්‍රමාණය ('000) | වටිනාකම (රු.බිලියන) | ප්‍රමාණය ('000) | වටිනාකම (රු.බිලියන) |
| **විශාල පරිමාණයේ ගෙවීම් පද්ධති** | **267** | **57,790** | **285** | **43,255** |
| තත්කාලීන දළ පියවීම් පද්ධතිය | 267 | 57,790 | 285 | 43,255 |
| **සුළු පරිමාණයේ ගෙවීම් පද්ධති** | **91,069** | **7,079** | **101,027** | **7,833** |
| ප්‍රධාන චෙක්පත් නිෂ්කාශන පද්ධතිය | 46,012 | 6,202 | 47,757 | 6,592 |
| රුපියල් අණකර නිෂ්කාශන පද්ධතිය | ලැ.නො. | 0.5 | ලැ.නො. | 0.4 |
| ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය (SLIPS) | 12,443 | 422 | 14,475 | 553 |
| ණය කාඩ්පත් | 18,609 | 93 | 20,052 | 112 |
| හර කාඩ්පත් | 8,346 | 24 | 11,560 | 35 |
| අන්තර්ජාල බැංකු කටයුතු | 5,461 | 321 | 6,973 | 526 |
| දුරකථන බැංකු කටයුතු | 198 | 5 | 210 | 5 |
| තැපැල් උපකරණ | ලැ.නො. | 11 | ලැ.නො. | 10 |
| **එකතුව** | **91,336** | **64,869** | **101,312** | **51,088** |
| **එක්සත් ජනපද ඩොලර් නිෂ්කාශන පද්ධතිය** | **55** | **25** | **54** | **26** |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ලංකාසෙට්ල් පද්ධතිය සහ ලංකාක්ලියර් පුද්ගලික සමාගම විසින් මෙහෙයවනු ලබන චෙක්පත් නිෂ්කාශන පද්ධතිය) සහ අනෙකුත් සුළු පරිමාණ ගෙවීම් සහ පියවීම් පද්ධතීන්ගෙන් සමන්විත වන ශ්‍රී ලංකාවේ ජාතික ගෙවීම් පද්ධතිය වර්ෂය තුළදී සැලකිය යුතු මට්ටමේ බිඳවැටීම්වලින් තොරව ක්‍රියාත්මක විය.

2012 වර්ෂයේ දී ලංකාසෙට්ල් පද්ධතියෙහි **මෙහෙයුම් හැකියාවන් ඉහළ නැංවීම, තොරතුරු ආරක්ෂණය වැඩිදියුණු කිරීම සහ අධීක්ෂණ හැකියාවන් පුළුල් කිරීම අරමුණු කර ගනිමින් පද්ධති වැඩිදියුණු කිරීම් කිහිපයක් සිදුකරන ලදී.** තවද, පද්ධතිමය වශයෙන් වැදගත් ගෙවීම් පද්ධති ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට සහ ක්‍රමවේදයන්ට අනුකූලව ක්‍රියාත්මක වන්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා 2012 වර්ෂයේ අප්‍රේල් මාසයේ ජාත්‍යන්තර පියවීම් බැංකුව විසින් ප්‍රකාශයට පත් කළ මූල්‍ය වෙළෙඳපොළ යටිතල පහසුකම් සඳහා වූ නව මූලධර්ම පදනම් කර ගනිමින් ලංකාසෙට්ල් පද්ධතිය ඇගයීම 2012 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. මෙම ඇගයීම මගින් ලංකාසෙට්ල් පද්ධතිය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන බව සහතික කිරීම සඳහා සිදුකළ යුතු වෙනස්කම් හා වැඩි දියුණු කිරීම් හඳුනා ගැනීමට අපේක්ෂිත අතර ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගනු ඇත.

**ලංකාසෙට්ල් පද්ධතියේ ප්‍රධාන කොටස් දෙකෙන් එකක් වූ සහ විශාල වටිනාකම් සහිත සහ කාලසංවේදී ගෙවීම් තත්කාලීනව පියවීම සඳහා පහසුකම් සලසන්නා වූ තත්කාලීන දළ පියවීම් පද්ධතිය හරහා සිදුකළ ගණුදෙනුවල වටිනාකම, මෙම වර්ෂයේ දී රට තුළ මුදල් භාවිතයෙන් තොරව සිදුකළ ගණුදෙනුවලින් සියයට 85 ක් විය.** ශ්‍රී ලංකාවේ එකම විශාල පරිමාණයේ විද්‍යුත් ගෙවීම් පද්ධතිය වන තත්කාලීන දළ පියවීම් පද්ධතිය තත්කාලීන පදනමක් මත පියවීමේ පහසුකම සහභාගීත්ව ආයතන වෙත ලබා දෙනු ලැබේ. අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ ගණුදෙනු, රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ ගණුදෙනු, විදේශ විනිමය වෙළෙඳපොළ ගණුදෙනු, විවට වෙළෙඳපොළ ගණුදෙනු සහ තුන්වන පාර්ශ්වීය පාරිභෝගිකයින්ගේ කාල සංවේදී ගණුදෙනුවලට අදාළ රුපියල් ගෙවීම් සඳහා පහසුකම් සලසනු ලැබේ. එමෙන්ම, චෙක්පත් නිෂ්කාශන පද්ධතියෙහි සහ ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතියෙහි බහුපාර්ශ්වීය ශුද්ධ නිෂ්කාශන ශේෂයන්හි අවසාන පියවීම් සිදුකරනු ලබනුයේ ද තත්කාලීන දළ පියවීම් පද්ධතිය හරහාය. 2012 වර්ෂයේ දී තත්කාලීන දළ පියවීම් පද්ධතිය හරහා පියවීම් සිදුකළ ගණුදෙනුවල ප්‍රමාණය සියයට 6.5 කින් වර්ධනය වූ අතර ගණුදෙනුවල මුළු වටිනාකම සියයට 25.2 කින් පහත වැටිණ. තත්කාලීන දළ පියවීම් පද්ධතියේ මනා ක්‍රියාකාරීත්වයට පහසුකම් සැලසීමේ අරමුණින් මහ බැංකුව විසින් එම පද්ධතියේ සහභාගිත්ව ආයතන වෙත ලබා දෙන පොළී රහිත පහසුකම වන එක්දින ද්‍රවශීලතා පහසුකම ලබාදීම මෙම වර්ෂයේදීත් අඛණ්ඩව සිදුකෙරිණ. 2012 වර්ෂයේ දී සහභාගීත්ව ආයතන විසින් ප්‍රයෝජනයට ගත් එක්දින ද්‍රවශීලතා පහසුකමෙහි දෛනික සාමාන්‍ය වටිනාකම රුපියල් බිලියන 10ක් විය.

2012 වසර අවසානයේදී **ලංකාසෙක්‍යු පද්ධතියෙහි පැවැති නිර්ලේඛන සුරැකුම්පත්වල මුළු වටිනාකම රුපියල් බිලියන 3,205 ක් වූ අතර, එය නොපියවූ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකමින් සියයට 99.9 ක් විය.** මෙම නිර්ලේඛන සුරැකුම්පත් ප්‍රමාණය රුපියල් බිලියන 709 ක් වූ භාණ්ඩාගාර බිල්පත්වලින් ද, රුපියල් බිලියන 2,496 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකමින්ද සමන්විත විය. 2012 වසර අවසානයේ දී, ලංකාසෙක්‍යු පද්ධතිය විසින් සෘජු අලෙවිකාර සහභාගිකරුවන් හරහා සාංගමික ආයෝජකයන්ගේ ගිණුම් ඇතුළත්ව ගිණුම් 78,896 ක් පවත්වාගෙන යනු ලැබිණ.

**බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත චෙක්පත් නිෂ්කාශන පහසුකම් ලබාදීම සඳහා ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් මෙහෙයවනු ලබන ඡායාගත චෙක්පත් පිළිඹිඹු නිෂ්කාශන පද්ධතිය 2012 වර්ෂයේදී නිෂ්කාශනය කළ චෙක්පත් ප්‍රමාණය මිලියන 47.8 ක් ඉක්මවූ අතර පසුගිය වසරට සාපේක්ෂව එය සියයට 3.8 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී.** 2012 වර්ෂයේ දී ඡායාගත චෙක්පත් පිළිඹිඹු නිෂ්කාශන පද්ධතිය හරහා නිෂ්කාශනය කරන ලද චෙක්පත්වල මුළු වටිනාකම, පසුගිය වසරට සාපේක්ෂව සියයට 6.3 ක වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් බිලියන 6,592 ක අගයක් වාර්තා කරන ලදී. සිදුකළ ගණුදෙනු ප්‍රමාණය අනුව සලකා බැලූ විට චෙක්පත් මගින් සිදුකළ ගණුදෙනු ප්‍රමාණය, මුදල් භාවිතයෙන් තොරව වසර තුළ දී සිදුකළ ගණුදෙනු ප්‍රමාණයෙන් සියයට 47 ක් විය.

**සුළු පරිමාණයේ අන්තර් බැංකු ගෙවීම් පද්ධතියක් ලෙස 1994 වර්ෂයේ දී අරඹන ලද ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය කාලයත් සමඟ ක්‍රමයෙන් වර්ධනය වූ අතර, එමගින් බැර පැවරුම් (credit transfers) සහ සෘජු හර පැවරුම් (direct debit transfers) යන ස්වරූපයෙන් වූ සුළු පරිමාණ ගෙවීම් වැඩි වැඩියෙන් සිදු කෙරිණ.** 2012 වර්ෂයේ දී ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය හරහා සිදුකළ මුළු ගණුදෙනු ප්‍රමාණය සියයට 16.3 කින් වර්ධනය වෙමින් මිලියන 14 ක අගයක් වාර්තා කළ අතර එම පද්ධතිය හරහා සිදුකළ ගණුදෙනුවල මුළු වටිනාකම සියයට 31 කින් වර්ධනය වෙමින් රුපියල් බිලියන 552.6 ක අගයක් වාර්තා කරන ලදී.

**නවීන ගෙවීම් ක්‍රමවේදයන්ට ආවේණික අවදානම් තත්ත්වයන් අවම කරන අතරම එවැනි ක්‍රමවේදයන් තව තවත් ධෛර්යමත් කිරීම අරමුණු කර ගනිමින්, 2012 වර්ෂය තුළදී මහ බැංකුව සුළු පරිමාණ ගෙවීම් පද්ධති සහ විද්‍යුත් අරමුදල් හුවමාරු ක්‍රම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී.** මහ බැංකුව විසින් ගෙවීම් කාඩ්පත් කර්මාන්තයෙහි මෙහෙයුම් කටයුතු විධිමත් කිරීමේ පියවරක් ලෙස 2010 වර්ෂයේ දී බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලද අතර එම ක්‍රමවේදයට අනුකූලව යමින් ගෙවීම් කාඩ්පත් කර්මාන්තයෙහි කාඩ්පත් නිකුත් කරන්නන් ලෙස කටයුතු කිරීමට බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට සහ බලපත්‍රලාභී මුදල් සමාගමකට නව බලපත්‍ර දෙකක් වර්ෂය තුළදී නිකුත් කරන ලදී.

**ශ්‍රී ලංකාව තුළ ඉතා ඉහළ මට්ටමක පවත්නා ජංගම දුරකථන ව්‍යාප්තිය සැලකිල්ලට ගනිමින්, ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් සේවා සැපයීමෙන් ලබාගත හැකි වාසි අත්කර ගැනීමේ අරමුණින් ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් සේවා සැපයීමෙහි දැඩි උනන්දුවක් දක්නට ලැබේ.** ජංගම දුරකථන ආශ්‍රිත විද්‍යුත් මුදල් පද්ධතියක් මෙහෙයවීම සඳහා මහ බැංකුවෙන් බලපත්‍රයක් ලබා ඇති දුරකථන ජාල ක්‍රියාකරුවෙකු විසින් 2012 වර්ෂයේ ජූනි මාසයේදී ශ්‍රී ලංකාවේ ප්‍රථම ජංගම දුරකථන ආශ්‍රිත විද්‍යුත් මුදල් පද්ධතිය හඳුන්වා දෙන ලදී. මෙම ජංගම දුරකථන ආශ්‍රිත නව ගෙවීම් ක්‍රමය හඳුන්වා දීමට පෙරාතුව මූල්‍ය ආයතන විසින් පවත්වා ගෙන යනු ලබන ගණුදෙනුකරුවන්ගේ ගිණුම් මත පදනම් වූ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධතිවලට පමණක් සීමා වී තිබූ ශ්‍රී ලංකාවේ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් කර්මාන්තය, මෙම හඳුන්වා දීමත් සමඟ පුළුල් විය. එසේම රට තුළ ගෙවීම් මාධ්‍යයක් ලෙස ජංගම දුරකථන ආශ්‍රිත විද්‍යුත් මුදල් හඳුන්වා දීමක් සිදු විය.

**ඉහළ යමින් පවත්නා ගෙවීම් කාඩ්පත් ආශ්‍රිත වංචාවන් හේතුකොට ගෙන ගෙවීම් කාඩ්පත්හි සුරක්ෂිත බව කෙරෙහි ලොව පුරා ගෙවීම් පද්ධති නියාමනය කරන්නන්ගේ අවධානය යොමු වී ඇති පරිසරයක් තුළ, කාඩ්පත් හිමියන්ට සම්බන්ධ දත්ත, සම්ප්‍රේෂණය සිදුවන අවස්ථාවන්හිදී සොරාගැනීම හා සම්බන්ධ වංචා අවදානම අවම කිරීමේ පියවරක් ලෙස මහ බැංකුව විසින් මූල්‍ය අත්පත්කරණයේ නියුතු ආයතනවලට දත්ත සංකේතන තාක්ෂණය (line encryption technology) යොදා ගැනීම අනිවාර්ය කරන ලදී.** ඒ අනුව සළකා බලනු ලබන වර්ෂය තුළ දී, මෙම අනිවාර්ය අවශ්‍යතාවයට අනුගත වීම සඳහා පවත්නා විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර නවීකරණය කිරීමෙහි හෝ පවත්නා විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර වෙනුවට නව ගෙවීම් යන්ත්‍ර ස්ථාපනය කිරීමෙහි මූල්‍ය අත්පත්කරුවන් නියුතු විය. දත්ත සංකේතන තාක්ෂණය යොදා ගැනීම, ගෙවීම් කටයුතු සඳහා ගෙවීම් කාඩ්පත් භාවිතා කිරීම කෙරෙහි පවත්නා ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය ඉහළ නැංවීමට දායක වනු ඇත.

### ණය තොරතුරු

බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන දෙවර්ගයම **වඩාත් ප්‍රසාරණය කරනු ලැබූ ඉහළ ණය වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස, 2010 සහ 2011 වසර තුළ ණය වාර්තා සඳහා පෙන්නුම් කළ සැලකිය යුතු ඉල්ලුම, 2012 වසරේ මුල් කාලයේ දී ඉහළ ණය වර්ධනය පාලනය කිරීමට ගනු ලැබූ රාජ්‍ය මූල්‍ය සහ මූල්‍ය ප්‍රතිපත්ති පියවර කිහිපයක් නිසා මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කළේය.** ණය තොරතුරු කාර්යාංශය (CRIB) මගින් 2012 වසර තුළ දී

**විශේෂ සටහන 12**

## පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකාව තුළ මුදල් නෝට්ටු හා කාසි නිකුත් කිරීමේ පරම අධිකාරී බලය මුදල් නීති පනත මගින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පවරා ඇත. ඒ අනුව, ආර්ථිකයේ ගෙවීම් පියවීම් කටයුතු සඳහා අවශ්‍ය ප්‍රමාණයෙන් හා හොඳ තත්ත්වයෙන් යුතු මුදල් නෝට්ටු සහ කාසි සංසරණයේ පවතින බවට සහතික වීම ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීමක් වන අතර ඒ සඳහා සැළකිය යුතු තරම් වූ විශාල පිරිවැයක් දරනු ලබයි.

ආර්ථික කටයුතු ප්‍රසාරණය හා සමස්ත මිල මට්ටම වෙනස්වීමට අනුව පසුගිය දශකය තුළ මුදල් සංසරණය වාර්ෂිකව සියයට 13 - 14 අතර අනුපාතයකින් ඉහළ යමින් පවතී. 2012 වසර අවසානයේ දී සංසරණයේ පැවති මුළු මුදල් නෝට්ටු සහ කාසි ප්‍රමාණයේ වටිනාකම රුපියල් බිලියන 318 ක් වූ අතර ඉන් සියයට 98 ක් පමණ මුදල් නෝට්ටුවලින් සමන්විත විය. මහජන ඉල්ලුම සපුරාලනු වස් වාණිජ බැංකු ජාලය හරහා නව සහ සේවා නිසි (හොඳ තත්ත්වයේ පවතින) නෝට්ටු සැපයීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අඛණ්ඩව සිදුකරනු ලබන අතර ඒ හා සමගාමීව සේවා අනිසි (සංසරණයට නුසුදුසු තත්ත්වයේ පවතින) නෝට්ටු සංසරණයෙන් ඉවත් කිරීම ද සිදුකරනු ලබයි. 2012 වසර තුළදී මහ බැංකුව විසින් වාණිජ බැංකු වෙත නිකුත් කරනු ලැබූ නව මුදල් නෝට්ටුවල වටිනාකම රුපියල් බිලියන 75 කි. 2012 වර්ෂය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව සේවා අනිසි මුදල් නෝට්ටු මිලියන 159.6 ක් විනාශ කරන ලදී. එම නෝට්ටු නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරන ලද පිරිවැය රුපියල් මිලියන 855 ක් පමණ වේ.

### පිරිසිදු මුදල් ප්‍රතිපත්තියේ අරමුණු

මුදල් නෝට්ටු ඒවා භාවිතයත් සමඟ ක්‍රමයෙන් සේවා අනිසි තත්ත්වයට පත්වේ. මුදල් නෝට්ටුවක ආයු කාලය එය නිපදවන ලද කඩදාසියේ තත්ත්වය, නිශ්චිත කාලයක් තුළ නෝට්ටුව භාවිත වන වාර ගණන හා කුමන තත්ත්වයන් යටතේ එය භාවිත කරන්නේ ද යන කරුණු මත මූලික වශයෙන් රඳා පවතී. අඩු වටිනාකම් සහිත නෝට්ටු වැඩි වටිනාකම් සහිත නෝට්ටුවලට වඩා වැඩි වාර ගණනක් භාවිතයේ යෙදෙන බැවින්, ඒවායේ ආයු කාලය ද වැඩි වටිනාකම් සහිත නෝට්ටුවට සාපේක්ෂව අඩු අගයක් ගනී. රුපියල් 10 සහ රුපියල් 20 මුදල් නෝට්ටුවල සාමාන්‍ය ආයු කාලය පිළිවෙළින් මාස 20 ක් සහ මාස 30 ක් පමණ වන අතර රුපියල් 1,000 නෝට්ටුව සඳහා ආයු කාලය මාස 80 ක් පමණ වේ. දැනට සංසරණයේ පවතින අඩු වටිනාකම් සහිත නෝට්ටු ප්‍රමාණය, වැඩි වටිනාකම් සහිත නෝට්ටු ප්‍රමාණයට සාපේක්ෂව ඉහළ අගයක් ගන්නා අතර එහි ප්‍රතිඵලයක් ලෙස සේවා අනිසි තත්ත්වයේ අඩු වටිනාකම් සහිත නෝට්ටු විශාල ප්‍රමාණයක් සංසරණයේ පවතී.

හොඳ තත්ත්වයේ මුදල් නෝට්ටු සංසරණයේ පවත්වා ගැනීමේ මූලික අරමුණ පෙරදැරිව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය හඳුන්වා දෙනු ලැබිණි. මෑත කාලය තුළ පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය ඉතා දැඩි ලෙස ක්‍රියාවට නංවනු ලැබුවේ ඒ හරහා ලබාගත හැකි පහත සඳහන් ආකාරයේ බහුවිධ ප්‍රතිලාභයන් හේතුවෙනි.

අ. මුදල් නෝට්ටු නිවැරදි ලෙස භාවිතය තුළින් ඒවායේ තත්ත්වය හොඳින් පවත්වා ගත හැකි වන අතර එමගින් නෝට්ටුවල ආයු කාලය දිගු වීමෙන් නව මුදල් නෝට්ටු මුද්‍රණය සඳහා වන පිරිවැය අඩුකරගත හැකි වේ.

ආ. අව්‍යාජ මුදල් නෝට්ටු හා ව්‍යාජ මුදල් නෝට්ටු අතර වෙනස පහසුවෙන් වෙන්කොට හඳුනා ගැනීම සඳහා පිරිසිදු නෝට්ටු සංසරණයේ පැවතීම පිටුවහලක් වන අතර එය ව්‍යාජ නෝට්ටු මැඩලීම සඳහා අත්‍යාවශ්‍ය කරුණකි.

ඇ. විදේශිකයන් සිය විදේශ මුදල් දේශීය මුදල් හා හුවමාරු කිරීමේදී ඔවුන් වෙත ලැබෙන නෝට්ටුවල තත්ත්වය මත අප රට පිළිබඳ පළමු හැඟීම ඇති වන බැවින් ජාතිය පිළිබඳ ප්‍රතිරූපය ඔප්නැංවීමට පිරිසිදු මුදල් නෝට්ටු සමත් වේ.

ඈ. පිරිසිදු මුදල් නෝට්ටු, ඒවා යාන්ත්‍රිකව හෝ අතින් තෝරා සකස් කිරීමේ කටයුතු පහසු කරයි. මුදල් නෝට්ටු පිරිසිදුව හා ශක්තිමත්ව ඇති විට තෝරා සකස් කිරීම, ගණන් කිරීම සහ පරිහරණය කිරීම කඩිනම් හා කාර්යක්ෂම වේ.

ඉ. මුදල් නෝට්ටු, අතින් අත යාමේ ශීඝ්‍රතාවය ඉතා වැඩි බැවින් ස්වභාවයෙන්ම විවිධ රෝග කාරක විෂබීජ සඳහා පහසුවෙන් නිරාවරණය වේ. පිරිසිදු මුදල් නෝට්ටු භාවිතය රෝගකාරක විෂබීජ පැතිරීමේ අවදානම අඩුකරයි.

### පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග

පහත සඳහන් ක්‍රියාමාර්ග හරහා පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාවට නැංවිය හැකි වේ.

අ. සේවා අනිසි මුදල් නෝට්ටු සංසරණයෙන් ඉවත් කිරීම.

ආ. මුදල් පරිහරණය පිළිබඳ නිවැරදි පුරුදු ජනතාවට හුරුකිරීම මගින් නෝට්ටුවල ආයු කාලය වැඩිකිරීම.

අපිරිසිදු හා අබලි මුදල් නෝට්ටු සංසරණයෙන් ඉවත්කිරීම යනු නව හා සේවා නිසි මුදල් නෝට්ටු සංසරණයට යෙදවීම හා සමාන වැදගත් කාර්යයකි.

ඊට අමතරව, සංසරණයෙන් ඉවත් කළ යුතු නෝට්ටුවල තත්ත්වය නියාමාකාරයෙන් නිශ්චය කිරීම සඳහා අවශ්‍ය පැහැදිලි හා පොදුවේ පිළිගත හැකි ක්‍රමවේදයන් නියම කිරීම සඳහා මුදල් නෝට්ටු තේරීම පිළිබඳ විධානයන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සියලු වාණිජ බැංකු වෙත නිකුත් කර ඇත. සියලු වාණිජ බැංකු විසින් මහජනතාව වෙත සේවා නිසි මුදල් නෝට්ටු පමණක් නිකුත් කළ යුතු බවටත්, ඔවුන් වෙත තැන්පතු ලෙස ලැබෙන සියලුම සේවා අනිසි මුදල් නෝට්ටු මහ බැංකුවේ තැන්පත් කළ යුතු බවටත් උපදෙස් ලබා දී ඇත.

බලපත්‍රලාභී සියලුම වාණිජ බැංකුවලට සිය ශාඛා ජාලයන් හරහා මහජනතාවගෙන් ලැබෙන සේවා අනිසි නෝට්ටු සඳහා සේවා නිසි නෝට්ටු නිකුත් කිරීමේ පහසුකම් සලසන ලෙසටත්, සේවා අනිසි නෝට්ටු නැවත නිකුත් කිරීමෙන් වළකින ලෙසටත් උපදෙස් දී ඇත. බැංකු ශාඛා විසින් මහජනතාව වෙත මුදල් නෝට්ටු හුවමාරු කිරීමේ පහසුකම් සලසන්නේද යන්න පිරික්සීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වරින් වර විමර්ශන සිදු කරනු ලබන අතර මහ බැංකුව විසින් නිකුත් කර ඇති උපදෙස් හා විධානයන් නිසි ලෙස අනුගමනය කරන්නේ ද යන්න නියාමනය කරනු ලබයි.

තවද, මුදල් නෝට්ටු පිරිසිදුව භාවිත කිරීමේ වැදගත්කම හා නෝට්ටු හිතාමතා විකෘති කිරීමෙන් හා විරූපී කිරීමෙන් වැළකිය යුතු බවට මහජනතාව දැනුවත් කිරීම සඳහා නව පියවර රැසක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කර ඇත. ඒ යටතේ රූපවාහිනී දැන්වීම් මාලාවක් හරහා සහ පුවත්පත් දැන්වීම්, ගුවන්විදුලි හා රූපවාහිනී සාකච්ඡා, පෝස්ටර් සහ ස්ටිකර් හරහා දැවැන්ත ප්‍රචාරණ වැඩපිළිවෙලක් දියත් කරන ලදී. 2012 වසර තුළ රටපුරා පවත්වන ලද දේශන සහ වැඩමුළු 35 ක් මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහනට ඇතුළත් වේ.

පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් ක්‍රියාවට නැංවීම සඳහා සුවිශේෂී වැඩපිළිවෙල රාශියක් ඉදිරි කාලය තුළ ද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

### වෙනත් රටවල අත්දැකීම්

හොඳ තත්ත්වයේ මුදල් නෝට්ටු පමණක් සංසරණයේ පවත්වා ගැනීම සහතික කරනු වස් බොහෝ රටවල් පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවා ඇත. කෙසේ වුවද, ඉහත අරමුණ සාක්ෂාත් කර ගැනීමෙහිලා මුදල් නෝට්ටු තේරීම පිළිබඳ ප්‍රමිතීන් ස්ථාපිත කිරීම හැරුණු කොට විවිධ රටවල් විවිධ ක්‍රම අනුගමනය කරයි.

ඉහළ ආදායම් මට්ටමක් සහිත රටවල් මූලිකව සැලකිලිමත් වන්නේ නෝට්ටු නිෂ්පාදන කඩදාසිවල කල්පැවැත්ම හා ඒ හරහා නෝට්ටුවල ආයුකාලය දීර්ඝ කිරීම පිළිබඳවයි. මෙවැනි රටවල නෝට්ටු පරිහරණය කිරීමේ හුරුපුරුදු සාපේක්ෂව ඉතා හොඳ මට්ටමක පවතින අතර, ඉතා දියුණු ස්වයංක්‍රීය පද්ධති හරහා මුදල් නෝට්ටු සැකසීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම පාහේ සිදුවන බැවින් සේවා අනිසි මුදල් නෝට්ටු සංසරණයෙන් ඉවත් කිරීම මෙම රටවල මූල්‍ය අධිකාරීන් සඳහා අපහසු කාර්යයක් නොවේ. තවද, නෝට්ටු වාර්නිෂ් කිරීම, නෝට්ටු නිෂ්පාදන කඩදාසි තුළට කෘත්‍රිම තන්තු ඇතුළත් කිරීම ආදී විවිධ තාක්ෂණික ක්‍රමවේදයන් යටතේ වැඩිදියුණු කළ නෝට්ටු මුද්‍රණය සඳහා වන පිරිවැය දැරීමේ හැකියාව ද මෙම රටවල් සතුව පවතී.

මැදි හා අඩු ආදායම් ලබන රටවල් විසින් ගනු ලැබූ පියවරයන් අතර සමානතා කිහිපයක් පවතී. මැලේසියාව, ඉන්දියාව, ඝානාව, පකිස්ථානය, නයිජීරියාව, නේපාලය, බංගලාදේශය, පිලිපීනය හා ඉන්දුනීසියාව ආදී රටවල මූල්‍ය අධිකාරීන් විසින් සේවා අනිසි මුදල් නෝට්ටු නැවත සංසරණයට එකතු වීම වැළැක්වීම සඳහා මුදල් නෝට්ටු තේරීම පිළිබඳ ප්‍රමිතීන් අනුගමනය කරන ලෙස සිය වාණිජ බැංකු වෙත උපදෙස් ලබා දී ඇත. මුදල් නෝට්ටු පිරිසිදුව හා නිවැරදිව භාවිතය පිළිබඳව හා සේවා අනිසි මුදල් නෝට්ටු බැංකු හරහා හුවමාරු කරන ලෙස හෝ බැංකුවල තැන්පත් කරන ලෙස මහජනතාව දැනුවත් කර ඇත. අපිරිසිදු හා ඉරුණු සේවා අනිසි මුදල් නෝට්ටු හුවමාරු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් බාධාවකින් තොරව මහජනතාව වෙත සපයන ලෙස වාණිජ බැංකු වෙත උපදෙස් දී ඇත.

### පාර්ශවකරුවන්ගේ වගකීම්

ශ්‍රී ලංකා මහ බැංකුව, සංසරණය සඳහා මුදල් නිකුත් කිරීමේ මෙන්ම මුදල් සංසරණයෙන් ඉවත් කිරීමේ ද ප්‍රධාන මාර්ගය ලෙස වාණිජ බැංකු ජාලය යොදා ගනී. එබැවින්, පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමෙහිලා වාණිජ බැංකුවල කැපවීම හා සහයෝගය අතිශය වැදගත් වේ. තවද, සිය පාරිභෝගිකයන් විසින් තැන්පත් කරනු ලබන මුදල් නෝට්ටු නැවත සංසරණයට නිකුත් කිරීමට පෙර සේවා නිසි හා සේවා අනිසි ලෙස තෝරා සැකසීම හා සේවා අනිසි නෝට්ටු මහ බැංකුවේ තැන්පත් කිරීම සියලු වාණිජ බැංකු සතු වගකීමක් වේ.

මුදල් පරිහරණයේ ප්‍රතිලාභ ලබන්නන් වශයෙන් මහජනතාව, පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා සිය සහයෝගය ලබාදිය යුතු අතර, එය ජාතික වගකීමක් වේ. නෝට්ටු මත ලිවීම, ඇඳීම, නෝට්ටුවල ඇති ආරක්ෂණ සලකුණු හා රූප විනාශ කිරීම, නෝට්ටු කැපීම හෝ සිදුරු කිරීම, අපිරිසිදු වූ අත්වලින් භාවිත කිරීම, ඒවා විනාශයට පත්වන පරිදි තෙත් හෝ අධි උණුසුම් තත්ත්වයන්ට නිරාවරණය වන පරිදි හෝ කෘමීන් විසින් හානි කළ හැකි පරිදි ගබඩා කිරීම සහ කාසි සමග කැටවල රැස්කිරීම යනාදී අයහපත් පුරුදුවලින් වැළකීම

8

මූල්‍ය අංශයේ ක්‍රියාකාරීත්වය සහ පද්ධති ස්ථායීතාව

තුලින් මුදල් කළමනාකරණයේ පිරිවැය කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ජාතික මට්ටමින් සහාය වීමට ජනතාවට හැකියාව ඇත.

ඉහත කී අයහපත් පුරුදුවලින් වැළකෙමින්, මුදල් නෝට්ටු සැලකිලිමත්ව හා ඒවා නොනමා, වටිනාකම් අනුපිළිවෙළින් මුදල් පසුම්බියක හෝ කවරයක දමා භාවිතයට ගැනීම මගින් නෝට්ටු පිරිසිදුව මෙන්ම පහසුවෙන් පරිහරණය කිරීමේ හැකියාව ලැබේ. එසේම අපිරිසිදු නෝට්ටු බැංකු ගිණුමක තැන්පත් කිරීම හෝ බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා හොඳ තත්ත්වයේ නෝට්ටුවලට මාරු කර ගැනීම වැනි යහපත් පුරුදු ප්‍රගුණ කිරීම තුළින් පිරිසිදු නෝට්ටු සංසරණයේ පවත්වා ගැනීමට මහජනතාවට ද සහාය විය හැකි අතර එමගින් රටෙහි සෞභාග්‍ය සම්පන්න බව මෙන්ම ආකල්ප හා සංස්කෘතිය ද මනාලෙස ප්‍රතිමූර්තිමත් කළ හැකි වේ.

සමාගම් සහ පෞද්ගලික ණයකරුවන් පිළිබඳ ණය වාර්තා 2,326,504 ක් නිකුත් කරනු ලැබූ අතර, 2011 දී නිකුත් කරනු ලැබූ ණය වාර්තා ගණන 2,275,924 ක් වූයේය. ණය තොරතුරු කාර්යාංශයෙහි ණය වාර්තාකරණ සාමාජික ආයතන සංඛ්‍යාව 93 ක් වූයේය. දත්ත සැකසීමේ කාලය සැලකිය යුතු ලෙස අවම කිරීමට පහසුකම් සලසන ණය තොරතුරු කළමනාකරණ පද්ධතිය (CRIMS) නම් වූ එහි ප්‍රධාන තාක්ෂණික යටිතල පහසුකම් වසර තුළදී වැඩි දියුණු කරනු ලැබීය. ණය තොරතුරු කාර්යාංශය මගින් අළුතින් පිහිටුවනු ලැබූ සුරක්ෂිත ගණුදෙනු යටතේ වන චංචල දේපළ සඳහා වන පද්ධතිය (Secured Transaction Registry System - StrS) අඛණ්ඩ වර්ධනය සඳහා ද ක්‍රියාමාර්ග ගනු ලැබීය. 2012 දෙසැම්බර් අවසානය වන විට සාමාජික ආයතන 25 ක් මගින් වාර්තාකරනු ලැබූ ගණුදෙනු 2,162 ක් මෙම පද්ධතිය මගින් හඳුනා ගන්නා ලදී. සුරක්ෂිත ගණුදෙනු යටතේ වන චංචල දේපල සඳහා වන පද්ධතියේ නීතිමය රාමුව ශක්තිමත් කිරීම සඳහා, 2009 අංක 49 දරන සුරක්ෂිත ගණුදෙනු පනතේ විධි විධාන මහ බැංකුවේ සහ අන්තර්ජාතික මූල්‍ය සංගමයේ (IFC) සහාය ඇතිව සංශෝධනය කිරීමට ණය තොරතුරු කාර්යාංශය කටුයතු ආරම්භ කරමින් සිටී. ණය වෙළෙඳපොළෙහි ණය තොරතුරු කාර්යාංශයේ කාර්යභාරය අවබෝධ කරගැනීම සහ අවදානම් කළමනාකරණ කාර්යය සඳහා ණය වාර්තා විචක්ෂණශීලීව තේරුම් ගැනීමට හැකිවීම යනාදිය අරමුණු කර ගනිමින් ණයදෙන ආයතනවල ණය දෙනු ලබන නිලධාරීන් හා අනෙකුත් කාර්යමණ්ඩලය මෙන්ම පොදු ජනතාව අතර දැනුවත් බව වැඩිකිරීමට හා අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීමට ණය තොරතුරු කාර්යාංශය අඛණ්ඩව පියවර ගනු ලැබීය. ඊට අමතරව, අන්තර්ජාලය හරහා පාරිභෝගික ණය වාර්තා ලබා ගැනීම සඳහා මාර්ගගත වෙබ් අඩවියක් සංවර්ධනය කිරීමට ණය තොරතුරු කාර්යාංශය ආරම්භකර ඇත.